# පටුන


| විස්තරය | පිටු අංක |
|---|---|
| 1. විධායක සාරාංශය | 1 |
| 2. වාර්තාවේ පසුබිම සහ ස්වභාවය | 1 - 2 |
| 3. අනුගමනය කරන ලද ක්‍රමවේදයන් | |
| 3.1 පොත්පත් ලේඛන හා වාර්තා පරීක්ෂා කිරීම. | 2 |
| 3.2 භෞතික පරීක්ෂාව | 2 |
| 3.3 වෙනත් පරීක්ෂාවන් | 2 |
| 4. විෂය පථය | 2 |
| 5. විෂය පථයේ සීමාවන් | 2 – 3 |
| 6. ක්‍රියාවලිය හැඳින්වීම | 3 |
| 7. ක්‍රියාවලිය | |
| 7.1 ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපනය හා එහි කටයුතු | 3 – 4 |
| 7.2 කෘ.ප.නි.ස. නිලධාරින් පත්කිරීම හා රාජකාරි ඉටු කිරීමේ ක්‍රියාවලිය | 4 – 6 |
| 8. නිරීක්ෂණ | |
| 8.1 වී ගොවිතැන නඟා සිටුවීම සඳහා වූ දායකත්වය | 6 - 7 |
| 8.2 කෘ.ප.නි.ස. නිළධාරින් ක්ෂේත්‍රයේ වැඩ කටයුතු නිසි ලෙස ඉටු නොකිරීම. | 7 – 8 |
| 8.3 කෘ.ප.නි.ස. නිළධාරින්ගේ රාජකාරි නිසි අධීක්ෂණයකට ලක් නොවීම. | 8 |
| 8.4 ගොවීන් කෘ.ප.නි.ස. නිලධාරීන්ගේ උපදෙස් වලට අවනත නොවීම | 8 |
| 8.5 කෘ.ප.නි.ස.නිලධාරීන්ගේ නිර්දේශ පිළි නොගැනීම | 9 |
| 8.6 කෘ.ප.නි.ස. නිලධාරීන්ගේ කාර්යයන් වෙනුවෙන් අභිප්‍රේරණ වැඩපිළිවෙලක් නොවීම | 9 |
| 9. පද්ධති හා පාලන දුර්වලතා | 9 |
| 10. නිර්දේශ | 10 |
| 11. නිගමන | 11 |
| 12. උපලේඛන | 12 – 28 |

## 1. විධායක සාරාංශය

"ශ්‍රී ලංකාවේ සියළුම කෘෂිකාර්මික ඉඩම් වලින් උපරිම ඵලදායකත්වයක් ලබා ගැනීමට හැකි වන පරිදි ගොවි ජනතාව පෙළඹවීම" මෙහෙවර කර ගනිමින් කෘෂිකාර්මික අංශය සම්බන්ධයෙන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වන ප්‍රධාන ආයතනයක් ලෙසට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හඳුනාගෙන ඇත. එහි මෙහෙවර සඵලදායි ලෙස ඉටුකරගැනීමේ අරමුණින් 1999 වර්ෂයේ දී කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර (කෘ.ප.නි.ස) තනතුර ඇති කරන ලද අතර, වර්තමානයේ එම නිලධාරීන් 9,600 ක් පමණ දීප ව්‍යාප්තව සේවය කරයි. 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 74(1) වගන්තිය යටතේ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් පනතේ විධිවිධාන අදාල කෘ.ප.නි.ස. කොට්ඨාශ තුල ක්‍රියාත්මක කිරීමට සහ කෘෂිකාර්මික කටයුතුවලට සම්බන්ධ රජයේ වෙනත් ආයතනවල කටයුතු වලට සහාය වීම සඳහා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් පත් කර ඇත.

මේ වන විට ශ්‍රී ලංකාව තුල කෘෂිකාර්මික අංශයෙන් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙන දායකත්වය ක්‍රමයෙන් අඩු වී යන බව පෙන්නුම් කරන අතර කෑගල්ල දිස්ත්‍රික්කයේ වී ගොවිතැන හා සම්බන්ධ දත්ත සලකා බැලීමේදී ද පසුගිය වසර කීපය තුළ වී වගා කළ කුඹුරු ඉඩම් හා වී අස්වැන්න අඩුවී තිබීමත්, පුරන් කුඹුරු ප්‍රමාණය වැඩි වී තිබීමත් නිරීක්ෂණය කළ හැකිය. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඉටුකර ගැනීම සඳහා පත් කරන ලද කෘ.ප.නි.ස. නිළධාරීන් නිසි පරිදි මෙහෙයවා නොතිබීම සහ අතැම් අවස්ථාවලදී ඔවුන් ක්ෂේත්‍රයේ වැඩ කටයුතු නිසි ලෙස ඉටු නොකිරීම මේ සඳහා බලපා ඇති බව කෑගල්ල දිස්ත්‍රික්කයෙහි සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. තවද කෘෂි කර්මාන්තය නගා සිටුවීම සඳහා කෘ.ප.නි.ස. නිලධාරින් නිසි පරිදි මෙහෙයවීම හා ඔවුන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලනයක් ඇති කිරීමටත්, ඔවුන් ක්ෂේත්‍රයේ රාජකාරි කටයුතු ඉටුකිරීමේදී හඳුනාගන්නා ගැටළු නිසි පරිදි කළමනාකරණය කර විසඳුම් ලබා දීමටත්, කෘ.ප.නි.ස. නිලධාරීන්ට පාලනය කළ නොහැකි කරුණු සඳහා ප්‍රතිපත්තිමය විසඳුම් ලබාදීම සඳහාත් කටයුතු කිරීම තුලින් මෙම නිලධාරින්ගෙන් ලබාගත හැකි උපරිම සේවය ලබා ගැනීම අත්‍යවශ්‍ය බව හඳුනාගන්නා ලදී.

## 2. වාර්තාවේ පසුබිම සහ ස්වභාවය

මේ වන විට ශ්‍රී ලංකාව තුල කෘෂිකාර්මික අංශයෙන් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙන දායකත්වය ක්‍රමයෙන් අඩු වී යන බව පෙන්නුම් කරන අතර එය 2016 වර්ෂයේ සියයට 7.1 ක් වූ අතර 2015 වර්ෂයට සාපේක්ෂව සියයට 4.2 ක අඩු වීමකි. (මූලාශ්‍රය - මහ බැංකු වාර්තාව 2016) මෙම තත්ත්වය යටතේ කෘ.ප.නි.ස. නිලධාරීන් වෙනුවෙන් දරනු ලබන පිරිවැයට සාපේක්ෂව ඔවුන් කෘෂිකාර්මික ප්‍රවර්ධනය සඳහා දායකත්වයක් දක්වා ඇත්ද යන්නත් එසේ නොමැතිනම් ඒ

සඳහා බලපා ඇති හේතු සහ ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීමත් මෙම පරීක්ෂාව සඳහා යොමුවීමට පසුබිම විය.

## 3. අනුගමනය කරන ලද ක්‍රමවේදයන්

මෙම වාර්තාව පිළියෙල කිරීමේදී පහත සඳහන් ක්‍රමවේද අනුගමනය කරන ලදී.

### 3.1 පොත්පත් ලේඛන හා වාර්තා පරීක්ෂා කිරීම.

- 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තොරතුරු
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ තොරතුරු
- ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තොරතුරු
- ගොවිජන සංවර්ධන සභාවල තොරතුරු

### 3.2 භෞතික පරීක්ෂාව

කෘ.ප.නි.ස. නිලධාරීන්ගේ රාජකාරි ක්ෂේත්‍රයට අදාල කුඹුරු පිළිබඳ භෞතික පරීක්ෂාව

### 3.3 වෙනත් පරීක්ෂාවන්

- අදාල පාර්ශව සමඟ සාකච්ඡා කිරීම
- අන්තර්ජාලය හා අනිකුත් ප්‍රභවයන්ගෙන් ලබාගත් තොරතුරු විශ්ලේෂණය

## 4. විෂයපථය

පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමුකරන ලදී.

4.1 විශේෂ විගණන කටයුතු ආරම්භ කරන ලද 2017 නොවැම්බර් 01 දින වන විට කෑගල්ල දිස්ත්‍රික්කයට අනුයුක්තව සිටින 452 ක් වූ කෘ.ප.නි.ස. සංඛ්‍යාව පදනම් කර ගනිමින් විගණනය ආරම්භ කරන ලදී.

4.2 ප්‍රමාණාත්මක යැයි සලකනු ලැබූ සහ ඒ පිළිබඳ සාධාරණ නිගමනයක් ඇති කර ගැනීමට හැකිවන පරිදි සාක්ෂි ලබා ගැනීම අප විසින් සිදු කරන ලදී.

4.3 මෙම වැඩසටහනේ ඵලදායීත්වයට අදාල වියහැකි නිර්දේශයන් හා නිගමනයන් විගණන නිරීක්ෂණ හා සොයාගැනීම් මත පදනම් වී ඇත.

## 5. විෂය පථයේ සීමාවන්

මෙම වාර්තාව පිළියෙල කිරීමේදී මාගේ විෂය පථය පහත දැක්වෙන සීමාකිරීම් වලට යටත් විය.

5.1 කෘෂි ආර්ථිකය සම්බන්ධයෙන් සලකා බැලීමේදී තේ, රබර්, පොල් වැනි වාණිජමය භෝග, වී, ධාන්‍ය වර්ග වැනි පාරිභෝජන භෝග, කුරුඳු, ගම්මිරිස්, කරාබු වැනි සුළු අපනයන භෝග මෙන්ම සත්ව සහ කිරි නිෂ්පාදන කටයුතු ද ඇතුළත් පුළුල් අංශයක් වන අතර සියළුම කෘෂි භෝග සම්බන්ධ දායකත්වය පරීක්ෂා කිරීම දුෂ්කර වූ බැවින් පරීක්ෂණ කටයුතු ප්‍රධාන වශයෙන් වී ගොවිතැනට සීමා වීම.

5.2 ශ්‍රී ලංකාවේ සමස්ත ගොවිජන සේවා මධ්‍යස්ථාන වලට අනුයුක්ත කෘ.ප.නි.ස. නිලධාරීන්ගේ කටයුතු පරීක්ෂා කිරීම ප්‍රායෝගිකව අපහසු කාර්යයක් වූ බැවින් කෑගල්ල දිස්ත්‍රික්කය නියැදියක් ලෙස ගෙන එහි ගොවිජන සේවා කාරක සභා පරීක්ෂාවට ලක් කරන ලදී.

5.3 ගොඩකරන ලද කුඹුරු ඉඩම් සහ පුරන් කුඹුරු ඉඩම් පරීක්ෂා කිරීමේදී අදාල වසමභාර කෘ.ප.නි.ස. නිලධාරියා සමඟ පරීක්ෂා කිරීමට සිදුවීම.

5.4 කෘ.ප.නි.ස. නිලධාරීන්ගේ කළ වැඩසටහන් සහ ඉදිරි වැඩසටහන් සියල්ල පරීක්ෂා කිරීමට අපහසු බැවින් එය නියැදියකට සීමාවීම.

## 6. ක්‍රියාවලිය හැඳින්වීම

6.1 ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපනය හා එහි කටයුතු හැඳින්වීම

6.2 කෘ.ප.නි.ස නිලධාරීන් පත්කිරීම හා රාජකාරි ඉටුකිරීමේ ක්‍රියාවලිය හැඳින්වීම

## 7. ක්‍රියාවලිය

### 7.1 ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපනය හා එහි කටයුතු

කෘෂිකර්මය හා සම්බන්ධිත පාර්ලිමේන්තු තීරණ ක්‍රියාත්මක කිරීමේ ආයතනය කෘෂිකර්ම අමාත්‍යාංශය වන අතර එම අමාත්‍යාංශය යටතේ විවිධ අරමුණු සඳහා ආයතන රාශියක් පිහිටුවා ඇත. එම ආයතන අතුරින් ප්‍රාදේශීය මට්ටමින් කෘෂිකර්මාන්තය හා සම්බන්ධිත ප්‍රධාන ආයතනය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවයි. කෘෂිකර්මික වැඩසටහන් සඳහා මූලික සැපයුම් සේවා ලබාදීමේ අරමුණින් 1957 ඔක්තෝබර් 01 දින ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇති අතර, එය වර්තමානයේ 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් (ඇමුණුම 01) සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත (ඇමුණුම 02) මගින් පාලනය කෙරේ. එහි දැක්ම, මෙහෙවර හා සේවා පහත පරිදි වේ.

**දැක්ම** - ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් හා ගොවිජන ජීවිතයන්ට තිරසාර සංවර්ධනය ළඟා කර දීම.

**මෙහෙවර** - ශ්‍රී ලංකාවේ සියලුම කෘෂිකාර්මික ඉඩම් වලින් උපරිම ඵලදායකත්වයක් ලබා ගැනීමට හැකිවන පරිදි ගොවිජනතාව පෙළඹවීම, ඔවුන්ගේ සංවිධාන ශක්තිය වැඩි දියුණු කිරීම, විවිධාකාර වූ කෘෂිකාර්මික ආරවුල් විසඳාලීම, ඒ සඳහා

නීතිමය ව්‍යුහය සකස් කිරීම සහ පවත්වාගෙන යාම, කෘෂිකාර්මික සේවා සහ යෙදවුම් නිසිකලට ලබාදීම සහතික වීම සහ ඒ සඳහා ඇති ආයතනික ව්‍යුහය සකස් කිරීම හා පවත්වාගෙන යාම.

**සේවා**

- ❖ කෘෂිකාර්මික ණය සහ කෘෂිකර්මය ප්‍රවර්ධනය
- ❖ කෘෂිකාර්මික යෙදවුම් සැපයීම
- ❖ කුඩා වාරිමාර්ග සහ කෘෂිකාර්මික ළිං දියුණු කිරීම
- ❖ කෘෂි උපකරණ සැපයීම
- ❖ කෘෂි ඉඩම් කළමනාකරණය
- ❖ මිල පාලනය

2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් විස්තර කර තිබේ.

- ❖ කුඹුරු ඉඩම්වල අඳ ගොවියෝ
- ❖ කුඹුරු ඉඩම්වල අඳ ගොවියන්ගේ අයිතිවාසිකම්
- ❖ කෘෂිකාර්මික ප්‍රතිපත්තිවලට අනුකූලව කෘෂිකාර්මික ඉඩම් යෙදවීම
- ❖ කොමසාරිස් ජනරාල්, අතිරේක කොමසාරිස් ජනරාල්, කොමසාරිස්වරුන්, නියෝජ්‍ය කොමසාරිස්වරුන්, සහකාර කොමසාරිස්වරුන් සහ ගොවිජන සංවර්ධන නිලධරයන් පත් කිරීම හා ඔවුන්ගේ බලතල සහ කාර්ය
- ❖ ගොවිජන විනිශ්චය සභා පිහිටුවීම
- ❖ ගොවි සංවිධානවල ආයතනික ව්‍යුහය
- ❖ ගොවිජන සංවර්ධන සභා
- ❖ කර්මාන්ත හා වාරිමාර්ග ජලය කළමනාකරණය කිරීම
- ❖ පොදු විධිවිධාන

## 7.2 කෘ.ප.නි.ස. නිලධාරීන් පත්කිරීම හා රාජකාරි ඉටු කිරීමේ ක්‍රියාවලිය

7.2.1 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 74(1) වගන්තිය යටතේ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් මෙහෙවර සඵලදායි ලෙස ඉටුකරගැනීමේ අරමුණින් ග්‍රාමීය මට්ටමේ කෘෂිකාර්මික කටයුතු සම්බන්ධීකරණය, සමායෝජනය, සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් 1999 වර්ෂයේ දී පත් කර ඇත. වර්තමානයේ ශ්‍රී ලංකාව තුල කෘ.ප.නි.ස නිලධාරීන් 9,600 ක් පමණ දීප ව්‍යාප්තව සේවය කරයි. මේ අතුරින් කෑගල්ල දිස්ත්‍රික්කය තුල කෘ.ප.නි.ස. නිලධාරීන් 452 ක් පමණ සේවය කරන අතර ඔවුන් වෙනුවෙන් 2015 හා 2016 වර්ෂවලදී රජය රු.334,590,615 ක පමණ මුදලක් වැයකර ඇත.

7.2.2 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන අදාල කෘ.ප.නි.ස. කොට්ඨාශ තුල ක්‍රියාත්මක කිරීමට සහ කෘෂිකාර්මික කටයුතුවලට සම්බන්ධ රජයේ වෙනත් ආයතනවල කටයුතු වලට සහාය වීම සඳහා මෙම නිලධාරීන්ට පහත සඳහන් කාර්යයන් හා වගකීම් පවරා ඇත.

- කන්න රැස්වීම් පැවැත්වීමට හා ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම
- ගොවි සංවිධාන හා ගොවීන් සම්බන්ධ කර ගනිමින් කුඩා වැව්, සුළු වාරිමාර්ග, ඇලවේලි අලුත්වැඩියා කරවීම, නඩත්තු කරවීම හා ආරක්ෂා කිරීමට කටයුතු කිරීම
- අක්කර බදු අය කිරීම
- වගා නොවන කුඹුරු ඉඩම්/ගොඩ ඉඩම් කාර්යක්ෂම ලෙස වගා කරවීමට අදාල පනතේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම
- තම බල ප්‍රදේශයේ ගොවි සංවිධාන කැඳවුම්කරු ලෙස ක්‍රියා කිරීම
- ගොවි සංවිධාන පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා ශක්තිමත් කිරීමට අදාල මැදිහත්කරුවෙකුගේ හා විපර්යකාරකයකුගේ වගකීම ඉටු කිරීම
- අනවසරයෙන් කුඹුරු ඉඩම් ගොඩකිරීම සහ වෙනත් කාර්යයන් සඳහා යොදාගනු ලබන පුද්ගලයන් පිළිබඳ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම සහ අධිකරණ කාර්යයන්හිදී අවශ්‍ය සහාය ගොවිජන සංවර්ධන නිලධාරී වෙත ලබාදීම
- කෘෂිකාර්මික නොවන කාර්යයන් සඳහා කුඹුරු ඉඩම් යොදා ගැනීමට අදාල අවසරපත්‍ර නිකුත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම හා නිකුත් කරන ලද අවසරපත්‍ර අනුව අදාල කාර්යයන්හි යෙදවීම පසුවිපරම් කිරීම
- අයාලේ යන සතුන්ගෙන් කෘෂිකාර්මික භෝග හා සුළු වාරිමාර්ගවලට සිදුවන හානි පිළිබඳ පනතේ විධිවිධානවලට අනුව ක්‍රියා කිරීම
- ජල මූලාශ්‍රිත වගාවන් ඇතිකිරීම/ ජල රක්ෂිත ආරක්ෂා කරවීමට අදාල සියළු කටයුතු ක්‍රියාත්මක කිරීම
- ගොවිජන සංවර්න පනත හෝ ඊට අනුෂංගිකව පනවනු ලබන රෙගුලාසිවලට අදාලව පවරනු ලබන වෙනත් කාර්යයන් ඉටු කිරීම
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන කෘෂිකර්ම ව්‍යාප්ති සේවය සඳහා කෘෂිකර්ම උපදේශකගේ මගපෙන්වීම අනුව කටයුතු කිරීම
- කෘෂිකර්මයට සම්බන්ධ රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාප්ති සේවාවන් සඳහා එම නිලධාරීන්ගේ මගපෙන්වීම අනුව කටයුතු කිරීම
- කෘෂිකාර්මික යෙදවුම්වල අවශ්‍යතාවය හඳුනාගැනීම සහ ඒවා නියමිත කාලයට ලබාගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ගොවිජන සංවර්ධන නිලධාරී වෙත ඉදිරිපත් කිරීම
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන විවිධ ව්‍යාපෘති/ වැඩසටහන් ක්‍රියාවට නැංවීම සඳහා සහාය වීම

❖ කෘෂිකාර්මික කටයුතුවලට සම්බන්ධ රජයේ වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති/ වැඩසටහන් සඳහා අවශ්‍ය සහාය ලබාදීම.

## 8. නිරීක්ෂණ

අනාවරණය වූ නිරීක්ෂණ හඳුනාගත් එක් එක් ක්ෂේත්‍ර යටතේ පහත දක්වා ඇත.

### 8.1 වී ගොවිතැන නඟා සිටුවීම සඳහා වූ දායකත්වය

පසුගිය වසර කීපය තුළ කුඹුරු ඉඩම් සහ වී අස්වැන්න පිළිබඳ දත්ත සලකා බැලීමේදී කෑගල්ල දිස්ත්‍රික්කයේ වී වගා කළ කුඹුරු ඉඩම් හා වී අස්වැන්න අඩුවී තිබීමත්, පුරන් කුඹුරු ප්‍රමාණය වැඩි වී තිබීමත් නිරීක්ෂණය කළ හැකිය. ලංකාවේ සියළුම කෘෂිකාර්මික ඉඩම් වලින් උපරිම ඵලදායකත්වයක් ලබා ගැනීමට හැකි වන පරිදි ගොවි ජනතාව පෙළඹවීම සඳහා වූ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඉටුකර ගැනීම සඳහා පත් කරන ලද කෘ.ප.නි.ස. නිළධාරීන් නිසි පරිදි මෙහෙයවා නොතිබීම මේ සඳහා ප්‍රබල ලෙස බලපා ඇති බව පහත දත්ත අනුව නිරීක්ෂණය විය.

8.1.1 කෑගල්ල දිස්ත්‍රික්කයේ වී වගා කල කුඹුරු ඉඩම් ප්‍රමාණය අඩුවී තිබීම

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත අනුව 1990 වර්ෂයේදී කෑගල්ල දිස්ත්‍රික්කයේ යල සහ මහ කන්න දෙකෙහි වී වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණයේ එකතුව හෙක්ටයාර් 22,066 ක් වී තිබුණි. කෘ.ප.නි.ස. නිලධාරීන් පත්කරන ලද 1999 වර්ෂයේදී යල සහ මහ කන්න දෙකෙහි වී වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණයේ එකතුව හෙක්ටයාර් 19,068 ක් වී තිබුණු අතර එය 2015 වර්ෂය වන විට හෙක්ටයාර් 10,963 ක් දක්වා පහල මට්ටමකට පැමිණ තිබුණි. එනම් කෘ.ප.නි.ස. නිලධාරීන් පත්කරන ලද 1999 වර්ෂයට සාපේක්ෂව කෑගල්ල දිස්ත්‍රික්කයේ වී වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණය 2015 වර්ෂය වන විට සියයට 42 කින් අඩුවී තිබුණි. විස්තරාත්මක දත්ත උපලේඛන 01 හි දැක්වේ.

8.1.2 කෑගල්ල දිස්ත්‍රික්කයේ වී අස්වැන්න අඩුවී තිබීම

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ කුඹුරු ඉඩම් වලින් 1990 වර්ෂයේ යල සහ මහ කන්න දෙකෙහිදීම එකතුව මෙට්‍රික් ටොන් 64,300 ක වී අස්වැන්නක් ලබා තිබුණු අතර කෘ.ප.නි.ස. නිලධාරීන් පත්කරන ලද 1999 වර්ෂයේදී ද මෙට්‍රික් ටොන් 57,300 ක අස්වැන්නක් ලැබී තිබුණි. නමුත් එය 2015 වර්ෂය වන විට මෙට්‍රික් ටොන් 37,400 ක් දක්වා පහල මට්ටමකට පැමිණ තිබුණි. එනම් කෘ.ප.නි.ස. නිලධාරීන් පත්කරන ලද 1999 වර්ෂයට සාපේක්ෂව කෑගල්ල දිස්ත්‍රික්කයේ වී අස්වැන්න 2015 වර්ෂය වන විට සියයට 35 කින් අඩුවී තිබුණි. විස්තරාත්මක දත්ත උපලේඛන 02 හි දැක්වේ.

8.1.3 කෑගල්ල දිස්ත්‍රික්කයේ පුරන් කුඹුරු ප්‍රමාණය වැඩිවී තිබීම

කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා බල ප්‍රදේශ 14 අතුරින් ගොවිජන සේවා බල ප්‍රදේශ 09 ක 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පුරන් කුඹුරු පිළිබඳ දත්ත සලකා බැලීමේදී කෑගල්ල දිස්ත්‍රික්කයේ පුරන් කුඹුරු ප්‍රමාණය සියයට 47 කින් පමණ ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය විය. විස්තර උපලේඛන 03 හි දැක්වේ.

**8.2 කෘ.ප.නි.ස. නිළධාරින් ක්ෂේත්‍රයේ වැඩ කටයුතු නිසි ලෙස ඉටු නොකිරීම.**

කෘෂිකර්මාන්ත අංශයේ දායකත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කටයුතු ග්‍රාමීය මට්ටමින් සිදුකිරීම කෘ.ප.නි.ස. නිලධාරීන්ගේ ප්‍රධානතම කාර්යභාරය වේ. කෘ.ප.නි.ස නිලධාරීන් විසින් මෙම රාජකාරි නිසි පරිදි ඉටු නොකළ අවස්ථා පහත පරිදි නිරීක්ෂණය විය.

8.2.1 ගොවීන්ට ඇති ගැටළු නිරාකරණය කිරීමේදී කෘ.ප.නි.ස නිලධාරීන් ගොවි මහතුන්ගේ නියෝජිත ලෙස කටයුතු කළ යුතු වුවත්, කෘ.ප.නි.ස නිලධාරීන් විසින් මෙම රාජකාරිය ඉටු කිරීමේ අකාර්යක්ෂමතා නිරීක්ෂණය විය. උදාහරණ කීපයක් උපලේඛන 04 හි දැක්වේ.

8.2.2 කෘ.ප.නි.ස.නිලධාරීන් ගොවි සංවිධාන හා ගොවීන් සම්බන්ධ කර ගනිමින් කුඩා වැව්, සුළු වාරිමාර්ග, ඇලවේලි අලුත්වැඩියාව, නඩත්තුව හා ආරක්ෂා කිරීම ආදිය තුලින් ජල රක්ෂිත ආරක්ෂා කිරීමට අදාල කටයුතු නිරන්තරයෙන් සිදුකල යුතු වුවත්, ඉදිකිරීම් හේතුවෙන් ජල මාර්ග අවහිර වීම මගින් වී වගා කරන කුඹුරු ඉඩම් හිමියන් සඳහා එල්ලවූ බාධාවන් මෙන්ම නිලධාරීන් ගේ අවධානය යොමු නොවූ අවස්ථාවන් විගණනයට නිරීක්ෂණය විය. විස්තර උපලේඛන 05 හි දැක්වේ.

8.2.3 පුරන් කුඹුරු ඉඩම් වල කෙටිකාලීන හෝ අර්ධ වාර්ෂික භෝග වගා කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2012 නොවැම්බර් 29 දිනැති අංක 14/2012 දරන චක්‍රලේඛයෙන් (ඇමුණුම 03) ලබාදී ඇති අතර, එහිදී කුඹුරු පිහිටා ඇත්තේ ජලය ලබාගත නොහැකි තනිව වගා කරන කුඹුරක් ලෙස නම් අදාල කන්නය තුල වගා කල යුතු භෝගය කෘ.ප.නි.ස. නිලධාරි තීරණය කල යුතු වේ. එසේ වුවද ඇතැම් අවසථාවන්හිදී කුඹුරු ඉඩම් ගොඩකර ස්ථිර භෝග වගා කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් කෘ.ප.නි.ස. නිලධාරින්ගේ අඩු අවධානයක් යොමු වී ඇති බවත් නිරීක්ෂණය විය. විස්තර උපලේඛන 06 හි දැක්වේ.

8.2.4 අයාලේ යන වන සතුන්ගෙන් කෘෂිකාර්මික භෝග වලට සිදුවන හානි පිලිබඳ කටයුතු කිරීම කෘ.ප.නි.ස නිලධාරීන් වෙත පැවරී ඇති රාජකාරී කටයුත්තකි. නමුත් කෘ.ප.නි.ස නිලධාරීන් විසින් මෙම රාජකාරිය නිසිලෙස ඉටුකර නොතිබුණු අවස්ථා විගණනයට නිරීක්ෂණ විය. විස්තර උපලේඛන 07 හි දැක්වේ.

8.2.5 වගා නොකරන කුඹුරු ඉඩම් වගා කරවීමට කටයුතු කිරීම කෘ.ප.නි.ස නිලධාරීගේ වගකීමකි. අප විසින් සිදුකල භෞතික විගණන පරීක්ෂාවේදී වගා කල හැකි ඇතැම් කුඹුරු ඉඩම් අපද්‍රව්‍ය මුදාහැරීමට භාවිතා කරන බවත්, ඒ සම්බන්ධයෙන් කෘ.ප.නි.ස නිලධාරීගේ අවධානය යොමු වී නොමැති බවත් නිරීක්ෂණය විය. උදාහරණ උපලේඛන 08 හි දැක්වේ.

8.2.6 කෘ.පනි.ස. නිලධාරීන් කෘෂිකර්මාන්තය නගා සිටුවීමට කටයුතු කිරීමේදී ගොවීන් ගොවිජන බැංකු සමඟ ගනුදෙනු කිරීම් ඉහල නැංවීමට කටයුතු කළයුතු වුවත්, 2016 දෙසැම්බර් 31 දිනට කැගල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා බල ප්‍රදේශ 13 ක ගොවි පවුල් 111,956 ක් අතුරින් ගොවි බැංකුවේ කොටස් හා තැන්පතු පවත්වාගෙන යන ගොවින් සංඛ්‍යාව 49,745 ක් වූ අතර, කුඩා කණ්ඩායම් වල සාමාජික ගොවි සංඛ්‍යාව 14,455 ක් විය. එය ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 44.4 ක් හා සියයට 12.9 වන අතර, ඒ අනුව ගොවි බැංකුවේ කොටස් හා තැන්පතු පවත්වාගෙන යාම සඳහා කෘ.ප.නි.ස.නිලධාරින් විසින් ගොවීන් යොමු කිරීම සඳහා වන දායකත්වය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. විස්තර උපලේඛන 09 හි දැක්වේ.

8.2.7 කෘ.ප.නි.ස. නිලධාරීන් විසින් කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් දූෂිත ක්‍රියාවන් සිදුකර තිබුණු බව ඔවුන්ට එරෙහිව ගොවින්ගෙන් හා ගොවි සංවිධාන නිළධාරීන්ගෙන් ඉදිරිපත් වූ පැමිණිලි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. විස්තර උපලේඛන 10 හි දැක්වේ.

### 8.3 කෘ.ප.නි.ස. නිළධාරින්ගේ රාජකාරි නිසි අධීක්ෂණයකට ලක් නොවීම.

කෘ.ප.නි.ස. නිලධාරීන් අධීක්ෂණය කිරීම සඳහා භාවිත කරනු ලබන ඉදිරි වැඩසටහන් සහ කල වැඩසටහන් විස්තරාත්මකව ඉදිරිපත් නොකෙරෙන බවත්, එමඟින් ඔවුන්ගේ රාජකාරි කටයතු ක්‍රමානුකූල අධීක්ෂණයකට ලක්කළ නොහැකි බවත්, විගණනයේදී අනාවරණය විය. ඒ අනුව ප්‍රාදේශීය නිලධාරීන් විසින් කෘ.ප.නි.ස නිලධාරින්ගේ කටයුතු අධීක්ෂණය කිරීම සතුටුදායක මට්ටමක නොපවතින බව නිරීක්ෂණය විය. විස්තර උපලේඛන 11 හි දැක්වේ.

### 8.4 ගොවීන් කෘ.ප.නි.ස. නිලධාරීන්ගේ උපදෙස් වලට අවනත නොවීම

ඇතැම් කුඹුරු වගා කරන ලෙස කෘ.ප.නි.ස. නිලධාරීන් විසින් උපදෙස් ලබා දුන්නද ආර්ථිකමය වශයෙන් ලාභදායී නොවීම, ශ්‍රමය හිඟකම, ජල හිඟය, පොහොර නිසි කලට නොලැබීම ආදී හේතූන් නිසා ගොවීන් වගාවට නැඹුරු නොවන බව නිරීක්ෂණය විය. විස්තර උපලේඛන 12 හි දැක්වේ.

### 8.5 කෘ.ප.නි.ස.නිලධාරීන්ගේ නිර්දේශ පිළි නොගැනීම

කෘ.ප.නි.ස. නිලධාරීන් විසින් ගොඩකිරීම සඳහා නිර්දේශ නොකරන ලද ඇතැම් කුඹුරු ඉඩම් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය මත ගොඩකිරීම සඳහා (සීජී බලපත්‍ර යටතේ) කටයුතු කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. විස්තර උපලේඛන 13 හි දැක්වේ.

## 8.6 කෘ.ප.නි.ස. නිලධාරීන්ගේ කාර්යයන් වෙනුවෙන් අභිප්‍රේරණ වැඩපිලිවෙලක් නොවීම

කෘ.ප.නි.ස. නිලධාරීන් සමඟ කරන ලද සාකච්ඡා වලදී ඔවුන්ගේ සේවය සඳහා කිසිදු අභිප්‍රේරණයක් නොමැති බව ප්‍රකාශ කළ අතර ඔවුන් මුහුණදෙන පහත දුෂ්කරතා ඉදිරිපත් කරන ලදී.

8.6.1 බොහෝ නිලධාරීන්ට කාර්යාලීය ස්ථානය, තනතුර දැක්වෙන නිශ්චිත නාම පුවරුවක් ලබා දී නොතිබීම.

8.6.2 කෘ.ප.නි.ස. නිලධාරින් වෙනුවෙන් ලබා දෙන රු.500 ක කාර්යාල දීමනාව කාර්යාලයක් සඳහා කාමරයක් සොයා ගැනීමට ප්‍රමාණවත් නොවීම.

8.6.3 මාසිකව ගමන් වියදම වෙනුවෙන් ලබාදෙන රු.400 ක පරිවර්තිත ගමන් වියදම ප්‍රමාණවත් නොවීම

## 9. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන්හි අඩුපාඩු නිරීක්ෂණය විය.

9.1 ප්‍රාදේශීය නිලධාරීන් විසින් යම් කාලයකට වරක් කෘ.ප.නි.ස. නිලධාරීන්ගේ කාර්යාල පරීක්ෂා කිරීම් සිදුනොකිරීම හා නිරීක්ෂණය වන අඩුපාඩු සම්බන්ධයෙන් ලිඛිතව උපදෙස් ලබා නොදීම.

9.2 කෘ.ප.නි.ස.නිලධාරීන්ට රාජකාරි ඉටුකිරීම සම්බන්ධයෙන් වන දැනුවත් කිරිමේ සති රැස්වීම් වලදී වැදගත් උපදෙස් හා චක්‍රලේඛ ලිඛිතව ලබා නොදී වාචිකව ලබා දීම.

9.3 කෘ.ප.නි.ස. නිලධාරීන්ගේ ඉදිරි වැඩ සහ කල වැඩ වාර්තා නිසි අධීක්ෂණයකට ලක් නොවීම

## 10. නිර්දේශ

10.1 කෘ.ප.නි.ස නිලධාරින්ගේ කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු අධීක්ෂණය කිරීම, ප්‍රාදේශීය නිලධාරින් විසින් කාර්තුවකට වරක්වත් කෘ.ප.නි.ස. නිලධාරින්ගේ කාර්යාල පරික්ෂා කිරීම සහ නිරීක්ෂණය වන අඩුපාඩු සම්බන්ධයෙන් ලිඛිතව උපදෙස් ලබා දීම.
(යොමුව ඡේද අංක 8.3)

10.2 වසම් තුල පවතින ගැටළු සම්බන්ධයෙන් මාසික/ කාර්තු වාර්තා කෘ.ප.නි.ස නිලධාරින් මගින් ප්‍රාදේශිය නිලධාරින් වෙත ලබා ගෙන ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ ගැටළු පිළිබඳ සම්පිණ්ඩනයක් නියෝජ්‍ය/ සහකාර ගොවිජන සංවර්ධන නිලධාරී හරහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම හා ඒ සඳහා දෙපාර්තමේන්තුවෙන් පිළියම් යෙදීම.
(යොමුව ඡේද අංක 8.1,8.2)

10.3 කෘ.ප.නි.ස. නිලධාරීන්ට පාලනය කළ නොහැකි කරුණු සඳහා ප්‍රතිපත්තිමය විසඳුම් ලබාදීම.
(යොමුව ඡේද අංක 8.5)

10.4 කෘ.ප.නි.ස.නිලධාරින්ට රාජකාරි ඉටුකිරීම් සම්බන්ධයෙන් අදාල උපදෙස් ලිඛිතව ලබා දීමට කටයුතු කිරීම
(යොමුව ඡේද අංක 9.2)

10.5 කෘ.ප.නි.ස. නිලධාරින්ට රාජකාරි කටයුතු ඉටු කිරීමට හැකි වන පරිදි කාර්යාල පරිසරයක් හා අභිප්‍රේරණ වැඩපිළිවෙලක් සකස් කිරීම.
(යොමුව ඡේද අංක 8.6)

10.6 කෘ.ප.නි.ස. නිලධාරීන් සඳහා ඉලක්කගත වැඩ සටහනක් ලබා දී අදාල කාල සීමාව තුල ඉලක්ක සපුරන ලද නිලධාරීන් වෙනුවෙන් දිරි ගැන්වීම් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
(යොමුව ඡේද අංක 8.3,8.6)

## 11. නිගමන

11.1 ශ්‍රී ලංකාවේ සියලුම කෘෂිකාර්මික ඉඩම් වලින් උපරිම ඵලදායකත්වයක් ලබා ගැනීම මෙහෙවර කර ගනිමින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව කෘ.ප.නි.ස. නිලධාරීන් බඳවා ගන්නා අතර, කෑගල්ල දිස්ත්‍රික්කය තුල කෘෂිකාර්මික ඉඩම් වගා කිරීම සහ අස්වනු ලබා ගැනීම සඳහා කෘ.ප.නි.ස. නිලධාරීන් දායක කර ගැනීම සතුටුදායක මට්ටමක නොමැති බව නිගමනය කෙරේ.

11.2 කෘ.ප.නි.ස. නිලධාරීන් වෙනුවෙන් වාර්ෂිකව දරන පිරිවැයට (2015 හා 2016 වර්ෂවලදී කෑගල්ල දිස්ත්‍රික්කයේ කෘ.ප.නි.ස. නිලධාරීන් වෙනුවෙන් රු.334,590,615 ක්) සාපේක්ෂව ප්‍රතිලාභයක් ලැබී නොමැති බව නිගමනය කෙරේ.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති
2018 සැප්තැම්බර් 12 දින

උපලේඛන 01

**1990 සිට 2015 වර්ෂය දක්වා කෑගල්ල දිස්ත්‍රික්කයේ වී වගා කල කුඹුරු ඉඩම් පිළිබඳ දත්ත (හෙක්ටයාර්)**

| වර්ෂය | කන්නය | | එකතුව |
|---|---|---|---|
| | යල | මහ | |
| 1990 | 10,924 | 11,143 | 22,066 |
| 1991 | 10,933 | 11,059 | 21,992 |
| 1992 | 10,747 | 11,029 | 21,776 |
| 1993 | 10,736 | 10,903 | 21,639 |
| 1994 | 10,154 | 10,923 | 21,077 |
| 1995 | 10,642 | 10,911 | 21,552 |
| 1996 | 7,207 | 10,899 | 18,106 |
| 1997 | 9,728 | 10,901 | 20,630 |
| 1998 | 5,680 | 10,218 | 15,898 |
| 1999 | 8,884 | 10,184 | 19,068 |
| 2000 | 5,534 | 10,004 | 15,538 |
| 2001 | 6,286 | 9,115 | 15,400 |
| 2002 | 7,603 | 9,351 | 16,954 |
| 2003 | 8,523 | 9,082 | 17,605 |
| 2004 | 6,579 | 8,850 | 15,429 |
| 2005 | 7,774 | 8,922 | 16,696 |
| 2006 | 5,471 | 8,777 | 14,247 |
| 2007 | 5,159 | 8,233 | 13,392 |
| 2008 | 7,431 | 7,486 | 14,917 |
| 2009 | 7,617 | 8,179 | 15,796 |
| 2010 | 7,216 | 8,337 | 15,553 |
| 2011 | 7,024 | 8,212 | 15,236 |
| 2012 | 2,882 | 7,103 | 9,985 |
| 2013 | 2,882 | 5,093 | 7,975 |
| 2014 | 3,969 | 6,088 | 10,057 |
| 2015 | 4,723 | 6,240 | 10,963 |



වී වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණය
25,000
20,000
15,000
10,000
5,000
0
එකතුව(හෙක්ටයාර්)
1990
1992
1994
1996
1998
2000
2002
2004
2006
2008
2010
2012
2014
වර්ෂය
වී වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණය...

උපලේඛන 02

**1990 සිට 2015 වර්ෂය දක්වා කෑගල්ල දිස්ත්‍රික්කයේ වී අස්වැන්න** (මෙට්‍රික් ටොන් 000')

| **වර්ෂය** | **කන්නය** | | **එකතුව** |
|---|---|---|---|
| | **යල** | **මහ** | |
| 1990 | 26.8 | 37.5 | 64.3 |
| 1991 | 25.7 | 35.8 | 61.5 |
| 1992 | 28.9 | 34.4 | 63.3 |
| 1993 | 30.9 | 38.7 | 69.5 |
| 1994 | 27.6 | 35.8 | 63.4 |
| 1995 | 25.3 | 37.9 | 63.3 |
| 1996 | 18.7 | 35.9 | 54.7 |
| 1997 | 26.2 | 37.2 | 63.4 |
| 1998 | 12.4 | 32.9 | 45.2 |
| 1999 | 25.4 | 31.9 | 57.3 |
| 2000 | 14.0 | 34.8 | 48.8 |
| 2001 | 17.3 | 22.9 | 40.2 |
| 2002 | 20.5 | 35.4 | 55.9 |
| 2003 | 22.7 | 27.7 | 50.1 |
| 2004 | 19.9 | 21.1 | 40.9 |
| 2005 | 22.3 | 28.4 | 50.8 |
| 2006 | 16.0 | 33.2 | 49.2 |
| 2007 | 15.6 | 24.2 | 39.8 |
| 2008 | 23.1 | 26.0 | 49.1 |
| 2009 | 24.1 | 28.2 | 52.2 |
| 2010 | 19.2 | 29.6 | 48.8 |
| 2011 | 18.1 | 23.0 | 41.1 |
| 2012 | 5.8 | 24.0 | 29.8 |
| 2013 | 12.2 | 18.7 | 30.8 |
| 2014 | 10.2 | 18.6 | 28.8 |
| 2015 | 15.1 | 22.3 | 37.4 |



වී නිෂ්පාදනය (1990-2015)
ඒකකුව ('000 මෙට්‍රික් ටොන්)
80
70
60
50
40
30
20
10
0
1990
1992
1994
1996
1998
2000
2002
2004
2006
2008
2010
2012
2014
වර්ෂය
වී නිෂ්පාදනය

උපලේඛන 03

## කෑගල්ල දිස්ත්‍රික්කයේ පුරන් කුඹුරු ප්‍රමාණයන් පිළිබඳ විස්තර

| ගොවිජන සේවා මධ්‍යස්ථානය | පුරන් කුඹුරු ප්‍රමාණයන් පිළිබඳ විස්තර (අක්කර) 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| දැලිවල | 140 | 154 | 142 | 144 | 219 |
| උස්සාපිටිය | 111 | 109 | 105 | 111 | 40 |
| බැමිණිවත්ත | 303 | 303 | 303 | 303 | 303 |
| යට්ටෝගොඩ | 305 | 287 | 345 | 392 | 428 |
| අඹේපුස්ස | 46 | 89 | 89 | 89 | 344 |
| පරගම්මන | 542 | 546 | 554 | 587 | 595 |
| පනාවල | 231 | 231 | 285 | 342 | 449 |
| පින්නවල | 100 | 96 | 149 | 338 | 339 |
| යටියන්තොට | 245 | 247 | 247 | 307 | 266 |
| එකතුව | 2,023 | 2,062 | 2,219 | 2,613 | 2,983 |

උපලේඛන 04

**කෘ.ප.නි.ස නිලධාරීන් ගොවි මහතුන්ගේ නියෝජිත ලෙස ගැටළු නිරාකරණයට අපොහොසත් වූ අවස්ථා**

01. බැමිණිවත්ත ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොන්දිවල වසමේ පදිංචි තිස්ස දිසානායක මහතා විසින් 2013 ජූලි 08 දින කෑගල්ල දිස්ත්‍රික් ගොවිජන සේවා කාර්යාලය වෙත කරන ලද පැමිණිල්ලකට අනුව, ඔහු විසින් පොහොර ලබා ගැනීම සඳහා රු.2,500 ක මුදලක් වසම භාර කෘ.ප.නි.ස නිලධාරිණිය වෙත ලබා දී තිබුණද පොහොර ලබා ගැනීමට යාමේදී නැවත වරක් මුදල් ගෙවා පොහොර ලබා ගන්නා ලෙස ගොවි සමිතිය විසින් දැනුම් දී ඇති බව අනාවරණය වීම.

02. යටියන්තොට ගොවිජන සේවා බල ප්‍රදේශයේ 171 E, අමනාවල, බෙරන්නාව ලිපිනයේ පදිංචි ඒ.ඒ.ජේ.කුමාර ගුණතිලක මහතා විසින් 2015 ඔක්තෝබර් 14 දින යටියන්තොට ගොවිජන සේවා මධ්‍යස්ථානයට කරනු ලැබූ පැමිණිල්ලට අනුව කුඹුරු ඉඩම් වගා නොකිරීමට හේතුවක් ලෙස ගොවි නියාමක මහතාගේ සහය නිසි ආකාරව නොලැබෙන බව සඳහන් කර තිබීම.

03. පනාවල ගොවිජන සේවා බල ප්‍රදේශයේ හුම්පිටකන්ද, එළවුල්ල, පරකඩුව ලිපිනයේ පදිංචි යූ.කේ.යසවර්ධන මහතා විසින් 2017 ජනවාරි 14 දින ජනාධිපති තුමා වෙත කරන ලද පැමිණිල්ලකට අනුව ඔහුගේ වෙල්යායට විධිමත් ලෙස ජල සැපයුමක් ලබා ගැනීමට නොහැකි වීම නිසා යල මහ දෙකන්නයේම ඉහළ ප්‍රතිඵල ලබාගත් වෙල්යාය ගොවීන් විසින් වගා කිරීම අතහැර දමා ඇති බවත් පසුව අමුණක් ඉදිකර ඇති බවත් එයද ක්‍රමානුකූල නොවන බවත් මේ සම්බන්ධයෙන් කෘ.ප.නි.ස නිලධාරී මහතාට දැනුම් දුන්නද ඔහු විසින් කිසිදු පියවරක් නොගන්නා බවත් අනාවරණය වීම.

04. උස්සාපිටිය ගොවිජන සේවා බල ප්‍රදේශයේ කුසුම්විලා, කාරියගම, උස්සාපිටිය ලිපිනයේ පදිංචි කේ.ජී.මහින්ද කප්පාගොඩ මහතා විසින් 2017 ඔක්තෝබර් 24 දින කරන ලද ලිඛිත පැමිණිල්ලෙහි ගොවිජන සේවා මධ්‍යස්ථානයේ නිලධාරීන් විසින් ද කාරියගම ගොවි සමිතියේ නිලධාරීන් විසින්ද ගොවීන්ට අවශ්‍ය කිසිදු දැනුවත් කිරීමක් ලබා නොදෙන බව සඳහන් කර තිබීම.

**කෘ.ප.නි.ස.නිලධාරීන් ජල රක්ෂිත ආරක්ෂා කිරීමට කටයුතු නොකළ අවස්ථා**

01. බටුවත්ත ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් පානකාව, ඇඳුරාපොත, කැගල්ල ලිපිනයෙහි පදිංචි ජී.ආර්.මුතුබංඩා යන අය විසින් 2016 ජූලි 18 දින බටුවත්ත ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරි වෙත ඉදිරිපත් කරන ලද ලිපිය අනුව පානකාව වසමේ මීගස්දෙනිය කුඹුර කේ.වී.විමලසේන අය විසින් ගොඩකර නිවසක් ඉදිකිරීමට කටයුතු කිරීම හේතුවෙන් ඔහු විසින් ඇල මාර්ග වසා දමා ඇති බවත් පහළ ප්‍රදේශයේ වගා කර ඇති කුඹුරු යට කර ගෙන ජලය පහලට යාමත් එයින් කුඹුරු නිසරු වී ඇති බවත් සඳහන් කරමින් අවධානය යොමු කරන ලෙස ඉල්ලීමක් කර ඇත.

02. උස්සාපිටිය ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් දීවෙල කැතිහේන ප්‍රදේශයේ පදිංචි සෝමරත්ත මාරසිංහ යන අය විසින් දීවෙල හරහා ගලා යන ප්‍රධාන ඇළ මාර්ගය අවහිර කරමින් නිවසක් ඉදිකිරීමට කටයුතු කරමින් සිටින බව දන්වමින් දීවෙල කැතිහේන ගම්වාසීන් යොමු කල ලිඛිත දැනුම්දීමට අනුව අරණායක ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2017 මාර්තු 08 දිනැති ලිපිය මගින් මෙම ගැටලුවට අවධානය යොමු කර ක්‍රියාමාර්ග ගන්නා ලෙස උස්සාපිටිය ප්‍රාදේශීය ගොවිජන සංවර්ධන නිලධාරි වෙත ඉල්ලීම් කර තිබුණි. එහිදී අදාල වසමභාර කෘ.ප.නි.ස. නිලධාරි වෙතින් වාර්තාවක් ලබා දෙන ලෙස දැනුම් දුන්නද 2017 දෙසැම්බර් දින විගණනය සිදු කරන අවස්ථාව වන විටත් කිසිදු ලිඛිත වාර්තාවක් කෘ.ප.නි.ස.නිලධාරි විසින් ප්‍රාදේශීය නිලධාරි වෙත ලබාදී නොතිබුණි.

උපලේඛන 06

**කුඹුරු ඉඩම් ගොඩකර ස්ථිර භෝග වගා කර ඇති අවස්ථාවන්හිදී කෘ.ප.නි.ස. නිලධාරින්ගේ අඩු අවධානයක් යොමු වී තිබීම**

01. උස්සාපිටිය ගොවිජන සේවා බල ප්‍රදේශයේ පදිංචි ප්‍රේමදාස මහතා විසින් 2014 සැප්තැම්බර් 17 දින ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කර තිබුණු ලිපියට අනුව මාවතගම කුඹුරු යායේ අක්කර 20 ක බිම් ප්‍රමාණය මැද වී ලාස් 10 ක පමණ බිම් ප්‍රමාණයක් ගොඩකර ස්ථිර භෝග වගා කිරීමෙන් ජලමාර්ග හරස් වී ඇති බව කෘ.ප.නි.ස. නිලධාරීවරයාට කීපවතාවක්ම ලිඛිතව දැනුම් දුන්නද පියවරක් නොගන්නා බව සඳහන් කර තිබුණි.

02. යටිටෝගොඩ ගොවිජන සේවා බල ප්‍රදේශයේ අංක 528/B, නුවර පාර යටිටෝගොඩ ලිපිනයෙහි පදිංචි කේ.ඒ.දේශප්‍රිය කරුණාගොඩ මහතාට අයත් වැළිකුඹුර නැමැති කුඹුරෙහි කොට්ටම්බා වගාකර තිබූ අතර ඒ හේතුවෙන් අසල කුඹුරු වල වගා කටයුතු සඳහා බාධා ඇති වී තිබූ බව නිරීක්ෂණය විය. විස්තර පහත ඡායාරූපවල දැක්වේ.






උපලේඛන 07

## අයාලේ යන වන සතුන්ගෙන් කෘෂිකාර්මික භෝග වලට සිදුවන හානි පිළිබඳ කටයුතු කිරීමේ රාජකාරිය නිසිලෙස ඉටුකර නොතිබුණු අවස්ථා

ගොවීන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අයාලේ යන සතුන් හා වන සතුන්ගෙන් ඔවුන්ගේ වගාවන්ට හානි සිදුවන බව සඳහන් කර තිබුණු අතර ඇතැම් ගොවීන් විසින් වන සතුන්ගෙන් වගා කටයුතු සඳහා හානි ඇතිවීම කෘෂිකාර්මික ඉඩම් වගා කටයුතු සඳහා නොයෙදීමට හේතුවක් වශයෙන්ද සඳහන් කර තිබුණි. වන සතුන්ගෙන් වන හානි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලද ගොවීන් කීපදෙනෙකු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ගොවිජන සේවා බල ප්‍රදේශය | ගොවියාගේ නම | ලිපිනය |
| --- | --- | --- |
| යටියන්තොට | බී.වී.සුගත් ආරියවංශ | D64/1, ගෝමගමුව, කිතුල්ගල |
| යටියන්තොට | බී.ජී.කල්‍යානවතී | රදාවල, මීගස්තැන්න, යටියන්තොට |
| යටියන්තොට | ඒ.ඒ.ජේ.කුමාර ගුණතිලක | 171 E, අමනාවල, බෙරන්නාව |
| යටියන්තොට | එම්.ඒ.ගුණසේන | අඹමල්ල, බුලත්කොහුපිටිය |
| අරණායක | යූ.සුමතිපාල | පෝඩාපේ, අම්බලකන්ද පාර, අරණායක |
| පනාවල | කේ.ජයසිංහ | පින්නපොල, මානියන්ගම |
| පනාවල | ආර්.ඩබ්.ජයතිස්ස | A5B, මානියන්ගම, අවිස්සාවේල්ල |
| පනාවල | නිරෝෂා මධුෂානි ජයවර්ධන | 42/4, පින්නපොල, මානියන්ගම |
| උස්සාපිටිය | කේ.ජී.මහින්ද කප්පාගොඩ | "කුසුම්විලා", කාරියගම, උස්සාපිටිය |

උපලේඛන 08

**වගා කල හැකි ඇතැම් කුඹුරු ඉඩම් අපද්‍රව්‍ය මුදාහැරීමට භාවිතා කිරීම හා ඒ සම්බන්ධයෙන් කෘ.ප.නි.ස නිලධාරීගේ අවධානය යොමු වී නොතිබීම**

01. පනාවල ගොවිජන සේවා බල ප්‍රදේශයේ පහල තල්දූව ග්‍රාම නිලධාරි වසමෙහි කුඹුරු ඉඩමක් ගොඩ කර කොටසක තල්දූව සතිපොළ ඉදිකර ඇති බවත් තවත් කොටසක් අපද්‍රව්‍ය මුදා හැර පුරන් වීමට ඉඩ හැර ඇති බවත් පහත ඡායාරූපවල දැක්වේ.





02. බටුවත්ත ගොවිජන සේවා බල ප්‍රදේශයේ නාරංදෙණිය දේවාලේගම ප්‍රදේශයේ සියළු ගොවි මහතුන් විසින් 2017 මාර්තු 20 දින කරන ලද ලිඛිත දැනුම් දීමට අනුව ජීවාන වසමේ එකමුතු ගොවි සංවිධානයට අයත් නාරංදෙණිය උඩ කොටසේ තිබෙන කමතට බැහැරින් එන වතුර පාරවල් සහ ඉහළ ප්‍රදේශයෙන් එන කුණු කසළ කමතට බැහැර වීම නිසා ගොවිතැන් කටයුතු කිරීමට බාධා සිදුවන බව අනාවරණය වීම.

උපලේඛන 09

## 2016 දෙසැම්බර් 31 දිනට ගොවීන් ගොවිජන බැංකුව සමඟ ගනුදෙනු කිරීමේ තත්වය

| ගොවිජන සේවා බල ප්‍රදේශය | ගොවි පවුල් සංඛ්‍යාව | කොටස් හා තැන්පතු පවත්වාගෙන යන ගොවීන් | | කුඩා කණ්ඩායම් සාමාජික ගොවීන් | |
|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| දැරණියගල | 6,623 | 1,122 | 16.9 | 175 | 2.6 |
| පනාවල | 2,480 | 1,609 | 64.8 | 510 | 20.6 |
| රුවන්වැල්ල | 6,531 | 6,150 | 94.2 | 2,015 | 30.8 |
| බටුවත්ත | 4,721 | 2,014 | 42.6 | 575 | 12.2 |
| අඹේපුස්ස | 7,214 | 4,436 | 61.5 | 905 | 12.5 |
| දැලිවල | 9,932 | 4,334 | 43.6 | 870 | 8.8 |
| පින්නවල | 9,527 | 3,879 | 40.7 | 620 | 6.5 |
| අරණායක | 10,667 | 6,921 | 64.8 | 390 | 3.6 |
| බැම්මිණිවත්ත | 18,375 | 5,906 | 32.1 | 1,485 | 8.1 |
| උස්සාපිටිය | 5,143 | 1,740 | 33.8 | 1,750 | 34.1 |
| යටියන්තොට | 15,826 | 2,626 | 16.5 | 2,200 | 13.9 |
| යට්ටෝගොඩ | 4,935 | 2,657 | 53.8 | 920 | 18.6 |
| පරගම්මන | 9,982 | 6,351 | 63.6 | 2,040 | 20.4 |
| එකතුව | 111,956 | 49,745 | 44.4 | 14,455 | 12.9 |

## කෘ.ප.නි.ස. නිලධාරීන්ට එරෙහිව ගොවීන්ගෙන් හා ගොවි සංවිධාන නිළධාරීන්ගෙන් ඉදිරිපත් වූ පැමිණිලි

01. යට්ටෝගොඩ ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් අම්පේ වසමෙහි රාජකාරි කටයුතු කළ කෘ.ප.නි.ස.නිලධාරිනි මහත්මිය විසින් ක්ෂේත්‍රය තුළ සිදු කරන ලද පහත විෂමාචාර ක්‍රියා සම්න්ධයෙන් පැමිණිලි ලැබී තිබුණි.

- ගොවීන්ගේ කමත් වැසීමට කටයුතු කිරීම
- කමත් ඉඩම් හිමියන්ගෙන් කප්පම් වශයෙන් මුදල් ලබා ගැනීම
- කුඹුරු ඉඩම් ගොඩ කිරීම
- කුඹුරු වල ගොඩනැගිලි ඉදිකිරීම
- සහනාධාර කුඹුරු පොහොර වෙනත් කඩවලට විකිණීම

මෙම නිලධාරිනිය සම්බන්ධයෙන් පරීක්ෂණක් සිදුකර වාර්ථා කරන ලෙස කෑගල්ල ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් විසින් යට්ටෝගොඩ ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරී වෙත දන්වා තිබුණද මේ වන විටත් එවැනි වාර්ථාවක් ලැබී නොතිබුණු අතර කෘ.ප.නි.ස.නිලධාරිනිය වෙනත් වසමකට අනුයුක්ත කරන ලෙස කර තිබුණු දැන්වීමද ක්‍රියාත්මක වී නොතිබුණි.

02. බැමිණිවත්ත ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් උතුවන්කන්ද වසමේ රාජකාරි කටයුතු කළ කෘ.ප.නි.ස. නිලධාරිනී මහත්මිය විසින් සිදුකරන ලද දූෂිත ක්‍රියාවන් සම්බන්ධයෙන් ලැබී තිබුණු පැමිණිලි පහත පරිදි විය.

- කුඹුරු ගොඩ කර පාරවල් පළල් කිරීමෙන් කුඹුරු වලට අනර්ථකාරී ක්‍රියා සිදු කිරීම
- සමථ මණ්ඩල තීරණ සහ සහකාර කොමසාරිස්තුමා විසින් ලබා දුන් තීරණ වලට පටහැනිව ක්‍රියා කිරීම.
- ගොවි පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ නොපැවැත්වීම.
- සහානාධාර පොහොර නිකුත් කිරීමේදි අක්‍රමිකතා සිදුකිරීම
- ගොවිණය, නිවාස තැනීම, පාරවල් සෑදීම වැනි ක්‍රියා වලදී මුල්‍යාමය වංචා සිදු කිරීම.

මෙම නිලධාරිනිය වෙනත් වසමකට අනුයුක්ත කර තිබුණු අතර බැමිණිවත්ත ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ලබා දී තිබුණු වාර්තාව ප්‍රමාණවත් නොවන බැවින් සවිස්තර වාර්තාවක් ඉල්ලා තිබුණි.

03. දැලිවල ගොවිජන සේවා බල ප්‍රදේශයේ අංක 01, වැවේ වත්ත, රඹුක්කන ලිපිනයෙහි එච්.එම්.සී.එල්.කේ. හේරත් මහතා විසින් 2016 දෙසැම්බර් 28 වන දින යොමු කර තිබුණු

ලිපියට අනුව, කෘ.ප.නි.ස. නිලධාරී මහත්මිය විසින් පුද්ගලික වුවමනාව මත ඇයට අයත් පර්චස් 13 ක බිම් ප්‍රමාණය පුළුල් කර ගැනීම සඳහා රඹුක්කන අශෝක ක්‍රීඩාංගනයෙන් පර්චස් 15 කට වැඩි ප්‍රමාණයක් අත්පත් කරගෙන ඉඩම මැදින් එන කුණු ඇල ඔහුට අයත් දළුග්ගල, මොට්ටප්පුලිය කුඹුරු ඉඩමට කාලයක සිට ගලා ඒමට සැලැස්වීමෙන් ඔහුගේ කුඹුරේ ඉඩමේ කිසිදු භෝගයක් වගා කිරීමට නොහැකි බවට පැමිණිල්ල ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් වර්ථමාන තත්වය කෑගල්ල ගොවිජන සේවා සහකාර කොමසාරිස් කාර්යාලයේ නීති අංශයෙන් විමසීමේදී අනාවරණය වූයේ අදාල ගැටළුව ප්‍රාදේශීය සභාව සමඟ සාකච්ඡා කර විසඳා ගත යුතු බවට දැනුම් දුන් බවයි. මේ සම්බන්ධයෙන් 2000 අංක 46 ගොවිජන සංවර්ධන පනතේ 84 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි.

උපලේඛන 11

## කෘ.ප.නි.ස. නිලධාරින්ගේ රාජකාරි නිසි අධීක්ෂණයකට ලක් නොවූ අවස්ථා

01. බැම්ණිවත්ත ගොවිජන සේවා බල ප්‍රදේශයේ අජන්තා, ගෝන්දිවෙල, මාවනැල්ල ලිපිනයේ පදිංචි තිස්ස දිසානායක විසින් 2013 ජූලි 08 දින කෑගල්ල ගොවිජන සංවර්ධන සහාකාර කොමසාරිස් වෙත කරන ලද ලිඛිත පැමිණිල්ලට අනුව කෘ.ප.නි.ස. නිලධාරිනිය ඔහුගෙන් මුදල් ලබාගෙන පොහොර ලබාදී නොමැති බව දන්වා තිබුණි. මේ සම්බන්ධයෙන් සහකාර කොමසාරිස්වරයා විසින් ප්‍රාදේශීය නිලධාරී දැනුවත් කර තිබුණි. 2013 සැප්තැම්බර් 30 වන විටත් අදාල කෘ.ප.නි.ස. නිලධාරිනිය සම්බන්ධයෙන් ප්‍රාදේශීය නිලධාරී විසින් පරීක්ෂණයක් සිදුකර නොතිබුණු බව 2013 සැප්තැම්බර් 30 දින සහකාර කොමසාරිස්වරයා විසින් බැම්ණිවත්ත ගොවිජන සංවර්ධන නිලධාරී වෙත යොමුකර තිබුණු ලිපියෙන් විගණනයට අනාවරණය විය.

02. උස්සාපිටිය ගොවිජන සේවා බල ප්‍රදේශයේ ලඹුටුව කෘ.ප.නි.ස. වසමේ සේවයේ නියුතු කෘ.ප.නි.ස.නිලධාරී මහතා විසින් ඔහුට අයත් ගම්මන්නාගොඩ වසමේ පිහිටි කුඹුර ගොඩ කර නිවසක් ඉදිකර පදිංචි වී තිබුණි. තවද, කුඹුරු ඉඩමේ ඉතිරි කොටස ස්ථිර භෝග වගා කර ගොඩවීමට සලස්වා තිබුණු අතර මෙම නිවස ඉදිකිරීම හේතුවෙන් පහළ කුඹුරු වලට ජලය ගලා යන මාර්ගය ද අවහිර වී තිබුණි. මෙම අනවසර කුඹුරු ගොඩකිරීම කිසිදු වගකිවයුතු නිලධාරියකුගේ අවධානයට ලක් වී නොතිබුණි. විස්තර ඡායා රූපවල දැක්වේ.





උපලේඛන 12

## ගොවීන් කෘ.ප.නි.ස. නිලධාරීන්ගේ උපදෙස් වලට අවනත නොවීම

අරණායක ගොවිජන සේවා බල ප්‍රදේශයේ තල්ගස්පිටිය වසම කහට ගහ කුඹුර, පනපුරේ මහ කුඹුරුවෙල, තම්මැට්ටයාගේ කුඹුර, පනපුරේ කුඹුර දැක්විය හැක. මෙහිදී, කෘ.ප.නි.ස. නිළධාරිනිය විසින් වගා කටයුතු කරන මෙන් කිහිප වරක්ම ගොවි සංවිධානය වෙතින් ඉල්ලීම් කර තිබුණද ඔවුන් එම ඉල්ලීම නොසලකා ඇති බව කෘ.ප.නි.ස. නිළධාරිනිය සහ ගොවි සංවිධානය සමඟ සිදු කල සාකච්ඡාවේදී අනාවරණය විය. මෙම කුඹුරු ඉඩම පර්චස් 120 ක ප්‍රමාණයකින් යුක්ත වන බවත් වසර 8 කින් පමණ වගා කටයුතු සිදු කර නොමැති බවත්, කෘ.ප.නි.ස. නිළධාරිනිය විසින් අනාවරණය කල අතර විගණිත දිනය වන විට කුඹුරු ඉඩමෙහි තත්වය පහත ඡායාරූපවල දැක්වේ.





## කෘ.ප.නි.ස.නිලධාරීන්ගේ නිර්දේශ පිළි නොගැනීම

01. බැමිණිවත්ත ගොවිජන සේවා බල ප්‍රදේශයේ බෙලිගම්මන වසමෙහි අංක 149, ප්‍රධාන වීදිය, මාවනැල්ල ලිපිනයෙහි පදිංචි යූ.ඩබ්.චූලනි වීරසේකර යන අයට අයත් පර්චස් 80.7 ක ප්‍රමාණයකින් යුත් පඩාපොත කුඹුර ගොඩ කර වාහන අමතර කොටස් අලෙවි කරන ආයතනයක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඇති බවත් 2017 දෙසැම්බර් 15 දින විගණනය සිදු කරන අවස්ථාව වන විටත් ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පැවති බවත් නිරීක්ෂණය විය. විස්තර ඡායාරූපවල දැක්වේ.






02. බැමිණිවත්ත ගොවිජන සේවා බල ප්‍රදේශයේ බෙලිගම්මන වසමෙහි අංක 88/32 කිරිංග දෙනිය, මාවනැල්ල ලිපිනයෙහි පදිංචි එස්.එම්.මුස්තාක් යන අයට අයත් පර්චස් 120.3 කින් යුත් ගල්වඩුව කුඹුර පර්චස් 20 බැගින් ඉඩම් කට්ටි 6 කට කොටස් කර කුඹුර වටේට කොන්ක්‍රීට් කර ඇළ මාර්ගයක් සහ කුඹුර මැදින් කොන්ක්‍රීට් පාරක් ද සකස් කර තිබුණි. තවද ඉඩම් කට්ටි 6 න් 5 ක්ම විකුණා ඇති බවත් විගණනයේදී අනාවරණය විය. විස්තර පහත ඡායාරූපවල දැක්වේ.





03. බැම්ණිවත්ත ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ ඒදඬුවාව කෘ.ප.නි.ස. වසමෙහි වීරකෝන් නිවස, ඒදඬුවාව, මාවනැල්ල ලිපිනයෙහි පදිංචි එල්.ආර්.අයි.කේ. ලේකම්ගේ යන අයට අයත් පර්චස් 46.5 කින් යුත් ඔකඳ කුඹුර නැමැති කුඹුරු ඉඩමෙහි නිවසක් ඉදි කිරීම සඳහා 2017 පෙබරවාරි 08 වන දින ඉදිරිපත් කරන ලද අවසර පත්‍රය වලංගු බලපත්‍රයක් ලෙස පිළිනොගන්නා බවත්, ඉදිකිරිම් කටයුතු නවතන ලෙසත් දන්වා 2017 සැප්තැම්බර් 13 වන දින මධ්‍යස්ථානයේ ප්‍රාදේශීය නිලධාරී විසින් ලිපියක් යොමු කර තිබුණි. එහෙත් එම බලපත්‍රය ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් ජනරාල්, එම්.ඒ.එස්.වීරසිංහ යන අය විසින් නිකුත් කල වලංගු බලපත්‍රයක් යැයි පවසා කුඹුරු ඉඩමේ කොටසක විගණන අවස්ථාව වන විටත් ඉදිකිරිම් කටයුතු සිදුකරමින් පැවතුණි. විස්තර ඡායාරූප වලින් දැක්වේ.





# விவசாய பொருளாதாரத்தை முன்னேற்றுவதற்காக விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களால் ஆற்றப்பட்ட பங்களிப்பினை மதிப்பீடுசெய்தல் தொடர்பான விசேட கணக்காய்வு அறிக்கை

| | விபரம்<br>------------ | | பக்க இல.<br>------------------- |
|---|---|---|---|
| 1. | நிறைவேற்றுப் பொழிப்பு | | |
| 2. | அறிக்கையின் பின்னணி மற்றும் தன்மை | | |
| 3. | பின்பற்றப்பட்ட நடைமுறைகள் | | |
| | 3.1 | கவனத்திற்கொள்ளப்பட்ட புத்தகங்கள், பதிவேடுகள் மற்றும் ஏடுகள் | |
| | 3.2 | பௌதீக பரீட்சிப்பு | |
| | 3.3 | ஏனைய பரீட்சிப்புக்கள் | |
| 4. | நோக்கெல்லை | | |
| 5. | நோக்கெல்லையின் வரையறை | | |
| 6. | செயற்பாட்டின் அறிமுகம் | | |
| 7. | செயற்பாடு | | |
| | 7.1 | கமநல அபிவிருத்தி திணைக்களத்தின் ஸ்தாபிப்பு மற்றும் அவற்றின் செயற்பாடுகள் | |
| | 7.2 | விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களின் நியமனம் மற்றும் கடமையினை நிறைவேற்றல் செயற்பாடுகள் | |
| 8. | அவதானிப்புக்கள் | | |
| | 8.1 | நெற்செய்கையை மேம்படுத்துவதற்கான பங்களிப்பு | |
| | 8.2 | விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்கள் அவர்களுடைய கடமைகளை களத்தில் ஆற்றத் தவறியமை | |
| | 8.3 | விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களின் கடமைகள் மேற்பார்வை செய்யப்படாமை | |
| | 8.4 | விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களின் அறவுறுத்தல்களை விவசாயிகள் பின்பற்றாமை | |
| | 8.5 | விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களின் பரிந்துரைகளை ஏற்றுக்கொள்ளாமை | |
| | 8.6 | விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களிற்கான ஊக்கமளிக்கக்கூடிய நிகழ்ச்சித்திட்டங்கள் காணப்படாமை | |
| 9. | முறைமைகள் மற்றும் கட்டுப்பாடுகள் | | |
| 10. | பரிந்துரைகள் | | |
| 11. | முடிவுரைகள் | | |
| 12. | அட்டவணைகள் | | |

## 1. நிறைவேற்றுப் பொழிப்பு

இலங்கையிலுள்ள அனைத்து விவசாய நிலங்களிலிருந்து அதிஉத்தம விளைச்சலினைப் பிறப்பிப்பதற்கு விவசாய சமூகத்தினை ஊக்குவிக்க அதன் இலட்சிய நோக்குடன் செயற்படுகின்ற கமநல அபிவிருத்தி திணைக்களம், பிராந்திய மட்டத்தில் விவசாய துறை தொடர்பில் செயற்படுகின்ற முன்னோடியான நிறுவகமொன்றாக இனங்காணப்படுகின்றது. மேற்குறித்த இலட்சிய நோக்கினை மேலும் வினைத்திறனாக அடைந்துகொள்ளும் நோக்கொன்றுடன், 1999 ஆம் ஆண்டில் விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர் (ஏ.ஆர்.பீ.ஏ) பதவி உருவாக்கப்பட்டதுடன் தற்போது 9,600 இற்கும் மேலதிகமான உத்தியோகத்தர் பலமொன்றுடன் தீவு முழுவதும் சேவையில் ஈடுபடுத்தப்பட்டுள்ளனர். 2011 இன் 46 ஆம் இலக்க கமநல அபிவிருத்தி (திருத்தப்பட்ட) சட்டத்தினால் திருத்தப்பட்டவாறு 2000 இன் 46 ஆம் இலக்க கமநல அபிவிருத்தி சட்டத்தின் 74(1) ஆம் பிரிவின் கீழ், விவசாய அபிவிருத்தி மற்றும் உற்பத்தி உதவியாளர் பிரிகளினுள் சட்டத்தின் ஏற்பாடுகளினை அமுல்ப்படுத்துவதற்கும் கமத்தொழிலுடன் தொடர்புடைய செயற்பாடுகளில் ஈடுபட்டுள்ள ஏனைய அரசாங்க நிறுவகங்களுக்கு உதவுவதற்கும் கமநல அபிவிருத்தி ஆணையாளர் நாயகம், விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியார்களினை நியமித்துள்ளார்.

தற்போது மொத்த உள்நாட்டு உற்பத்திக்கான விவசாய துறையின் பங்களிப்பு படிப்படியாக குறைந்து செல்லும் போக்கொன்று காணப்படுகின்றதுடன், கேகாலை மாவட்டத்தின் நெற் பயிர்செய்கை தொடர்பான தரவின் பிரகாரம் அறுவடை மற்றும் நெற் பயிர்ச்செய்கை நிலங்களின் விரிவாக்கலில் குறைவடைந்தும் தரிசு நிலங்களின் விரிவாக்கலில் அதிகரிப்பும் வெளிப்படுத்தப்படுகின்றது. கமநல அபிவிருத்தி திணைக்களத்தின் இலட்சிய நோக்கினை அடைந்துகொள்வதற்கு நியமிக்கப்பட்ட விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களினை முறையாக கையாளத் தவறியமை மற்றும் சில சந்தர்ப்பங்களில் துறையில் அவர்களின் கடமைகளினை முறையாக பூர்த்திசெய்வதற்கு அத்தகைய உத்தியோகத்தர்கள் தவறியமை மேற்குறித்த நிலமைகளுக்குக் காரணமாய் அமைந்திருந்தது என கேகாலை மாவட்டத்தில் இது தொடர்பில் நடாத்தப்பட்ட தெரிவுக் கணக்காய்வு பரீட்சிப்பில் மேலும் அவதானிக்கப்பட்டது. மேலும், விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களினை முறையாக கையாள்வதற்கும் அவர்களின் செயற்பாடுகளினை கண்காணிப்பதற்கும் திடமானதொரு உள்ளக கட்டுப்பாட்டு முறைமைகளினை ஸ்தாபிப்பதற்கான அளவிடைகளினை பின்பற்றுதல், துறையில் கடமைகளினை மேற்கொள்கையில் அவர்களினால் முகங்கொடுக்கப்படுகின்ற பிரச்சினைகளினை முறையாக முகாமை செய்தல் மற்றும் தீர்வுகளினை கண்டுபிடித்தல், விவசாய

ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களின் கட்டுப்பாட்டிற்கு அப்பாற்பட்டு தொடர்ந்தும் காணப்படுகின்ற விடயங்களுக்கு கொள்கை ரீதியான தீர்மானங்களினை வழங்குதல், விவசாயத்துறையின் விரிவாக்கத்திற்கு அத்தியாவசியமாக காணப்படுகின்ற அந்த உத்தியோகத்தர்களின் ஆகக்கூடிய சாத்தியமான சேவையை உறுதிப்படுத்தல் ஆகிய வழிகள் மூலம் இது இனங்காணப்பட்டது.

## 2. அறிக்கையின் பின்னணி மற்றும் தன்மை

தற்பொழுது மொத்த உள்நாட்டு உற்பத்திக்கான விவசாயத்துறையின் பங்களிப்பு படிப்படியாக சரிவொன்றினை காட்டுகின்றதுடன், 2016 ஆம் ஆண்டில் அது 7.1 சதவீதமாக கணக்கிடப்பட்டமையினால், 2015 ஆம் ஆண்டுடன் ஒப்பிடுகையில் 4.2 சதவீத குறைவொன்றினைக் காட்டுகின்றது. (மூலம் - மத்திய வங்கி அறிக்கை, 2016). இந்த சூழ்நிலையின் கீழ், விவசாய ஆராய்சி மற்றும் உற்பத்தி உதவியாளர்கள் அவர்கள் தொடர்பில் ஏற்பட்ட செலவினங்களுக்கு ஈடாக விவசாய விரிவாக்கலினை நோக்கியதாக போதுமானதொரு பங்களிப்பினை மேற்கொண்டுள்ளனரா என்பதனை அவதானிப்பதற்கும் அவ்வாறு இல்லையெனில், அவற்றிற்கான காரணங்களினை அறிந்துகொள்வதுடன் பரிகார நடவடிக்கைகளினை பரிந்துரைப்பது, இந்த பரீட்சிப்பினை நடாத்துவதற்கான பின்னணியாக உருவாக்கப்பட்டது.

## 3. பின்பற்றப்பட்ட நடைமுறைகள்

இந்த அறிக்கையின் தயாரிப்பில் பின்வரும் நடைமுறைகள் பின்பற்றப்பட்டன.

### 3.1 கவனத்திற்கொள்ளப்பட்ட புத்தகங்கள், பதிவேடுகள் மற்றும் ஏடுகள்

- ❖ 2000 இன் 46 ஆம் இலக்க கமநல அபிவிருத்திச் சட்டம்
- ❖ விவசாயத் திணைக்களத்தின் தகவல்
- ❖ கமநல அபிவிருத்தி திணைக்களத்தின் தகவல்
- ❖ தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரவியல் திணைக்களத்தின் தகவல்
- ❖ கமநல அபிவிருத்தி சபைகளின் தகவல்

### 3.2 பௌதீக பரீட்சிப்பு

விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களின் துறையுடன் தொடர்புடைய நெற்காணிகள் மீதான பௌதீக பரீட்சிப்பு

### 3.3 ஏனைய பரீட்சிப்புக்கள்

- ❖ தொடர்புடைய தரப்பினர்களுடன் கலந்துரையாடல்களினை நடாத்துதல்
- ❖ இணையம் மற்றும் ஏனைய மூலங்களிலிருந்து பெறப்பட்ட விபரங்களினை பகுத்தாராய்தல்.

## 4. நோக்கெல்லை

பின்வரும் விடயங்கள் மீது கவனம் செலுத்தப்பட்டன.

4.1 விசேட கணக்காய்வின் ஆரம்பித்தல் திகதியான, 2017 நவம்பர் 01 அளவில் கேகாலை மாவட்டத்திற்கு இணைக்கப்பட்டுள்ள 452 விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களின் அடிப்படையில் கணக்காய்வு ஆரம்பிக்கப்பட்டது.

4.2 சேகரிக்கப்பட்ட ஆவணங்கள், அதன்மீதான உண்மையானதொரு தீர்மானமொன்றினை அடையக்கூடிய முறையொன்றில் பொருண்மையுடையதாகக் கருதப்படுகின்றமை.

4.3 கணக்காய்வு அவதானிப்புக்கள் மற்றும் கண்டுபிடிப்புக்களின் அடிப்படையில் இந்த நிகழ்ச்சித்திட்டத்தின் வினைத்திறனுக்கான பரிந்துரைகள் மற்றும் முடிவுகளை பிரயோகிக்க முடியும்.

## 5. நோக்கெல்லையின் வரையறை

இந்த அறிக்கையின் தயாரிப்பில், எனது நோக்கெல்லைக்கு பின்வருவன வரையறைகளாகக் காணப்பட்டன.

5.1 விவசாயப் பொருளாதார கருத்தின் பிரகாரம், நெல் மற்றும் தானியங்கள் போன்ற நுகரத்தகு பயிர்களினையும், தேயிலை, இறப்பர் மற்றும் தேங்காய் போன்ற பண பயிர்களினையும் மற்றும் கருவாப்பட்டை, மிளகு, கராம்பு மற்றும் விலங்கு மற்றும் பால் உற்பத்திகள் போன்ற சிறிய ஏற்றுமதி பயிர்கள் உள்ளடங்களாக பரந்ததொரு

துறையினை அது கொண்டுள்ளது. எவ்வாறாயினும், அனைத்து பயிர்களினதும் பங்களிப்புக்களினை பரீட்சிப்பது கடினமென கண்டறியப்பட்டதிலிருந்து, பரீட்சிப்பு பிரதானமாக நெற் பயிர்ச்செய்கைக்கு வரையறுக்கப்பட்டது.

5.2 இலங்கையில் ஒட்டுமொத்த கமநல சேவை நிலையங்களுக்கு இணைக்கப்பட்ட விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களின் செயற்பாடுகளினை பரீட்சிப்பது கடினமென நடைமுறைரீதியாக கண்டறியப்பட்டதிலிருந்து, மாதிரியொன்றாக கேகாலை மாவட்டம் தெரிவு செய்யப்பட்டதுடன், அவற்றில் கமநல சேவைக் குழுக்கள் பரீட்சிக்கப்பட்டன.

5.3 பண்படுத்தப்பட்ட நெற்காணிகள் மற்றும் தரிசு காணிகளின் பரீட்சிப்பின் போது, உரிய பிரிவிற்கு பொறுப்பான விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களின் ஈடுபாட்டுடன் உரிய பரீட்சிப்பு நடாத்தப்படல் வேண்டும்.

5.4 விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களின் அனைத்து பூர்த்தியாக்கப்பட்ட வேலை மற்றும் எதிர்கால நிகழ்ச்சித்திட்டங்களை பரீட்சிப்பது கடினமென கண்டறியப்பட்டதிலிருந்து, அது மாதிரி பரீட்சிப்பொன்றிற்கு வரையறுக்கப்பட்டது.

## 6. செயற்பாட்டின் அறிமுகம்

6.1 கமநல அபிவிருத்தி திணைக்களத்தின் ஸ்தாபிப்பு மற்றும் அதன் செயற்பாடுகளின் அறிமுகம்

6.2 விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களின் நியமனம் மற்றும் கடமைகளினை நிறைவேற்றல் செயற்பாட்டின் அறிமுகம்

## 7. செயற்பாடு

### 7.1 கமநல அபிவிருத்தி திணைக்களத்தின் ஸ்தாபிப்பு மற்றும் அவற்றின் செயற்பாடுகள்

விவசாயத்துறையுடன் சம்பந்தப்பட்ட பாராளுமன்ற தீர்மானங்களினை அமுல்படுத்துவதற்கு நிறுவகரீதியான பொறுப்புடையவராக கமநலஅமைச்சு காணப்படுகின்றதுடன் பல்வேறு நோக்கங்களுக்கு அதன்கீழ் பாரியதொரு எண்ணிக்கையான நிறுவகங்கள் ஸ்தாபிக்கப்பட்டிருந்தது. மேலுள்ள நிறுவகங்களில், பிராந்திய மட்டத்தில் விவசாயம் தொடர்பில் கமநல அபிவிருத்தி திணைக்களம் பிரதான

நிறுவகமாகக் காணப்படுகின்றது. விவசாய நிகழ்ச்சித்திட்டங்களுக்கு ஆரம்ப விநியோக சேவைகளினை வழங்கும் நோக்குடன் 1957 ஒக்தோபர் 01 இல் கமநல அபிவிருத்தி திணைக்களம் ஸ்தாபிக்கப்பட்டிருந்ததுடன், தற்பொழுது 2000 இன் 46 ஆம் இலக்க கமநல அபிவிருத்தி சட்டத்தினால் (பின்னிணைப்பு 01) கட்டுப்படுத்தப்படுகின்றது. அவற்றின் தூரநோக்கு மற்றும் இலட்சிய நோக்கு பின்வருமாறு.

**தூரநோக்கு** - இலங்கையில் விவசாயக் காணிகள் மற்றும் விவசாய சமூகத்தின் நிலைபேறான அபிவிருத்தியினை உறுதிப்படுத்தல்.

**இலட்சிய நோக்கு** - இலங்கையில் அனைத்து விவசாயக் காணிகளிலிருந்து அதிஉத்தம விளைச்சலினை பெறுவதற்கு விவசாய சமுகத்தினை ஊக்கப்படுத்தல், அவர்களின் நிறுவன ரீதியான அதிகாரத்தினை ஊக்கப்படுத்தல், பல்வேறுபட்ட விவசாய ரீதியான இயற்கையான முரண்பாடுகளினை தீர்த்துரைத்தல், அவற்றின் சட்ட அமைப்பின் தயாரிப்பு மற்றும் பராமரிப்பு, விவசாய சேவைகள் மற்றும் உள்ளீடுகளின் கால ரீதியான ஏற்பாட்டினை உறுதிப்படுத்தல் மற்றும் தொடர்புடைய நிறுவன கட்டமைப்பின் ஸ்தாபிப்பு மற்றும் பராமரிப்பு.

**சேவைகள்**

- ❖ விவசாயக் கடன்கள் மற்றும் விவசாயத்தினை மேம்படுத்தல்
- ❖ விவசாய உள்ளீடுகளின் விநியோகம்
- ❖ சிறிய நீர்ப்பாசனம் மற்றும் விவசாயக் கிணறுகளின் முன்னேற்றம்
- ❖ விவசாய உபகரணங்களின் விநியோகம்
- ❖ விவசாயக் காணிகளின் முகாமைத்துவம்
- ❖ விலைக் கட்டுப்பாடு

2011 இன் 46 ஆம் இலக்க கமநல அபிவிருத்தி (திருத்தியமைக்கப்பட்டது) சட்டத்தினால் திருத்தியமைக்கப்பட்டவாறு 2000 இன் 46 ஆம் இலக்க கமநல அபிவிருத்தி சட்டத்தில் (பின்னிணைப்பு-02) பின்வரும் விடயங்கள் விபரிக்கப்பட்டுள்ளன.

- ❖ நெற்காணிகளின் வாரப் பயிர்ச்செய்கையாளர்
- ❖ நெற்காணி விவசாயிகளின் வாரப் பயிர்செய்கையாளர்களினது உரிமைகள்

- ❖ கமத்தொழில் கொள்கைகளுக்கிணங்கக் கமத்தொழிற் காணிகளைப் பயன்படுத்துதல்
- ❖ ஆணையாளர் தலைமையதிபதி, மேலதிக ஆணையாளர் தலைமையதிபதி, ஆணையாளர்கள், பிரதி ஆணையாளர்கள், உதவி ஆணையாளர்கள் மற்றும் கமநல அபிவிருத்தி அலுவலர்கள், ஆகியோரின் நியமனங்களும் அவர்களின் தத்துவங்களும் கடமைகளும்.
- ❖ கமநல நியாய சபைகளைத் தாபித்தல்.
- ❖ கமக்காரர்களின் ஒழுங்கமைப்புக்களின் நிறுவனரீதியான அமைப்புமுறை.
- ❖ கமநல அபிவிருத்தி சபை.
- ❖ சிறிய நீர்ப்பாசன வேலையும், நீர்ப்பாசன நீரின் முகாமையும்.
- ❖ பொதுவான ஏற்பாடுகள்.

**7.2 விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களின் நியமனம் மற்றும் கடமையினை நிறைவேற்றல் செயற்பாடுகள்**

7.2.1 அதிக வினைத்திறனான வகையில் தூரநோக்கினை அடைந்துகொள்வதற்கு கிராமிய மட்டத்தில் விவசாய செயற்பாடுகளின் ஒருங்கிணைப்பு, ஒருமைப்பாடு, திட்டமிடல் மற்றும் அமுல்படுத்தல் நோக்கத்திற்கு 2011 இன் 46 ஆம் இலக்க கமநல அபிவிருத்தி (திருத்தியமைக்கப்பட்டது) சட்டத்தினால் திருத்தப்பட்டவாறு 2000 இன் 46 ஆம் இலக்க கமநல அபிவிருத்தி சட்டத்தின் 74(1) ஆம் பிரிவின் கீழ் 1999 ஆம் ஆண்டில் கமநல அபிவிருத்தி ஆணையாளர் நாயகம் விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களினை நியமித்திருந்தார். தற்பொழுது நாடளாவிய ரீதியில் சேவையில் அண்ணளவாக 9,600 விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்கள் ஈடுபட்டுள்ளனர். அவர்களில், 452 விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்கள் கேகாலை மாவட்டத்தில் சேவையாற்றுகின்றதுடன் 2015 மற்றும் 2016 ஆம் ஆண்டுகளில் அந்த உத்தியோகத்தர்கள் தொடர்பில் அரசு ரூபா 334,590,615 தொகையொன்றினை செலவழித்திருந்தது.

7.2.2 தொடர்புடைய விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்கள் பிரிவுகளில், 2000 இன் 46 ஆம் இலக்க கமநல அபிவிருத்தி சட்டத்தின் ஏற்பாடுகளினை அமுல்படுத்தல் மற்றும் விவசாயத்துடன் தொடர்புடைய செயற்பாடுகளில் ஈடுபட்டுள்ள ஏனைய அரச நிறுவகங்களுக்கு உதவும் பொருட்டு, இந்த உத்தியோகத்தர்களுக்கு பின்வரும் கடமைகள் மற்றும் பொறுப்புக்கள் ஒப்படைக்கப்பட்டிருந்தது.

- ❖ பருவகால கூட்டங்களினை நடாத்துவதற்கு மற்றும் எடுக்கப்பட்ட தீர்மானங்களினை அமுல்படுத்துவதற்கு தேவையான ஏற்பாடுகளினை மேற்கொள்ளுதல்

- ❖ விவசாயிகள் மற்றும் விவசாய நிறுவனங்களின் ஈடுபாட்டுடன் சிறிய தண்ணீர் தொட்டிகளின், சிறிய நீர்ப்பாசனங்கள், கால்வாய்கள் ஏனையவற்றின் புனரமைப்பு, பராமரிப்பு மற்றும் பாதுகாப்புக்கு நடவடிக்கை எடுத்தல்.

- ❖ ஏக்கர் வரியின் அறவிடுகை

- ❖ தொடர்புடைய சட்டத்தின் ஏற்பாடுகளின் பிரகாரம் அறுவடை செய்யப்படாத வயல் காணிகளில் / ஏனைய காணிகளில் வினைத்திறனாக அறுவடை செய்வதற்கு நடவடிக்கை எடுத்தல்.

- ❖ தொடர்புடைய பிரதேசத்தில் விவசாய நிறுவனங்களின் செய்தியை பரப்புபவராக செயற்படல்.

- ❖ விவசாயிகள் சங்கத்தின் ஸ்தாபிப்பு, பதிவு மற்றும் வலுவூட்டல் தொடர்பில் மத்தியஸ்தர் மற்றும் ஒருங்கிணைப்பாளரொருவரின் பொறுப்புக்களினை நிறைவேற்றல்.

- ❖ அங்கீகரிக்கப்படாத விவசாயக் காணிகளின் மீட்பில் ஈடுபட்டுள்ள நபர்கள் தொடர்பில் சட்டத்திலுள்ள ஏற்பாடுகளின் பிரகாரம் நடவடிக்கை எடுத்தல் மற்றும் கமநல அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கு அவர்களின் நீதிமன்ற நடவடிக்கைகளுக்கு தேவையான உதவிகளினை வழங்குதல்.

- ❖ விவசாயமற்ற நோக்கங்களுக்கு நெற்காணிகளின் பயன்படுத்துகைக்கு அனுமதிப்பத்திரங்களை வழங்குவதற்கு பரிந்துரைகளினை மேற்கொள்ளல் மற்றும் தொடர்புடைய நோக்கத்திற்கு வழங்கப்பட்ட அனுமதிப்பத்திரங்களின் பயன்பாட்டின் மீது பின்தொடர் நடவடிக்கைகளினை எடுத்தல்.

- ❖ வழிதவறிய விலங்குகளினால் விவசாய பயிர்கள் மற்றும் சிறிய நீர்ப்பாசனத்திற்கு ஏற்படுத்தப்பட்ட சேதங்கள் தொடர்பில் சட்டத்தின் ஏற்பாடுகளினைத் தொடர்ந்து நடவடிக்கை எடுத்தல்.

- ❖ நீர் மூலங்களின் அடிப்படையில் பயிர்ச் செய்கைகளினை ஆரம்பித்தல் மற்றும் நீர் இருப்புக்களின் பாதுகாப்பு போன்ற அனைத்து தொடர்புடைய செயற்பாடுகளினையும் அமுல்படுத்துதல்.

(10) මෙම වගන්තියේ කාර්ය සඳහා "පවුලේ සාමාජිකයා" යන්නෙන් අඳ ගොවියාගේ කලත්‍රයා හෝ පුතෙකු හෝ දියණියක අදහස් වේ. තව ද, එසේ අදහස් වීමට ඒ කලත්‍රයාගේ පුතාගේ හෝ දියණියගේ ප්‍රධාන රැකියාව ගොවිතැන විය යුතු අතර, ඒ තැනැත්තාගේ එකම ආදායම් මාර්ගය අඳ ගොවියා වගා කළ කුඹුරු ප්‍රමාණයෙන් ව්‍යුත්පන්න වන්නක් විය යුතු ය.

අයිතිවාසිකම් උරුම වීමට අනුප්‍රාප්තිකයකු නොමැති අවස්ථා.

I ඊ. (1) යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක අඳ ගොවියකු මිය ගිය විට හෝ ස්ථිර අබලතාවයට පත් වූ විට, ඒ ඉඩම් ප්‍රමාණය සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි, මිය ගිය හෝ ස්ථිර අබලතාවයකට පත් වූ අඳ ගොවියාගේ අයිතිවාසිකම් උරුම වීමට, 1ඈ වගන්තිය හෝ 1ඉ වගන්තිය ප්‍රකාර අනුප්‍රාප්තිකයකු නොමැති විට, ඒ ඉඩම් ප්‍රමාණයේ අයිතිකරු ද වන, එහි ඉඩම් හිමියා කැමති නම්, ඒ ඉඩම් ප්‍රමාණය එහි ඉඩම් හිමි ගොවියා වශයෙන් සන්තකයට ගෙන වගා කළ හැකි ය:

එසේ වුව ද, ඒ ඉඩම් ප්‍රමාණයේ ඉඩම් හිමි ගොවියා වශයෙන් වගා කිරීමට පෙරාතුව එසේ ඉඩම් හිමි ගොවියා වශයෙන් වගා කිරීමට ඔහුගේ ඇති කැමැත්ත පිළිබඳව ඉඩම් හිමියා විසින්, කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(2) අඳ ගොවියා මිය ගොස් ඇති බවට හෝ ස්ථිර අබලතාවයට පත් වී ඇති බවටත්, මිය ගිය හෝ ස්ථිර අබලතාවයට පත් වූ අඳ ගොවියාගේ අයිතිවාසිකම් උරුමවීමට, 1ඈ වගන්තිය හෝ 1ඉ වගන්තිය ප්‍රකාර පවුලේ අනුප්‍රාප්තිකයකු නොමැති බවටත්, සෑහීමකට පත්වීමෙන් පසුව, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය එහි ඉඩම් හිමි ගොවියා වශයෙන් වගා කිරීමට හා භුක්ති විඳීමට ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයේ ඉඩම් හිමියාට අවසර දෙනු ලැබිය හැකි ය.

මියගිය හෝ ස්ථිර අබලතාවයකට පත් වූ අඳ ගොවියකුගේ කුඹුරු ඉඩම් ප්‍රමාණයේ අයිතිවාසිකම්වලට හිමිකම් නැති තැනැත්තකු ඒ කුඹුරු ප්‍රමාණය භුක්ති විඳීම හෝ ප්‍රයෝජනයට ගැනීම නොකළ යුතු බව.

1උ. (1) යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක අඳ ගොවියකු මිය ගිය හෝ ස්ථිර අබලතාවයකට පත් වූ අවස්ථාවක, එකී අඳ ගොවියාට ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය පිළිබඳව ඇති අයිතිවාසිකම්වලට හිමිකමක් නැති කිසිම තැනැත්තකු එය භුක්ති විඳීම හෝ ප්‍රයෝජනයට ගැනීම නොකළ යුතු ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් යම් කුඹුරු ප්‍රමාණයක් භුක්ති විඳීම හෝ ප්‍රයෝජනයට ගැනීම කරන්නේ නම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිත නියමයක් මගින්, එම නියමයේ නිශ්චිතව සඳහන් කර ඇති දින හෝ ඊට පෙර එම කුඹුරු ප්‍රමාණයෙන් ඉවත් විය යුතු යයි ඒ තැනැත්තාට නියම කළ යුතු ය. ඒ තැනැත්තා එම නියමයට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරියහොත්, 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඔහු ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් නෙරපනු ලැබිය යුතු ය.

අඳ ගොවියන්ගේ අයිතිවාසිකම් උරුමවීම පිළිබඳ ආරාවුල් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කළ යුතු බව.

1ඌ. (1) යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක අඳ ගොවියකු මිය ගිය විට හෝ ස්ථිර අබලතාවයකට පත් වූ විට, මේ පනත යටතේ ඒ අඳ ගොවියාගේ අයිතිවාසිකම් උරුම විය යුතු තැනැත්තා කවරෙක් ද යන්න පිළිබඳව ආරාවුලක් ඇති වූ අවස්ථාවක, ඒ ආරාවුල කොමසාරිස් ජනරාල්වරයා විසින් බේරුම් කිරීම සඳහා, ඒ ආරාවුලේ පාර්ශවකරුවන් විසින්, පළමුව ඒ ආරාවුල පිළිබඳ ලියාපදිංචි තැපැල් මගින් වූ ලියවිල්ලකින් කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දීමෙන් පසුව කොමසාරිස් ජනරාල්වරයා වෙත යොමු කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන දැන්වීම ලැබීමෙන් පසුව, කොමසාරිස් ජනරාල්වරයා විසින් ආරාවුල ගොවිජන විනිශ්චය සභාවක් වෙත යොමු කළ යුතු අතර, මිය ගිය හෝ ස්ථිර අබලතාවයට පත් වූ අඳ ගොවියාගේ අයිතිවාසිකම් උරුම විය යුත්තේ කවරෙකුට ද යන්න නිශ්චය කිරීම සඳහා පරීක්ෂණයක් පැවැත්වීමට විධාන කරනු ලැබිය යුතු ය.

(3) ගොවිජන විනිශ්චය සභාවේ නිශ්චය කිරීම ආරාවුලේ පාර්ශවකරුවන්ට ද පිටපතක් සහිතව කොමසාරිස් ජනරාල්වරයාට ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දෙනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන වගන්තියට ඉක්බිතිව ම යෙදී ඇති "I වන කොටස" සහ "කුඹුරු ඉඩම් ගොවිතැන් කරන තැනැත්තන්ගේ අයිතිවාසිකම්" යන ශීර්ෂ පහත දැක්වෙන ශීර්ෂ මගින් මෙයින් ප්‍රතියෝජනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන කොටසේ ශීර්ෂ ප්‍රතියෝජනය කිරීම.

"I අ වන කොටස
කුඹුරු ඉඩම්වල අඳ ගොවියන්ගේ අයිතිවාසිකම්"

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, ඒ වගන්තියේ "6 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් යෙදී ඇති සෑම තැනක ම "1අ වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් යෙදීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ඉවත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(6) ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයේ ඉඩම් හිමියාට සහ නෙරපනු ලැබූ තැනැත්තාට පෞද්ගලිකව හෝ නියෝජිතයකුගේ මාර්ගයෙන් ගොවිජන විනිශ්චය සභාවක් විසින් පවත්වනු ලබන ඒ පරීක්ෂණයේ දී කරුණු දක්වා සිටීමේ අවස්ථාවක් ලබා දිය යුතු ය. ඒ පරීක්ෂණය අවසන් වීමෙන් පසුව ගොවිජන විනිශ්චය සභාවේ තීරණය,

කොමසාරිස් ජනරාල්වරයා වෙත, ඉඩම් හිමියා වෙත සහ නෙරපනු ලැබූ තැනැත්තා වෙත ලියාපදිංචි තැපැල් මගින් වූ ලියවිල්ලකින් දිනුම් දිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:—

"(6අ) ඒ තීරණයෙන්, ඉඩම් හිමියා හෝ නෙරපනු ලැබූ තැනැත්තා අතෘප්තියට පත් වූයේ නම්, ඉඩම් හිමියා හෝ නෙරපනු ලැබූ තැනැත්තා වෙත ඒ දැනුම් දීම කරනු ලැබීමෙන් දින තිහක් ඇතුළත, 42අ වගන්තිය යටතේ පිහිටුවනු ලද සමාලෝචන මණ්ඩලය වෙත, නීති පිළිබඳ ප්‍රශ්නයක් හෝ සිද්ධි පිළිබඳ ප්‍රශ්නයක් මත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. ඒ අභියාචනය සඳහා ඉඩ දෙනු ලැබූ කාලසීමාව ඇතුළත ඒ අභියාචනය කොමසාරිස් ජනරාල්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ අභියාචනය 42අ වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද සමාලෝචන මණ්ඩලයක් විසින් විභාග කර අවසන් කරනු ලැබීම සඳහා 42අ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද මූල මණ්ඩලය වෙත වහාම යොමු කරනු ලැබිය යුතු ය.

(6ආ) 42අ වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද සමාලෝචන මණ්ඩලයක් විසින් (6අ) වන උපවගන්තිය යටතේ ඒ මණ්ඩලය වෙත යොමු කරනු ලැබූ සියලු අභියාචන පිළිබඳ පරීක්ෂණ පැවැත්විය යුතු අතර, එහි තීරණය පිළිබඳ අභියාචනයේ පාර්ශවයන්ට සහ කොමසාරිස් ජනරාල්වරයාට ලියාපදිංචි තැපැල් මගින් වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

(6ඇ) සමාලෝචන මණ්ඩලයේ තීරණයෙන්, ඉඩම් හිමියා හෝ නෙරපනු ලැබූ තැනැත්තා අතෘප්තියට පත් වූයේ නම්, ඉඩම් හිමියා හෝ නෙරපනු ලැබූ තැනැත්තා වෙත ඒ දැනුම් දීම කරනු ලැබීමෙන් දින තිහක් ඇතුළත ඒ තීරණයට එරෙහිව, පළාත්බද මහාධිකරණය වෙත නීති පිළිබඳ ප්‍රශ්නයක් මත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. අභියාචනයේ පිටපතක්, අභියාචනය කරනු ලබන අවස්ථාවේ දී ම කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතු ය.

(6ඇ) අභියාචනය කිරීම සඳහා ඉඩ දෙනු ලැබූ කාලය ඇතුළත සමාලෝචන මණ්ඩලයේ තීරණයට එරෙහිව අභියාචනයක් කරනු නොලැබූ අවස්ථාවක, ඒ තීරණය අවසානාත්මක විය යුතු ය.";

(3) ඒ වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(7) (6ආ) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ යම් පරීක්ෂණයක දී—

(අ) නෙරපීම තහවුරු වී ඇති බව සමාලෝචන මණ්ඩලය විසින් තීරණය කරන ලදුව, ඒ තීරණයට එරෙහිව අභියාචනයක් කිරීමට දී ඇති කාලසීමාව ඇතුළත (6ඇ) වන උපවගන්තිය යටතේ අභියාචනයක් කර නොමැති අවස්ථාවක් හෝ නෙරපීම තහවුරු වී ඇති බවට වූ සමාලෝචන මණ්ඩලයේ තීරණය (6ඇ) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ අභියාචනයක දී පළාත්බද මහාධිකරණය විසින් ස්ථිර කරනු ලැබ ඇති අවස්ථාවක්; හෝ

(ආ) නෙරපීම තහවුරු වී නොමැති බව සමාලෝචන මණ්ඩලය විසින් තීරණය කරන ලදුව, (6ඇ) වන උපවගන්තිය යටතේ කරන ලද අභියාචනයේ දී පළාත්බද මහාධිකරණය විසින් සමාලෝචන මණ්ඩලයේ තීරණය වෙනස් කර නෙරපීම තහවුරු වී ඇතැයි තීරණය කළ අවස්ථාවක්,

යන ඉහත සඳහන් කවර හෝ අවස්ථාවක දී—

(i) නෙරපනු ලබූ තැනැත්තාට, ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයෙහි ප්‍රයෝජනය සහ භුක්තිය ආපසු ලැබීමට හිමිකම තිබිය යුතු ය. තවද,

(ii) අවස්ථාවෝචිත පරිදි, සමාලෝචන මණ්ඩලයේ හෝ පළාත්බද මහාධිකරණයේ තීරණය තමාට ලැබුණු විට, කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිත නියමයක් මගින් එහි නිශ්චිතව සඳහන් දිනයක හෝ

ඉන් පෙර ආරවුලට විෂයය වී ඇති කුඹුරු ප්‍රමාණය භුක්තියට ගෙන සිටින සෑම තැනැත්තකුම එයින් ඉවත් විය යුතු යයි නියම කළ යුතු ය. තව ද, ඒ තැනැත්තන් ඒ නියමය පිළිපැදීම පැහැර හැරිය හොත් 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඔවුන් ඒ කුඹුරු ප්‍රමාණයෙන් නෙරපනු ලැබිය යුතු ය. තව ද,

(iii) (i) වන අනු-ඡේදයේ සඳහන් තැනැත්තා නෙරපන ලද්දේ ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයේ ඉඩම් හිමියාගේ දැනුම, කැමැත්ත හෝ ගුප්තානුකූලතාව නොමැතිව බව සමාලෝචන මණ්ඩලය විසින් හෝ පළාත්බද මහාධිකරණය විසින් හෝ තීරණය කර ඇත්නම් මිස නියමයක් කරනු ලැබ ඇත්තේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා විසින් නියමයේ නිශ්චිතව සඳහන් දිනයට පසුව ඒ ඉඩම් ප්‍රමාණය භුක්තිවිඳීම දිගටම කරගෙන යන කාලය තුළ එක් එක් දිනයක් සඳහා නියම කරනු ලැබිය හැකි අනුප්‍රමාණයක් අනුව ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියා විසින් ඒ තැනැත්තාට අලාභ ගෙවිය යුතු ය.”.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.*

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය, ඒ වගන්තියේ “6 වන වගන්තිය” යන වචන සහ ඉලක්කම් යෙදී ඇති සෑම තැනක ම “1 අ වන වගන්තිය” යන වචන සහ ඉලක්කම් යෙදීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය ඉවත් කිරීම.*

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.*

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

“(1) වසර හතකට වඩා පළපුරුද්දක් ඇති විශ්‍රාමික විනිසුරුවරුන් අතරින්, නැතහොත් ගොවිජන සේවා ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර හතක පළපුරුද්දක් ඇති විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් අතරින් එක්

තැනැත්තකුගෙන් සමන්විත ගොවිජන විනිශ්චය සභා එකක් හෝ වැඩි ගණනක්, සෑම පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා ම නැතහොත් පරිපාලන දිස්ත්‍රික්ක එකක් හෝ වැඩි ගණනක් සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "ගොවිජන විනිශ්චය සභාවක සාමාජිකයකු" යන වචන වෙනුවට "ගොවිජන විනිශ්චය සභාවට පත් කරනු ලැබූ තැනැත්තා" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) ගොවිජන විනිශ්චය සභාවට පත් කරනු ලබන සෑම තැනැත්තකු ම, තමා කලින් ධුරය අත්හරිනු ලැබුවහොත් මිස අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය:

එසේ වුවද—

(අ) මිය ගිය, ධුරයෙන් ඉල්ලා අස්වූ හෝ ඉවත් කරනු ලැබූ තැනැත්තකු වෙනුවට පත් කරනු ලැබූ තැනැත්තකු තමා අනුප්‍රාප්තිකයා වන තැනැත්තාගේ ධුර කාලයෙන් ඉකුත් නොවූ කාල පරිච්ඡේදය සඳහා ධුරය දැරිය යුතු ය. ; සහ ද,

(ආ) ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා නොපැමිණි හෝ අසනීප වූ තැනැත්තකු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා පත් කරන ලද තැනැත්තකු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා පත් කරන ලද තැනැත්තකු, ඒ තැනැත්තා නොපැමිණි හෝ අසනීප වූ කාල පරිච්ඡේදය සඳහා ධුරය දැරිය යුතු ය.";

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(4) කාලය ගෙවී යාම නිසා ධුරය හිස් කරන තැනැත්තකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.";

(5) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ; සහ

(6) ඒ වගන්තියේ (9) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(9) මේ පනත යටතේ ගොවිජන විනිශ්චය සභාවක් වෙත යොමු කරන ලද සියලු ඉල්ලීම් සහ පැමිණිලි ගොවිජන විනිශ්චය සභාව විසින් ඒ ඉල්ලීම් හෝ පැමිණිලි ලැබීමේ දින සිට මාස හයක කාලසීමාවක් ඇතුළත විමසා බලා අවසන් කළ යුතු අතර, ඒ පිළිබඳ වූ ස්වකීය තීරණ, ඊට සම්බන්ධ පාර්ශවකරුවන් හා කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියාපදිංචි තැපැල් මගින් දැන්විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය ඉවත් කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ඉල්ලීමක්, පැමිණිල්ලක් හෝ අභියාචනයක් කරනු ලබන යම් පාර්ශවකරුවකු විසින් ගොවිජන විනිශ්චය සභාවේ තීරණය පිළිබඳ දැන්වීම තමා වෙත ලැබීමෙන් දින තිහක් ඇතුළත ඒ පිළිබඳ වූ ගොවිජන විනිශ්චය සභාවේ තීරණයට එරෙහිව අභියාචනයක්" යන වචන වෙනුවට "ඉල්ලීමක් හෝ පැමිණිල්ලක් කරනු ලබන යම් පාර්ශවකරුවකු විසින් ගොවිජන විනිශ්චය සභාවේ තීරණය පිළිබඳ දැන්වීම තමා වෙත ලැබීමෙන් දින තිහක් ඇතුළත ඒ පිළිබඳ වූ ගොවිජන විනිශ්චය සභාවේ තීරණයට එරෙහිව සමාලෝචන මණ්ඩලයට අභියාචනයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(2) ගොවිජන විනිශ්චය සභාවේ තීරණය තමා වෙත ලැබීමෙන් දින තිහක් ඇතුළත එවැනි පාර්ශවකරුවකු විසින් ගොවිජන විනිශ්චය සභාවේ තීරණයට එරෙහිව සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක සමාලෝචන මණ්ඩලයේ තීරණය දෙනු ලැබූ විට බලාත්මක කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය, මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"අභියාචනා කිරීමේ අයිතිය.

42. ගොවිජන විනිශ්චය සභාවක් වෙත යොමු කරන ලද යම් ඉල්ලීමක් හෝ පැමිණිල්ලක් පිළිබඳ වූ එහි තීරණයෙන් අතෘප්තියට පත් පාර්ශවකරුවන් විසින්, ඒ තීරණය ලැබීමෙන් දින තිහක් ඇතුළත 42අ වන වගන්තිය යටතේ පිහිටුවන ලද සමාලෝචන මණ්ඩලයක් වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ IVඅ අලුත් කොටස ඇතුළත් කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස ඇතුළත් කරනු ලබන අතර, ඒ කොටස ප්‍රධාන ප්‍රඥප්තියේ IVඅ කොටස ලෙස බලාත්මක විය යුතු ය:—

"IVඅ කොටස
සමාලෝචන මණ්ඩල

සමාලෝචන මණ්ඩල.

42අ (1) සමාලෝචන මණ්ඩල ස්ථාපිත කිරීමේ කාර්යය සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින්, නීති ක්ෂේත්‍රයේ සහ ගොවිජන සේවා ක්ෂේත්‍රයේ පුළුල් දැනුමක් ඇති තැනැත්තන් අතරින් තැනැත්තන් නව දෙනකුට නොවැඩි සංඛ්‍යාවක් ඇතුළත් මූල මණ්ඩලයක්, වසර තුනක කාලසීමාවක් සඳහා පත් කරනු ලැබිය යුතු ය.

(2) මූල මණ්ඩලයේ නිලධරයකු මරණය සිදුවීමේ, ඉල්ලා අස්වීමේ, ධුරයෙන් ඉවත් කිරීමේ, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හෝ රෝගාතුර වීමේ හේතුව නිසා තම ධුරය හිස් කළහොත්, ඔහුගේ ධුරයේ සේවය කිරීමට (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(3) (අ) මියගිය, ඉල්ලා අස් වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ යම් සාමාජිකයකුගේ ධුරයකට පත් කරනු ලැබූ තැනැත්තකු ඔහු අනුප්‍රාප්තිකයා වන

සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(ආ) ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින හෝ රෝගාතුර වී සිටින සාමාජිකයකු වෙනුවෙන් වැඩ බැලීමට පත් කරනු ලැබූ තැනැත්තකු ඔහු අනුප්‍රාප්තිකයා වන සාමාජිකයා බැහැරව සිටින හෝ රෝගාතුරව සිටින කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(4) මූල මණ්ඩලයේ එක් සාමාජිකයකු මූල මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(5) (අ) මේ පනතේ කාර්යය සඳහා, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන සමාලෝචන මණ්ඩල යම් සංඛ්‍යාවක් ස්ථාපිත කරනු ලැබිය හැකි ය.

(ආ) කොමසාරිස් ජනරාල්වරයා විසින් යම් විශේෂිත පරිපාලන දිස්ත්‍රික්කයක අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, ඒ සමාලෝචන මණ්ඩල සංඛ්‍යාව අතරින් ඒ විශේෂිත දිස්ත්‍රික්කයට අවශ්‍ය වන සමාලෝචන මණ්ඩල සංඛ්‍යාව කොපමණක්ද යන්න නිශ්චය කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලන දිස්ත්‍රික්කයක් තුළ ක්‍රියාත්මකව පවතින පරිදි, නිශ්චය කරනු ලබන සමාලෝචන මණ්ඩල සංඛ්‍යාව එවැනි මණ්ඩල තුනක් නොඉක්මවිය යුතු ය.

(6) මේ පනතේ විධිවිධාන යටතේ (5) වන උපවගන්තිය යටතේ ස්ථාපිත කරන ලද සමාලෝචන මණ්ඩලයක් වෙත යොමු කරනු ලබන, අතෘප්තියට පත් යම් පාර්ශවකරුවකුගේ අභියාචන විභාග කිරීම ඒ සමාලෝචන මණ්ඩලයේ කාර්යය විය යුතු අතර, එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් වූ නීති කෘත්‍ය සමාලෝචන මණ්ඩලය වෙත එවැනි යම් අභියාචනයක් ලැබීමේ දින සිට මාස හයක කාලසීමාවක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු ය.

(7) (6) වන උපවගන්තිය යටතේ සමාලෝචන මණ්ඩලයක් වෙත පවරනු ලබන බලය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද මූල මණ්ඩලයේ සාමාජිකයන් අතරින් මූල මණ්ඩලයේ සභාපතිවරයා විසින් තෝරාගනු ලබන තැනැත්තන් තිදෙනෙකුගෙන් එක් එක් සමාලෝචන මණ්ඩලය සමන්විත විය යුතු ය. සභාපතිවරයා විසින් යම් විශේෂිත සමාලෝචන මණ්ඩලයක සාමාජිකයකු ලෙස තමාව ම තෝරා ගනු ලැබිය හැකි ය.

(8) මූල මණ්ඩලයේ සභාපතිවරයා, මේ වගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලබන සමාලෝචන මණ්ඩලයක සාමාජිකයකු වන අවස්ථාවක ඔහු ද, ඔහු සමාලෝචන මණ්ඩලයක සාමාජිකයකු නොවන අවස්ථාවක, සභාපතිවරයා විසින් නම් කරනු ලැබිය හැකි මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු ද, සමාලෝචන මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය.

(9) එක් එක් සමාලෝචන මණ්ඩලයට ලේකම්වරයකු ද පත් කරනු ලැබිය යුතු අතර ඔහු මණ්ඩලය විසින් විභාග කරන ලද සෑම අභියාචනයක් සම්බන්ධයෙන් ම, ඒ අභියාචනයට අදාළ වන්නා වූ සියලු නීති කෘත්‍ය සම්බන්ධ වාර්තාවක් තබා ගත යුතු ය.

(10) සමාලෝචන මණ්ඩලයක් විසින් යම් සාක්ෂිකරුවකු දිවුරුම් පිට විභාග කරනු ලැබිය හැකි අතර, සුදුසු යයි අදහස් කරන්නේ නම් ඒ මණ්ඩලය ඉදිරියේ පෙනී සිටීමට හෝ මණ්ඩලයේ මතය අනුව අදාළ යයි සලකන ලේඛනයක් ඉදිරිපත් කිරීමට යම් තැනැත්තකුට සිතාසි නිකුත් කරනු ලැබිය හැකි ය.

(11) සමාලෝචන මණ්ඩලයක සභාපතිවරයාගේ හෝ ලේකම්වරයාගේ අත්සනින් නිකුත් කරන ලද ලේඛන, දැන්වීම්, හෝ සිතාසි ඒ සමාලෝචන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ ලේඛන, දැන්වීම් හෝ සිතාසි ලෙස සලකනු ලැබිය යුතු ය.

(12) සමාලෝචන මණ්ඩලයක් විසින් සිතාසි නිකුත් කරනු ලැබුවේ හෝ සිතාසි නිකුත් කරනු ලැබ ඇතැයි

සලකනු ලබන්නේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා—

(අ) සිතාසියෙහි සඳහන් කරනු ලැබූ වේලාවේ දී සහ ස්ථානයේ දී සමාලෝචන මණ්ඩලය ඉදිරියේ පෙනී සිටීම සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හැරියහොත් ; හෝ

(ආ) සාධාරණ හේතුවක් නොමැතිව දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම ප්‍රතික්ෂේප කළහොත් හෝ යථා පරිදි දිවුරුම් දීමෙන් හෝ ප්‍රතිඥා දීමෙන් පසුව, සමාලෝචන මණ්ඩලයේ සාමාජිකයකු විසින් ඔහුගෙන් අසනු ලැබූ ඒ මණ්ඩලය විසින් විභාග කොට නිශ්චය කිරීමට ඇති කරුණකට අදාළ ප්‍රශ්නයකට පිළිතුරු දීම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කළහොත් හෝ පැහැර හැරියහොත් හෝ එවැනි යම් ප්‍රශ්නයකට ඕනෑකමින් ම අසත්‍ය පිළිතුරක් ලබා දුන්නහොත් ; හෝ

(ඇ) තමා සන්තකයෙහි තිබෙන්නා වූ සහ ඉදිරිපත් කිරීමට ඔහුට නියම කර ඇති යම් ලේඛනයක් සමාලෝචන මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත්,

මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කිරීමේ දී රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමටකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(13) සමාලෝචන මණ්ඩලයේ රැස්වීම්වල දී ගෙවනු ලැබිය යුතු දීමනා සහ අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

සමාලෝචන මණ්ඩලයේ තීරණය ක්‍රියාත්මක කළ යුත්තේ කුමන අවස්ථාවේ ද යන බව.

42ආ (1) යම් අභියාචනයක් කරනු ලබන යම් පාර්ශවකරුවකු විසින් සමාලෝචන මණ්ඩලයේ තීරණය පිළිබඳ දැන්වීම තමා වෙත ලැබීමෙන් දින තිහක් ඇතුළත ඒ පිළිබඳ වූ සමාලෝචන මණ්ඩලයේ තීරණයට එරෙහිව පළාත්බද මහාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක, සමාලෝචන මණ්ඩලයේ තීරණය බලාත්මක කරනු ලැබිය යුතු ය.

(2) සමාලෝචන මණ්ඩලයේ තීරණය තමා වෙත ලැබීමෙන් දින තිහක් ඇතුළත, එවැනි යම් පාර්ශවකරුවකු විසින් සමාලෝචන මණ්ඩලයේ තීරණයට එරෙහිව පළාත්බද මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ පිළිබඳ වූ පළාත්බද මහාධිකරණයේ තීරණය බලාත්මක කරනු ලැබිය යුතු ය.".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය—

ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(3) කෘෂිකාර්මික ඉඩම් ලේඛනයක ඇතුළත් කුඹුරු ඉඩම් ප්‍රමාණයක අඳ ගොවියකු මිය ගිය හෝ ස්ථිර අබලතාවයට පත් වූ අවස්ථාවක, ඒ ඉඩම් ප්‍රමාණය සම්බන්ධයෙන් අලුත් අඳ ගොවියකුගේ නම ඇතුළත් කිරීමෙන් කෘෂිකාර්මික ඉඩම් ලේඛනය සංශෝධනය කිරීම සඳහා වූ ඉල්ලීමක්, ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය සම්බන්ධයෙන් ඉල්ලුම්කරු අඳ ගොවියා ලෙස ලියාපදිංචි කිරීමට කැමත්ත දෙමින් අයිතිකරුගෙන් ලිපියක් ද සමග කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය. තව ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ පිළිබඳ නියමයක් කරනු ලැබිය යුතු ය:

එසේ වුවද, ඉල්ලුම්කරු මියගිය හෝ ස්ථිර අබලතාවයට පත් වූ අඳ ගොවියාගේ, 1ඇ වගන්තිය හෝ 1ඉ වගන්තිය ප්‍රකාර අනුප්‍රාප්තිකයා බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන පරිදි ඉල්ලුම්කරු විසින් සනාථ කරනු ලැබුවහොත්, අයිතිකරුගේ කැමැත්ත නොතකා කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ නියමය කරනු ලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(3අ) කෘෂිකාර්මික ඉඩම් ලේඛන යථාවත් කිරීමේ අරමුණ ඇතිව, වාර්ෂිකව කුඹුරු ඉඩම්වල අද ගොවියන් සංගණනය කිරීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් පියවර ගනු ලැබිය යුතු ය."; සහ

(3) ඒ වගන්තියේ (8) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්,

මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ "නෙරපීම" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:—

" "පළාත්බද මහාධිකරණය" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව ප්‍රකාරව පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය අදහස් වේ;";

(2) ඒ වගන්තියේ "ව්‍යවස්ථාපිත බදුකරු" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:—

" "ස්ථිර අබලතාවය" යන්නෙන් තැනැත්තකුට අදාළව—

(අ) අත් දෙක ම අහිමි වීම ; හෝ
(ආ) පාද දෙක ම අහිමි වීම ; හෝ
(ඇ) ඇස් දෙකේ ම පෙනීම අහිමි වීම ; හෝ
(ඈ) එක් අතක් සහ එක් පාදයක් අහිමි වීම ; හෝ
(ඉ) එක් පාදයක් සහ එක් ඇසක පෙනීම අහිමි වීම ; හෝ

(ඊ) එක් අතක් සහ එක ඇසක පෙනීම අහිමි වීම ; හෝ

(උ) ශාරීරික අංගභාගය ; හෝ

(ඌ) අයහපත් මානසික තත්ත්වයක් පැවතීම,

අදහස් වේ;".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ "අභියාචනාධිකරණය" යන වචනය යෙදී ඇති සෑම තැනක ම "පළාත්බද මහාධිකරණය" යන වචන යෙදීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන පොදු සංශෝධනය.

17. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

ඇමුණුම - 02

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත

---

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 අගෝස්තු මස 18 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 54.00 යි. තැපැල් ගාස්තුව : රු. 12.25 යි.

## 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 18 වන දින]

එල්. ඩී.— ඕ. 11/98.

**කුඹුරු ඉඩම් හිමියන්ට සහ අඳ ගොවියන්ට අදාළ කාරණා සඳහාත් කෘෂිකාර්මික ප්‍රතිපත්තිවලට අනුකූලව කෘෂිකාර්මික ඉඩම් ප්‍රයෝජනයට ගැනීම සඳහාත් ගොවිජන සංවර්ධන සභා පිහිටුවීම සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස ද ඉඩම් බැංකුවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ගොවිජන විනිශ්චය සභා පිහිටුවීමට විධිවිධාන සැලැස්වීම පිණිස ද 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත ඉවත් කිරීම සඳහා හා ඒ සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව.

අඳ ගොවීන්ගේ අයිතිවාසිකම්වලට ද කෘෂිකාර්මික ඉඩම් කෘෂිකාර්මික නොවන කාර්ය සඳහා පාවිච්චි කරන තැනැත්තන් විෂයෙහි සීමා කිරීම් පැනවීමට ද කෘෂිකාර්මික ඉඩම් කෘෂි පලදාව ලබා ගැනීම සඳහා උපරිම මට්ටමින් යොදා ගනු ලබන බවට වග බලා ගැනීමට ද අදාළ වන ජාතික ප්‍රතිපත්තියක් සැලසුම් කිරීම අවශ්‍යව ඇති හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

### I කොටස

### කුඹුරු ඉඩම් ගොවිතැන් කරන තැනැත්තන්ගේ අයිතිවාසිකම්

අඳ ගොවීන් වගා කරනු ලබන කුඹුරු ඉඩම් අඳ ගොවියන් වෙතම විකිණීමට සැලැස්වීම.

2. (1) අඳ ගොවියකු සිටින්නේ කවර කුඹුරු ඉඩම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ද ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය විකිණීමට අදහස් කරන අයිතිකරු විසින් පළමුවෙන් ම ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය ඒ අඳ ගොවියාට විකිණීමට පිරිනැමිය යුතු ය. ඒ ඉඩම් ප්‍රමාණය විකිණීමට තමා පිරිනමා සිටින මිල සඳහන් කරමින් ඒ පිරිනැමීම අඳ ගොවියා වෙත ලිඛිත දැනුම් දීමක් මගින් කරනු ලැබිය යුතු අතර, ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතු ය. ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය පිහිටා ඇත්තේ යම් ගොවිජන සංවර්ධන සභාවක බල ප්‍රදේශය ඇතුළත ද ඒ සංවර්ධන සභාව වෙත ඒ දැන්වීමේ පිටපතක් ඉඩම් අයිතිකරු විසින් ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

2—PP 012867–20,000 (2000/09)

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැනුම් දීම ලැබීමෙන් පසු, ඉඩම් අයිතිකරු විසින් පිරිනමන ලද මිලට ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය මිල දී ගැනීමට අඳ ගොවියා කැමති නම් ඔහු විසින්, තම කැමැත්ත ඉඩම් අයිතිකරුට සහ ගොවිජන සංවර්ධන සභාවට ලියාපදිංචි තැපැලෙන් යවනු ලැබිය යුතු ලිඛිත දැනුම් දීමක් මගින් දැන්විය යුතු අතර, පැවරීම සම්පූර්ණ කළ යුතු කාල සීමාවක් ඒ සභාව විසින් නියම කළ යුතු ය.

(3) (අ) ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය මිල දී ගැනීමට අඳ ගොවියා කැමති නමුත් ඉඩම් අයිතිකරු විසින් පිරිනමන ලද මිල අධික බව ප්‍රකාශ කරන අවස්ථාවක, ගොවිජන සංවර්ධන සභාව විසින් ඒ කුඹුරු ඉඩම පිහිටි ප්‍රදේශයේ කුඹුරු ඉඩම්වල වෙළෙඳ වටිනාකම පදනම් කරගෙන ඉඩම් අයිතිකරු විමසා, සංවර්ධන සභාවේ මතය අනුව සාධාරණ වන්නා වූ මිලක් නිශ්චය කර, ඒ පැවරීම සම්පූර්ණ කළ යුතු කාල සීමාවක් නියම කිරීමට කටයුතු කළ හැකි ය ;

(ආ) අවස්ථාවෝචිත පරිදි අයිතිකරු විසින් පිරිනමන මිලට හෝ ගොවිජන සංවර්ධන සභාව විසින් නිශ්චය කරනු ලබන මිලට හෝ අඳ ගොවියා විසින් ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය මිල දී ගත යුතු අතර තත් කාර්යය සඳහා නියම කරන ලද කාල සීමාව තුළ දී පැවරීම සම්පූර්ණ කළ යුතු ය.

(4) අඳ ගොවියකු (2) හෝ (3) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලැබ ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව සෑහීමකට පත් වූ අවස්ථාවක ඒ අඳ ගොවියා ඒ කුඹුරු ප්‍රමාණයෙන් අස් කරනු ලැබිය යුතු අතර, එවැනි අස් කිරීමකට 8 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(5) මේ වගන්තියේ විධිවිධාන උල්ලංඝණය කරමින් යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක අයිතිකරුවකු විසින් කරන ලද යම් පැවරීමක් ශුන්‍ය සහ බල රහිත විය යුතු බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව, ප්‍රකාශ කළ යුතු අතර, ඒ පැවරීම යටතේ ඒ ඉඩම් ප්‍රමාණයේ සිටින තැනැත්තා 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව එයින් නෙරපනු ලැබිය හැකි ය.

(6) යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක පැවරීමක් ශුන්‍ය හා බල රහිත බවට (5) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා ප්‍රකාශයට පත් කරනු ලැබූ විටක, ඒ ප්‍රකාශය ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

අඳ ගොවියකුගේ අයිතිවාසිකම් පැවරීම හෝ ආපසු දීම.

**3.** (1) යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක අඳ ගොවියකු විසින් ඒ ඉඩම් ප්‍රමාණය සම්බන්ධයෙන් වූ ඔහුගේ අයිතිවාසිකම් පැවරීමට හෝ ආපසු දීමට ඔහුගේ ඇති අදහස පිළිබඳව ඒ ඉඩම් ප්‍රමාණය පිහිටියේ කවර ගොවි සංවිධානයක සහ ගොවිජන සංවර්ධන සභාවක බල ප්‍රදේශය ඇතුළත ද ඒ ගොවි සංවිධානයට සහ ගොවිජන සංවර්ධන සභාවට ලියාපදිංචි තැපැල් මගින් වූ ලියවිල්ලකින් දැනුම් දීමෙන් පසු ඒ ඉඩම් ප්‍රමාණය සම්බන්ධයෙන් වූ ඔහුගේ ඒ අයිතිවාසිකම් ඒ ඉඩම් ප්‍රමාණයේ අයිතිකරුට හෝ ඉඩම් හිමියාට පැවරීම හෝ ආපසු දීම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම පැවරීමක් හෝ ආපසු දීමක් නොතාරිස්වරයකු ඉදිරියේ ලියා අත්සන් කළ යුතු ය. පැවරීමේ හෝ ආපසු දීමේ සාධන පත්‍රයේ පිටපතක් ඉඩම් හිමියා හෝ ඒ කුඹුරු ඉඩම් කොටසේ අයිතිකරු විසින්, ඒ ඉඩම් කොටස පිහිටියේ කවර ගොවි සංවිධානයක සහ ගොවිජන සංවර්ධන සභාවක බල ප්‍රදේශය ඇතුළත ද ඒ ගොවි සංවිධානයට සහ ගොවිජන සංවර්ධන සභාවට ලියාපදිංචි තැපැල් මගින් දැන්විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

පූජනීය ස්ථානයකට අයත් කුඹුරු ඉඩම් අඳ ගොවීන්ගේ අයිතියෙන් නිදහස් කිරීම.

**4.** (1) මේ පනත පැනවීමෙන් මාස දොළහක් ඇතුළත පූජනීය ස්ථානයක විහාරාධිපති හෝ භාරකරු විසින් ඒ පූජනීය ස්ථානයට අයත් කුඹුරු ඉඩම් වලින් අක්කර දෙකකට වැඩි නොවන ප්‍රමාණයක් 6 වන වගන්තිය අදාළ වීමෙන් නිදහස් කරවා ගැනීම පිණිස කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(2) (අ) ඉන් පසු කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ ඉල්ලීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු සැලැස්විය යුතු අතර, ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයෙහි අඳ ගොවියකු සිටින්නේ නම්, ඒ අඳ ගොවියාට

කරුණු ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් දීමෙන් පසු පමණක් 6 වන වගන්තියේ විධිවිධාන අදාළ වීමෙන් ඒ කුඹුරු ඉඩම් කොටස නිදහස් කරමින් නියමයක් කරනු ලැබිය යුතු ය ;

(ආ) කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයක දී හෝ ඉන් පෙර ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් ඉවත් වන ලෙස අඳ ගොවියාට හෝ අඳ ගොවීන්ට නියම කරනු ලැබිය යුතු ය.

(3) ඒ නියමය අනුව කටයුතු කරමින් කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් ඉවත් වීම අඳ ගොවියා විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, 8 වන වගන්තියේ විධිවිධාන අනුව මහු එයින් නෙරපනු ලැබිය හැකි ය ; එසේ වුව ද, මේ වගන්තිය යටතේ ඔහුට ගෙවිය යුතු යම් වන්දි මුදලක් ඉල්ලුම්කරු විසින් සම්පූර්ණයෙන් ගෙවීමෙන් පසු පමණක් ඒ අඳ ගොවියා නෙරපීම පිණිස කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(4) නියමයේ නිශ්චිතව සඳහන් කරන ලද වන්දි මුදල පිළිගැනීම අඳ ගොවියා විසින් ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, ඒ වන්දි මුදල ඒ කුඹුරු ඉඩම පිහිටියේ කවර ගොවිජන සංවර්ධන සභාවක බල ප්‍රදේශයක් ඇතුළත ද ඒ ගොවිජන සංවර්ධන සභාවෙහි තැන්පත් කළ යුතු ය. නියම කරන ලද දිනයෙහි හෝ ඊට පෙරාතුව හෝ එලෙස තැන්පත් කරන ලද යම් වන්දි මුදලක් අඳ ගොවියා විසින් පිළිගෙන ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ වන්දි මුදල, හිමිකම් ඇති අඳ ගොවියා විසින් කරනු ලබන ඉල්ලීමක් මත ගොවිජන සංවර්ධන සභාව විසින් ඔහු වෙත ගෙවනු ලැබිය යුතු ය.

උපරිම කුඹුරු ප්‍රමාණය තීරණය කෙරෙන නියමය.

5. (1) අඳ ගොවියකු විසින් වගා කළ හැකි උපරිම කුඹුරු ප්‍රමාණය අක්කර පහක් විය යුතු ය. මේ වගන්තියේ කාර්ය සඳහා, අඳ ගොවියකුගේ කලත්‍රයා විසින් හෝ ඒ අඳ ගොවියාගේ වයස අවුරුදු දහ අටට අඩු දරුවකු විසින් වගා කරනු ලබන කුඹුරු ඉඩමක් ඒ අඳ ගොවියා විසින් වගා කරනු ලබන කුඹුරක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, එකී නියමය අදාළ වන යම් දිස්ත්‍රික්කයක් තුළ අඳ ගොවියකු විසින් වගා කළ හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණය (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව තීරණය කළ හැකි ය :

එසේ වුව ද, යම් අඳ ගොවියකු අක්කර පහකට නොඅඩු කුඹුරු ප්‍රමාණයක ඉඩම් හිමි ගොවියකු ද වන බවට නිසි පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන අවස්ථාවක, මේ පනතේ විධිවිධාන යටතේ අඳ ගොවියකු වශයෙන් තමාට ඇති අයිතිවාසිකම්වලට ඒ අඳ ගොවියාට හිමිකම් නොලැබිය යුතු බව කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රකාශ කළ හැකි අතර, ඒ අනුව, (3) වන හා (4)වන උපවගන්තිවල විධිවිධාන ඒ අඳ ගොවියාට අදාළ විය යුතු ය.

(3) අඳ ගොවියකු (2) වන උපවගන්තිය යටතේ වූ නියමයකින් තීරණය කරන ලද කුඹුරු ප්‍රමාණයට වඩා වැඩි කුඹුරු ප්‍රමාණයක සන්තකයෙහි සිටින අවස්ථාවක, වගා කිරීමට තමාට හිමිකම තිබෙන කුඹුරු ප්‍රමාණය තෝරා ගැනීමට ඔහුට හිමිකම තිබිය යුතු අතර ඉතිරි කුඹුරු ප්‍රමාණයෙන් ඉවත් වන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබූ විට එසේ ඉවත් විය යුතු ය.

(4) අඳ ගොවියකු (3) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරියහොත්, (2) වන උපවගන්තිය යටතේ වූ නියමයකින් සඳහන් කරනු ලැබූ ප්‍රමාණයට වඩා වැඩිමනත් කුඹුරු ප්‍රමාණයෙන් ඔහු අස් කරනු ලැබිය යුතු අතර, එවැනි අස් කිරීමකට 8 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(5) අඳ ගොවියා විසින් ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් ඉවත් වූ අවස්ථාවක, ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය ගොවිතැන් කිරීමට ඉඩම් හිමියාට හිමිකම තිබිය යුතු ය.

කුඹුරු ඉඩම් මත බදුකරු අඳ ගොවියකු විය යුතු ලෙස සලකනු ලැබිය යුතු අවස්ථාව.

6. (1) වාචික හෝ ලිඛිත ගිවිසුමක් යටතේ යම් තැනැත්තකු විසින් යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක් බද්දට ගත් විට, ඒ තැනැත්තා විසින් ඒ ඉඩම වගා කරන්නේ නම් සහ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම් මේ පනතේ කාර්ය සඳහා ඔහු ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයෙහි අඳ ගොවියා විය යුතු ය.

(2) වාචික හෝ ලිඛිත ගිවිසුමක් යටතේ කුඹුරු ඉඩම් ප්‍රමාණයක් තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් බදු ගෙන හවුලේ හෝ තට්ටු මාරුවට ඒ ඉඩම් ප්‍රමාණය වගා කරන අවස්ථාවක, ඒ එක් එක් තැනැත්තා ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නම් ඒ කුඹුරු ප්‍රමාණයෙහි තමා ගොවියකු වී සිටින කන්නය හෝ කන්න සඳහා එහි අඳ ගොවියකු විය යුතු ය.

(3) මේ පනත ආරම්භ වීමේ දිනයෙන් පසු කුඹුරු ඉඩම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් නව වාචික හෝ ලිඛිත ගිවිසුමකට ඇතුළත් වූ අවස්ථාවක, ඒ කුඹුරු ඉඩමට (1) වන සහ (2) වන උපවගන්ති අදාළ නොවිය යුතු ය.

(4) අවසර පත්‍රය දරන්නා විසින් ම කුඹුරු ඉඩම් කොටස වගා කළ යුතු ය යන කොන්දේසියට යටත්ව, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් මත යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක් දරමින් සිටින අවසර පත්‍ර හිමියෙක් වන යම් තැනැත්තකු විසින්, දෙන ලද බද්දක් මත ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය වගා කරන්නේ කවර තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා මේ පනතේ අර්ථානුකූලව අඳ ගොවියකු ලෙස සලකනු නොලැබිය යුතු ය.

අඳ ගොවියන්ගේ අයිතිවාසිකම් සහ කුඹුරු වලින් අස් කරනු ලැබූ ඇතැම් අඳ ගොවියන් සම්බන්ධව විධිවිධාන හා කුඹුරුවල අඳ ගොවියන් පත් කිරීම පිළිබඳ සීමාව.

7. (1) යම් කුඹුරු ප්‍රමාණයක් ගොවිතැන් කරන අඳ ගොවියකුට මේ පනතේ විධිවිධාන අනුව ඒ කුඹුරු ප්‍රමාණයට ඇතුළු වීමේ හා භුක්ති විඳීමේ අයිතිවාසිකම තිබිය යුතු ය. ඒ කුඹුරු ප්‍රමාණය අඳ ගොවියාට බදු දී ඇති යම් වාචික හෝ ලිඛිත ගිවිසුමක කුමක් සඳහන් වුව ද, ඔහු ඒ කුඹුරු ප්‍රමාණයෙන් අස් නොකළ යුතු ය. තව ද අඳ ගොවියා ඒ කුඹුරු ප්‍රමාණය භුක්තියට ගෙන වැඩ කිරීමේ දී, කිසිම තැනැත්තකු විසින් එයට බාධා නොකළ යුතු අතර, ඒ කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් මේ පනත යටතේ ඉඩම් හිමියාට ගෙවීමට නියමිත බද්දට වැඩි කිසිම බද්දක් ඉඩම් හිමියා විසින් අඳ ගොවියාගෙන් ඉල්ලීම හෝ භාර ගැනීම නොකළ යුතු ය.

(2) වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත යටතේ යම් තැනැත්තකු විසින් මිලට ගත් හෝ බෙදීම සඳහා වූ තීන්දු ප්‍රකාශයක් යටතේ හවුල් අයිතිකරුවකුට වෙන් කර දෙන ලද, යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියා අවස්ථාවෝචිත විය හැකි පරිදි, ඒ ගැනුම්කරුගේ හෝ ඒ හවුල් අයිතිකරුගේ අඳ ගොවියා ලෙස සැලකිය යුතු අතර, මේ පනතේ විධිවිධාන ඒ පරිද්දෙන් ම අදාළ විය යුතු ය.

(3) යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක අඳ ගොවියකු විසින් තමන් ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් අස් කරනු ලැබ ඇතැයි කොමසාරිස් ජනාරාල්වරයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙන අවස්ථාවක, ඒ කාරණය කොමසාරිස් ජනරාල්වරයා විසින් ගොවිජන විනිශ්චය

සභාව වෙත යොමු කොට ඒ තැනැත්තා අස් කරනු ලැබී ද නොලැබී ද යන ප්‍රශ්නය තීරණය කිරීමේ කාර්යය සඳහා පරීක්ෂණයක් පවත්වන ලෙස ඒ විනිශ්චය සභාවට විධාන කළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් නිවේදනය, එසේ අස් කළ දිනයේ සිට මාස හයක් ඇතුළත කළ යුතු ය.

(5) අඳ ගොවියා අස් කරනු ලැබ ඇති බව ගොවිජන විනිශ්චය සභාව සෑහීමට පත් වන සේ ඒ පරීක්ෂණයේ දී ඔප්පු කරනු ලැබුවහොත්, විරුද්ධ තත්ත්වයක් ඇති බව ඔප්පු කරනු ලැබූ විටක හැර, ඒ අස් කිරීම කරන ලද්දේ ඉඩම් හිමියා විසින් හෝ ඔහුගේ උවමනාව පරිදි බව පූර්ව නිගමනය කළ යුතු ය.

(6) ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියාට සහ අස් කරනු ලැබූ තැනැත්තාට පෞද්ගලික හෝ නියෝජිතයකුගේ මාර්ගයෙන් ගොවිජන විනිශ්චය සභාව විසින් පවත්වනු ලබන ඒ පරීක්ෂණයේ දී කරුණු දක්වා සිටීමේ අවස්ථාවක් ලබා දිය යුතු ය. ඒ පරීක්ෂණයෙන් පසුව ගොවිජන විනිශ්චය සභාවේ තීරණය, කොමසාරිස් ජනරාල්වරයා වෙත ද, ඉඩම් හිමියා වෙත සහ අස් කරනු ලැබූ තැනැත්තා වෙත ලියාපදිංචි තැපැල් මගින් වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. ඒ තීරණයෙන්, ඉඩම් හිමියා හෝ අස් කරනු ලැබූ තැනැත්තා අතෘප්තියට පත් වූයේ නම්, ඉඩම් හිමියා හෝ අස් කරනු ලැබූ තැනැත්තා වෙත ඒ නිවේදනය කරනු ලැබීමෙන් පසු දින තිහක් ඇතුළත ඒ තීරණයට විරුද්ධව අනෙක් තැනැත්තා වගඋත්තරකරු ලෙස සඳහන් කොට, අභියාචනාධිකරණය වෙත නීති පිළිබඳ ප්‍රශ්නයක් මත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. පෙත්සමේ පිටපතක්, එම අභියාචනය කරන අවස්ථාවේ දී ම කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතු ය. ඉඩ දෙනු ලැබූ කාලය ඇතුළත ඒ තීරණයට විරුද්ධව අභියාචනයක් කරනු නොලැබූ අවස්ථාවක, ඒ තීරණය අවසාන හා තීරණාත්මක විය යුතු ය.

(7) (3) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ යම් පරීක්ෂණයක දී :—

(අ) අස් කිරීම තහවුරු වී ඇති බව ගොවිජන විනිශ්චය සභාව විසින් තීරණය කරන ලදුව, ඒ තීරණයට විරුද්ධව අභියාචනයක් කිරීමට දී ඇති කාල සීමාව ඇතුළත අභියාචනයක් කර නොමැති අවස්ථාවක හෝ අස්කිරීම

තහවුරු වී ඇති බවට වූ ගොවිජන විනිශ්චය සභාවේ තීරණය අභියාචනාධිකරණය විසින් ස්ථිර කරනු ලැබ ඇති අවස්ථාවක ; හෝ

(ආ) අස් කිරීම තහවුරු වී නොමැති බව ගොවිජන විනිශ්චය සභාව විසින් තීරණය කරන ලදුව, අභියාචනයේ දී අභියාචනාධිකරණය විසින් ගොවිජන විනිශ්චය සභාවේ තීරණය වෙනස් කර අස් කිරීම තහවුරු වී ඇතැයි තීරණය කළ අවස්ථාවක—

(i) අස් කරනු ලැබූ තැනැත්තාට, ඒ කුඹුරු ප්‍රමාණයෙහි ප්‍රයෝජනය සහ බුක්තිය ආපසු ලැබීමට හිමිකම තිබිය යුතු ය ; තව ද

(ii) අවස්ථාවෝචිත පරිදි ගොවිජන විනිශ්චය සභාවේ හෝ අභියාචනාධිකරණයේ තීරණය තමාට ලැබුණු විට, කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිත නියමයක් මගින් එහි නිශ්චිතව සඳහන් දිනයක හෝ ඉන් පෙර ඒ කුඹුරු ප්‍රමාණය භුක්තියට ගෙන සිටින සෑම තැනැත්තකු ම එයින් ඉවත් විය යුතු යයි නියම කළ යුතු ය. ඒ තැනැත්තා ඒ නියමය පිළිපැදීම පැහැර හැරියහොත් 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඔහු ඒ කුඹුරු ප්‍රමාණයෙන් අස්කරනු ලැබිය යුතු ය ; තව ද

(iii) (1) වන අනුඡේදයේ සඳහන් තැනැත්තා අස් කරන ලද්දේ ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියාගේ දැනුම, කැමැත්ත හෝ ගුප්තානුකූලතාව නොමැති බව ගොවිජන විනිශ්චය සභාව විසින් හෝ අභියාචනාධිකරණය විසින් හෝ තීරණය කර ඇත්නම් මිස, නියමයක් කරනු ලැබ ඇත්තේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා විසින් නියමයේ නිශ්චිතව සඳහන් දිනයට පසුව ඒ ඉඩම් ප්‍රමාණය බුක්ති විඳීම දිගට ම කර ගෙන යන කාලය තුළ එක් එක් දිනයක් සඳහා නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයත් අනුව, ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියා විසින්, ඒ තැනැත්තාට අලාභ ගෙවිය යුතු ය:

එසේ වුව ද, මේ අනුඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති කාල සීමාව තුළ ඒ කුඹුරු ප්‍රමාණයෙන් 27 වන වගන්තිය යටතේ වගා කරනු ලබන යම් කොටසක් වෙනුවෙන් කිසි අලාභයක් නොගෙවිය යුතු ය.

(8) (7)වන උපවගන්තිය යටතේ අලාභ වශයෙන් ගෙවිය යුතු යයි කුඹුරු ප්‍රමාණයක ඉඩම් හිමියකුට නියම කරනු ලැබූ යම් මුදලක් එය ඉල්ලා සිටි දිනයෙන් පසු දින දහහතරක් ඇතුළත ගෙවීම ඔහු විසින් පැහැර හරිනු ලබන හෝ ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, ඒ කුඹුරු ප්‍රමාණය පිහිටි ස්ථානය විෂයෙහි අධිකරණ බලය දරන මහෙස්ත්‍රාත් අධිකරණය වෙත අස් කරනු ලැබූ තැනැත්තා විසින් ඉල්ලීමක් කරනු ලැබීමෙන්, ඒ මුදල ඒ අධිකරණය විසින් සිය සාමාන්‍ය අධිකරණ බලතල ක්‍රියාවෙහි යෙදවීමේ දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණයට වැඩි වුව ද, ඒ අධිකරණය විසින් නියම කරනු ලැබූ දඩයක ආකාරයෙන් අය කර ගත හැකි ය.

(9) නියමයේ නිශ්චිතව සඳහන් මුදල ඉඩම් හිමියාගෙන් අය විය යුතු බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද නියමයක් (8) වන උපවගන්තියේ කාර්ය සඳහා, ඒ මුදල අය විය යුතු බවට සාක්ෂි විය යුතු ය.

(10) (මින් මතු මේ උපවගන්තියේ "බද්ද දෙන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකු (මින් මතු මේ උපවගන්තියේ "බද්ද ගන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකුට කිසියම් කුඹුරු ප්‍රමාණයක් බද්දට දුන් විට, ඒ බද්ද ගන්නා එය වගා කරන්නා නොවීමේ හේතුවෙන් එහි අඳ ගොවියා නොවන කල්හි, ඔහු ඒ කුඹුරු ප්‍රමාණය (මින් මතු මේ උපවගන්තියේ "අතුරු අඳ ගොවියා" ලෙස සඳහන් කරනු ලබන) අන් තැනැත්තකුට බද්දට දී ඒ අතුරු අඳ ගොවියා එහි වගා කරන්නා වීමේ හේතුවෙන් එහි අඳ ගොවියා බවට පත් වුවහොත් බද්ද දෙන්නා විසින් බද්ද ගන්නාට දුන් බද්ද අවසානවීම, අතුරු අඳ ගොවියාට එම කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියා වශයෙන් ඇති අයිතිවාසිකම් කෙරෙහි කිසිම අයුරකින් බල නොපෑ යුතු ය :

එසේ වුව ද බද්ද ගන්නා විසින් :—

(අ) ඒ කුඹුරු ප්‍රමාණයේ අයිතිකරුගේ කැමැත්ත ලියවිල්ලකින් ලබා ගන්නේ නම් ; සහ

(ආ) ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් පිහිටියේ යම් ගොවිජන සංවර්ධන සභාවක බල ප්‍රදේශය ඇතුළත ද ඒ ගොවිජන සංවර්ධන සභාවට ඉන් පසු දැනුම් දෙන්නේ නම්,

මිස අතුරු අඳ ගොවියකුට ඒ කුඹුරු ප්‍රමාණය බද්දට නොදිය යුතු ය :

එසේ ම තව දුරටත්, යම් කුඹුරු ප්‍රමාණයක බද්ද ගැනුම්කරුවකු විසින්, ඒ කුඹුරු ප්‍රමාණයේ අයිතිකරුගෙන් ලිඛිත කැමැත්ත ලබා නොගෙන, අතුරු අඳ ගොවියකුට බද්ද දෙනු ලැබ ඇති අවස්ථාවක, ඒ කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් අඳ ගොවි අයිතිවාසිකමක් ලැබීමට අතුරු අඳ ගොවියාට හිමිකම නොමැති විය යුතු ය. කොමසාරිස් ජනරාල්වරයා විසින්, පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව ලියවිල්ලකින් වූ නියමයක් මගින්, ඒ නියමයේ නිශ්චය කොට දැක්වෙන දිනයක දී හෝ ඊට පෙර ඒ කුඹුරු ප්‍රමාණයෙන් ඉවත් වන ලෙස අතුරු අඳ ගොවියාට නියම කළ යුතු අතර; ඒ නියමය අනුව ක්‍රියා කිරීම අතුරු අඳ ගොවියා විසින් පැහැර හරිනු ලැබුවහොත් 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඔහු ඒ කුඹුරු ප්‍රමාණයෙන් අස් කළ යුතු අතර, ඒ කුඹුරු ප්‍රමාණය වගා කිරීමට කුඹුරු හිමියාට හිමිකම් තිබිය යුතු ය.

(11) යම් කුඹුරු ප්‍රමාණයක් පිළිබඳව ඉඩම් හිමියා සතු අයිතිවාසිකම්, හිමිකම හා සම්බන්ධතාව තෑගි කිරීම, අන්තිම කැමති පත්‍රයක් මගින් වෙන් කර දීම, හෝ බැහැර කිරීම, ප්‍රවේණි නීතිය යටතේ උරුම වීම නැතහොත් (ස්වේච්ඡාවෙන් හෝ අධිකරණයක තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීම අනුව කෙරෙන) විකිණීම ඒ කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියා සතු අයිතිවාසිකම්වලට කිසි ලෙසකින් බල නොපාන්නේ ය.

(12) යම් කුඹුරු ප්‍රමාණයකට ඇතුළු වී භුක්ති විඳීම පිළිබඳව අඳ ගොවියා සතු අයිතිවාසිකම් අධිකරණයක තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් පරිදි තහනම් කිරීම, අල්ලා ගැනීම හෝ විකිණීම නොකළ යුතු ය.

(13) (1988 අංක 79 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය) (සංශෝධන) පනතින් ඇතුළත් කරන ලද) සිවිල් නඩු විධාන සංග්‍රහයේ LXVI පරිච්ඡේදයේ සඳහන් කිසිවකින් මේ පනතේ අර්ථානුකූලව කුඹුරු ඉඩම්වලට බලපාන ආරාවුලක් සම්බන්ධයෙන් ඉහත කී පරිච්ඡේදය යටතේ පරීක්ෂණයක් පැවැත්වීමට හෝ යම් ආඥාවක් කිරීමට වූලායවන අධිකරණයක විනිශ්චයකාරවරයකුට බලය පැවරෙන්නේ යයි අදහස් නොවිය යුතු ය ; නැතහොත් තේරුම් නොගත යුතු ය.

(14) යම් පනතකින් හෝ මේ පනත යටතේ යම් කුඹුරු ප්‍රමාණයක් අඳ ගොවියකුට පැවරුණු යම් අයිතිවාසිකමක් හෝ වරප්‍රසාදයක් ක්‍රියාවෙහි යෙදීමෙන් වැළකී සිටීමට ඔහු පෙළඹවීමට, ඔහුට බල කිරීම හෝ ඔහු ඊට කැමති කරවා ගැනීම පිණිස යම්

තැනැත්තකු ඒ අඳ ගොවියා කෙරෙහි හෝ ඔහුට විරුද්ධව, නියම වශයෙන් හෝ අනියම් වශයෙන්, යම් බලහත්කාරකමක්, හැඟැසිකමක් හෝ අවහිරයක් කළහොත් හෝ කරන බවට තර්ජනය කළහොත් හෝ යම් හානියක්, අලාභයක් හෝ පාඩුවක් සිදු කළහොත් හෝ කරන බවට තර්ජනය කළහොත් ඒ අඳ ගොවියා විසින් ඒ කුඹුරු ප්‍රමාණයට ඇතුළු වීමෙහි හා භුක්ති විඳීමෙහි ලා ඔහුට ඒ තැනැත්තා බාධා පමුණුවන ලෙස සැලකිය යුතු ය.

(15) යම් තැනැත්තකු මේ වගන්තියේ විධිවිධාන කඩ කරන්නේ නම් ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

8. (1) යම් කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයක් හැර යන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ පනත යටතේ නියමයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තකු ඒ නියමය අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක– *අස්කිරීමේ කාර්ය පටිපාටිය.*

(අ) ඒ නියමය අදාළ වන ඉඩම් ප්‍රමාණය විස්තර කරමින්, ඒ නියමයෙහි ස්වභාවය සහ එය නිකුත් කරනු ලැබූ තැනැත්තා කවරකු ද යන වග දැක්වෙන්නා වූ ;

(ආ) එම ඉඩම් ප්‍රමාණය හැර යාමට නියෝග කරනු ලැබ, එය පැහැර හැර ඇති තැනැත්තා සඳහන් කෙරෙන්නා වූ ; සහ

(ඇ) ඒ තැනැත්තා සහ ඒ ඉඩම් ප්‍රමාණයෙහි රැඳී සිටින අන් සියලුම තැනැත්තන් ඒ ඉඩම් ප්‍රමාණයෙන් අස් කිරීම පිණිස නියමයක් නිකුත් කරන ලෙස ඉල්ලුම් කෙරෙන්නා වූ ද, ඒ ඉඩම් ප්‍රමාණයේ සන්තකය භාර දිය යුතු තැනැත්තාගේ නම සඳහන් කෙරෙන්නා වූ ද,

ලිඛිත වාර්තාවක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නැතහොත් ඒ සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙනු ලබන යම් තැනැත්තකු විසින්, ඒ ඉඩම් ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක දී ඒ වාර්තාවෙහි නිශ්චිත තැනැත්තා සහ ඒ නියමයෙහි නිශ්චිත ඉඩම් ප්‍රමාණය බුක්තියට ගෙන සිටින සෙසු සියලු ම තැනැත්තන් වහාම අස් කොට ඒ ප්‍රමාණයේ සන්තකය භාර දිය යුතු තැනැත්තා ලෙස ඒ වාර්තාවේ සඳහන් තැනැත්තා වෙත ඒ ප්‍රමාණයේ සන්තකය භාර දෙන ලෙස ඒ අධිකරණය විසින් පිස්කල්ට හෝ සාම නිලධරයාට විධාන කළ යුතු ය.

(3) අස් කිරීමේ ආඥාව ක්‍රියාවේ යෙදවීමට භාර දෙනු ලැබූ පිස්කල් විසින් හෝ සාම නිලධරයා විසින් හෝ ඒ ආඥාව නිකුත් කළ මහේස්ත්‍රාත් අධිකරණයෙහි නියමයන් අනුව ක්‍රියා කළ යුතු අතර, තමා ඒ ආඥාව ක්‍රියාවේ යෙදූ ආකාරය පිළිබඳව යථා පරිදි අධිකරණය වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(4) අස් කිරීමේ නියමය ක්‍රියාවෙහි යෙදවීමේ දී පිස්කල් හෝ සාම නිලධරයා විසින් නැතහොත් ඔවුන් අතුරින් කවරකු විසින් වුව ද බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින්, ඒ ආඥාව අදාළ වන කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයට ඇතුළු වීම සඳහා ද ආඥාව නිකුත් කළ මහේස්ත්‍රාත් අධිකරණයෙහි නියමයන් අනුව ආඥාවෙන් බැඳී සිටින යම් තැනැත්තකු අස් කිරීම සඳහා ද ඒ ප්‍රමාණයේ සන්තකය භාර දීම සඳහා ද අවශ්‍ය විය හැකි බලය යෙදිය හැකි ය.

(5) (3) වන උපවගන්තිය යටතේ කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයක සන්තකයෙහි පිහිටුවන ලද යම් තැනැත්තකු නීති විරෝධී ලෙස අසන්තක කරන ලද යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය. යම් තැනැත්තකු එලෙස අසන්තක කරනු ලැබ ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් තත් කාරණය පිළිබඳ සාක්ෂියක් විය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ වූ වරදක් සඳහා වරදකරු කරනු ලැබූ විට, ඒ ඉඩම් ප්‍රමාණයෙන් නීති විරෝධී ලෙස අසන්තක කරනු ලැබූ ඒ තැනැත්තාට, ඒ ඉඩම් ප්‍රමාණය බුක්ති විඳින වෙනයම් තැනැත්තකු අස් කිරීමෙන් එම ඉඩම් ප්‍රමාණයේ සන්තකය භාර දෙන ලෙස මහේස්ත්‍රාත්වරයා පිස්කල්ට විධාන කරනු ලැබිය යුතු ය.

කොමසාරිස් ජනරාල් විසින් බද්ද නිශ්චය කළ යුතු බව.

9. (1) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියා විසින් ගෙවිය යුතු බද්ද, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ වගන්තියේ විධිවිධාන අනුව කලින් කල නිශ්චය කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයෙන්, එම නිශ්චය බලපාන ප්‍රදේශයේ පිහිටි යම් කුඹුරු ප්‍රමාණයක වගා කළ එක් එක් කුඹුරු අක්කරයකින් වී බුසල් දහයකට නොඅඩු ගණනක් හෝ එම කුඹුරු ප්‍රමාණයෙන් උපදවන මුළු අස්වැන්නෙන් මේ පනත යටතේ නියමිත අය කිරීමේ ප්‍රමාණය අඩු කළ විට, ඉතිරි කොටසෙන් හතරෙන් එක් පංගුවකට නොඅඩු කොටසක් හෝ යන දෙකෙන් වඩා වැඩි ප්‍රමාණය ඒ කුඹුරු ප්‍රමාණය ගොවිතැන් කරන එක් එක් කන්නය සඳහා ගෙවිය යුතු බද්ද වශයෙන් නියම කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිශ්චය කරන බද්ද විවිධ පරිපාලන දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් හෝ පරිපාලන දිස්ත්‍රික්කයක විවිධ කොටස් සම්බන්ධයෙන් වෙනස් විය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ නිශ්චිත බද්ද, ගොවිතැන් කළ එක් එක් අක්කරයක් සඳහා නියමිත වී බුසල් හෝ කිලෝ ගණන අනුව ගණන් බලනු ලබන විට, ගොවිතැන් කරන ලද අක්කරයකට අඩු බිම් ප්‍රමාණයක් සඳහා වූ බද්ද, ඒ බිම් ප්‍රමාණයත් අක්කරයත් අතර ඇති අනුපාතය අනුව ගණන් බැලිය යුතු ය.

(5) යම් කුඹුරු ප්‍රමාණයක් සඳහා එක් එක් කන්නයේ දී ගෙවිය යුතු බද්ද-

(අ) මේ වගන්තියේ ඉහත කී විධිවිධාන යටතේ බලපවත්වන එවැනි නිශ්චය අනුව එම කුඹුරු ප්‍රමාණය පිහිටි ප්‍රදේශයේ කුඹුරු කෙරෙහි අදාළ වන ආකාරයෙන් එම කුඹුරු ප්‍රමාණයට ගණන් ගත් වී ප්‍රමාණය ; හෝ

(ආ) එකී කුඹුරෙන් නිපද වූ වර්ගයේ ම වී සඳහා මේ පනතේ විධිවිධානවලට අනුකූලව තත් කාලයේ නියමිත මිල අනුව ගණන් බැලූ විට මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ වී වලින් ගෙවිය යුතු බද්දට සමාන මුදල,

විය යුතු ය.

(6) යම් කුඹුරු ප්‍රමාණයක් ගොවිතැන් කළ හැකිව තිබියදීත් යම් කන්නයක, ඒ කුඹුරු ප්‍රමාණය ගොවිතැන් කිරීම එහි අඳ ගොවියා විසින් හිතාමතා ම නොසලකා හැර ඇතැයි හෝ වී ගොවිතැන් කරන යම් කන්නයක දී සැහෙන හේතුවක් නොමැතිව ගොවිතැන් කිරීමට අදාළ යම් සම්මත චාරිත්‍රයක් කඩ කර ඇතැයි කොමසාරිස් ජනරාල්වරයා විසින් පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව පැහිමට පත් වූ විට, එම කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන යටතේ ඒ කන්නය සඳහා වී වලින් ගෙවිය යුතු බද්ද ඒ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරන පදනම මත ගණන් බැලිය යුතු යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කළ හැකි අතර, එසේ ගණන් බලන ලද වී වලින් ගෙවිය යුතු බද්ද අනුව මුදලින් ගෙවිය යුතු බද්ද ගණන් බැලිය යුතු ය.

(7) අඳ ගොවියකු වගා කල කුඹුරු ප්‍රමාණයක්, වී ගොවිතැන් කරන යම් කන්නයක දී ඔහුගේ වරදින් හෝ නොසැලකිල්ලකින් නොව, අන් කිසි හේතුවක් නිසා තරමක් දුරට පාළු වී නම්, එම කුඹුරු ප්‍රමාණය වෙනුවෙන් ඔහු විසින් ඒ කන්නය සඳහා ගෙවිය යුතු බද්ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරන සාධාරණ ප්‍රමාණයකින් අඩු කළ යුතු ය.

(8) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියා සහ ඔහුගේ ඉඩම් හිමියා අතර, ඒ කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ කරන ලද නිශ්චය කිරීමක් යටතේ ගෙවිය යුතු බදු මුදල පිළිබඳව යම් ආරාවුලක් ඇති වූ විට, ඒ පිළිබඳව තීරණයක් කිරීම සඳහා ඒ ආරාවුල කොමසාරිස් ජනරාල්වරයා වෙත යොමු කළ හැකි ය. ඒ ආරාවුල සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය ඒ අඳ ගොවියාට සහ ඔහුගේ ඉඩම් හිමියාට ලියාපදිංචි තැපැල් මගින් වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

අඳ ගොවියා විසින් බද්ද ගෙවීම පැහැර හරිනු ලැබූ විට ඇති වන ප්‍රතිඵලය.

10. (1) යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීම අඳ ගොවියා විසින් හිඟ තබා ඇති බව ඉඩම් හිමියා, කොමසාරිස් ජනරාල්වරයාට දන්වා සිටි විට, ඒ කාරණය සම්බන්ධයෙන් ගොවිජන විනිශ්චය සභාව ලවා පරීක්ෂණයක් පැවැත්වීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් සැලැස්විය යුතු අතර, ඒ පරීක්ෂණයෙන් පසු බද්ද හිඟ තබා ඇති බව හා හිඟ තබා ඇති බද්දේ ප්‍රමාණය ගොවිජන විනිශ්චය සභාව විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, එහි තීරණය එය විසින් අඳ ගොවියා වෙත ද ඉඩම් හිමියා වෙත සහ කොමසාරිස් ජනරාල්වරයා වෙත ද ලියාපදිංචි තැපැල් මගින් වූ ලියවිල්ලකින් දැන්විය යුතු ය.

(2) ඒ තීරණය පිළිබඳ දැන්වීම ලැබුණු පසු කොමසාරිස් ජනරාල්වරයා විසින්, අඳ ගොවියා වෙත ලිඛිත දැනුම්දීමක් කර නිශ්චිතව සඳහන් කාලය තුළ දී ඒ හිඟ වී හෝ මුදල ගෙවීම අඳ ගොවියා විසින් පැහැර හරින්නේ නම් ඒ ඉඩම් ප්‍රමාණය සම්බන්ධයෙන් වූ මහුගේ අඳය අවසාන වන බව, අඳ ගොවියා වෙත ලියවිල්ලකින් දන්වා සිටිය යුතු ය.

(3) හිඟ බද්ද ගෙවීමට නියමිත කාලය තුළ දී එය ගෙවීම පැහැර හරින අඳ ගොවියකුට, ඔහුගේ අඳය අහිමි වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ කුඹුරු ප්‍රමාණයෙන් ඉවත්ව යන ලෙස නියෝග කරනු ලැබූ කල්හි එසේ ඉවත්ව යා යුතු ය.

(4) දැන්වීමෙහි සඳහන් කරනු ලැබූ කාලය ඇතුළත එම කුඹුරු ප්‍රමාණයෙන් ඉවත්ව යාමට අඳ ගොවියා පැහැර හැරියහොත් 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව එම කුඹුරු ප්‍රමාණයෙන් අඳ ගොවියා අස් කිරීමට කොමසාරිස් ජනරාල්වරයා කටයුතු සැලැස්විය යුතු ය.

(5) මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව අඳ ගොවියකුගේ අඳ අයිතිවාසිකම් අවසාන කරනු ලැබූ විට, ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයේ සන්තකය ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයේ අයිතිකරුට හෝ ඊට හිමිකම් ඇති තැනැත්තාට හෝ ඒ ඉඩම් ප්‍රමාණය අයිතිය සම්බන්ධයෙන් ආරාවුලක් ඇති අවස්ථාවක, ඒ ඉඩම් ප්‍රමාණය පිහිටි ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන සභාව වෙත භාර දෙනු ලැබිය යුතු ය.

බද්ද නොගෙවිය යුතු අවස්ථා.

**11.** අඳ ගොවියකුගේ කුඹුරු ප්‍රමාණය වී ගොවිතැන් කරන යම් කන්නයක දී ඔහුගේ වරදකින් හෝ නොසැලකිල්ලකින් නොව, අන් කිසි හේතුවක් නිසා වගා නොකරන ලද නම් හෝ එම කන්නය තුළ ඒ කුඹුරු ප්‍රමාණයේ කළ වගාව සහමුලින්ම පාළු වී නම්, ඒ කුඹුරු ප්‍රමාණය වෙනුවෙන් එම කන්නය සඳහා බද්දක් නොගෙවිය යුතු ය.

බද්ද ගෙවිය යුතු කාලය ස්ථානය සහ බද්ද හිඟවීම ආරම්භවීම.

**12.** වී ගොවිතැන් කරන යම් කන්නයක් සඳහා ගෙවිය යුතු බද්ද එම කන්නයේ දී එම කුඹුරු ප්‍රමාණයෙන් අස්වැන්න ලබා ගැනීමෙන් අනතුරුව පසළොස්වක දිනයේ හෝ ඊට පෙර කමතේ දී ගෙවිය යුතු ය. එසේ නොගෙව්වොත් එකී පසළොස්වක දිනයට පසු පළමු වන දිනයේ පටන් බද්ද හිඟ වීමට පටන් ගන්නේ ය.

ගොයම් කපා පාගා ගැනීමේ සහ ඉවත් කර ගැනීමේ දින අඳ ගොවියා විසින් ඉඩම් හිමියාට දැන්විය යුතු බව.

**13.** (1) යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් තම ඉඩම් හිමියා සහ ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන සභාව වෙත–

(අ) ඒ කුඹුරු ප්‍රමාණයේ අස්වැන්න කපා පාගා ගැනීම ආරම්භ කිරීමට අදහස් කරන දිනයට යටත් පිරිසෙයින් දින දහයක් කල් ඇතිව දැන්වීම ; සහ

(ආ) කුඹුරු ප්‍රමාණයෙන් කපා පාගා ගන්නා ලද අස්වැන්න කමතෙන් ඉවත් කර ගැනීමට අදහස් කරන දිනය යටත් පිරිසෙයින් දින හතක් කල් ඇතිව දැන්වීම,

ඒ කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියාගේ කාර්යය විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදයේ විධිවිධානවලට අනුකූල වීම පැහැර හරින යම් අඳ ගොවියකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

බද්ද ගෙවිය යුත්තේ කාට ද යන බව.

**14.** (1) යම් කුඹුරු ප්‍රමාණයක් සඳහා බද්ද එහි අඳ ගොවියා විසින් එම කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියාට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයාට කෙලින් ම හෝ ඒ බද්ද භාර ගැනීම ඒ ඉඩම් හිමියා පැහැර හරින නැතහොත් ප්‍රතික්ෂේප කරන අවස්ථාවක ගොවිජන සංවර්ධන සභාව මාර්ගයෙන් හෝ ගෙවිය යුතු ය.

(2) යම් කුඹුරු ප්‍රමාණයක අයිතිකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් වූ විට, එම කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියාගෙන් බද්ද අය කර ගැනීම සඳහා ඔවුන් විසින් එක් තැනැත්තකු පත් කළ යුතු අතර, ඒ සඳහා පත් කළ තැනැත්තාගේ නම සහ ලිපිනය ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශය විෂයෙහි බලය ඇති ගොවිජන සංවර්ධන සභාව වෙත ලියාපදිංචි තැපැල් මගින් වූ ලියවිල්ලකින් දන්වා යැවිය යුතු ය. එසේ දැන්වීමක් නොකළ කල්හි, එම බද්ද එම කුඹුරු හිමියන් වෙනුවෙන් සිරිත් පරිදි එවැනි බද්ද අය කරන යම් තැනැත්තකු වේනොත්, ඒ තැනැත්තාට කෙලින් ම හෝ එකී සංවර්ධන සභාව එහින් හෝ ගෙවිය යුතු ය.

(3) ඒ බද්ද එකතු කිරීමට හිමිකම් ඇති තැනැත්තකු නොමැති නම් හෝ ඒ බද්ද එක් එක් ඉඩම් හිමියාට කවර අනුපාතයක් අනුව ගෙවිය යුතු ද යන්න පිළිබඳව හෝ ඒ බද්ද ගෙවනු ලැබිය යුතු තැනැත්තා පිළිබඳව යම් ආරාවුලක් ඇති වුවහොත් මේ

පනතේ විධිවිධාන අනුව මුදලින් ගණන් බලන ලද ඒ බද්ද ඒ අඳ ගොවියා විසින් ඒ සංවර්ධන සභාවට ගෙවිය යුතු අතර, ඒ සංවර්ධන සභාව විසින් එය ලබා ගැනීම පිණිස ඒ බද්ද ගැන ක්‍රියා කිරීමේ දී ඒ සංවර්ධන සභාව විසින් දරන ලද වියදම එයින් අඩු කොට එය ලබා ගැනීමට හිමිකම් ඇති තැනැත්තා හෝ තැනැත්තන් විසින් ලබා ගැනීමට ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය දරන නිසි අධිකරණයට ගෙවිය යුතු ය.

(4) (3) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ ප්‍රමාණය, ඊට හිමිකම් ඇති තැනැත්තා හෝ තැනැත්තන් විසින්, ඒ මුදල ඒ අධිකරණයට ගෙවනු ලැබූ දිනයෙන් පසු අවුරුද්දක් ඇතුළත ලබා නොගත් අවස්ථාවක, ඒ අධිකරණය විසින් ඒ මුදල ගොවිජන සංවර්ධන අරමුදලට ගෙවීමට සැලැස්විය යුතු අතර, ඒ මුදල් ප්‍රමාණය ඉන් පසු ඉල්ලා සිටීමට හෝ භාර ගැනීමට කිසිම තැනැත්තකුට හිමිකම් නොතිබිය යුතු ය.

ගොවිජන සංවර්ධන සභාව මගින් ඉඩම් හිමියාට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට බද්ද ගෙවන අවස්ථාවේ දී අදාළ විය යුතු විධිවිධාන.

15. (1) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු විසින් ඒ කුඹුරු ප්‍රමාණයෙහි බද්ද ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියාට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයාට ගෙවීම වෙනුවට, ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශය විෂයෙහි බලය ඇති ගොවිජන සංවර්ධන සභාවට ගෙවනු ලබන අවස්ථාවක, ඒ කාරක සභාව විසින්,

(අ) ඒ බද්ද මුදලින් ගෙවනු ලැබුවේ නම්, ඒ බදු මුදල් ප්‍රමාණය, අවස්ථාවෝචිත පරිදි ඒ ඉඩම් හිමියා වෙත හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයා වෙත යැවීමට, නැතහොත් ;

(ආ) ඒ බද්ද වී වලින් ගෙවනු ලැබුවේ නම්, දැන්වීමේ දිනයෙන් පසු දින තිහක් ඇතුළත ඒ බද්ද භාර ගන්නා මෙන් අවස්ථාවෝචිත පරිදි ඒ ඉඩම් හිමියා වෙත හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයා වෙත ලියාපදිංචි තැපැල් මගින් ලිඛිත දැන්වීමක් යැවීමට ; සහ

(ඇ) ඒ බද්ද පිළිබඳව ක්‍රියා කිරීමේ දී ඒ සංවර්ධන සභාව විසින් දරන්නට සිදු වූ යම් වියදම ඒ බද්දෙන් අඩු කර ගැනීමට ද,

සැලැස්විය යුතු ය.

(2) යම් කුඹුරු ප්‍රමාණයක් සඳහා වූ බද්ද ගොවිජන සංවර්ධන සභාවට වී වලින් ගෙවා ඇති අවස්ථාවක එයට හිමිකම් ඇති තැනැත්තා වෙත යවනු ලැබූ (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමෙහි දිනයෙන් පසු දින තිහක් ඇතුළත ඔහු එය ඉල්ලා සිටීම පල තැනැත්තා වූ අවස්ථාවක, ඒ ගොවිජන සංවර්ධන සභාව විසින් ඒ වී විකුණා ඒ විකිණීමෙන් ලැබෙන මුදල ඒ තැනැත්තා වෙත යැවීමට සැලැස්විය යුතු ය.

(3) ගොවිජන සංවර්ධන සභාව විසින් මේ වගන්තිය යටතේ යම් තැනැත්තකුට (මුදල් ඇණවුමකින් හෝ තැපැල් ඇණවුමකින් නොවන අන් ලෙසකින්) යවනු ලැබූ යම් මුදලකට, ඒ මුදල යවනු ලැබූ දිනයෙන් පසු අවුරුද්දක් ඇතුළත ඒ තැනැත්තා විසින් හිමිකම් කියා නොසිටි අවස්ථාවක ඒ මුදල ඒ සංවර්ධන සභාව විසින් ගොවිජන සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ය. ඒ මුදල හෝ ඒ මුදල යම් බද්දක් වෙනුවෙන් වූ විට ඒ බද්ද හෝ ඉල්ලා සිටීමට හෝ බාර ගැනීමට ඉන් පසු කිසිම තැනැත්තකුට හිමිකම් නොතිබිය යුතු ය.

ගෙවූ බද්ද සඳහා කුවිතාන්සියක් දිය යුතු බව.

**16.** (1) යම් කුඹුරු ප්‍රමාණයක් සඳහා බදු එකතු කිරීමට අයිතිය ඇති තැනැත්තකු බද්ද බාර ගත් කල්හි එම බද්ද ගෙවූ තැනැත්තාට කුවිතාන්සියක් නිකුත් කළ යුතු ය.

(2) එවැනි සෑම කුවිතාන්සියකම නියෝග මගින් නියමිත විස්තර අන්තර්ගත විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ බදු එකතු කිරීමට හිමිකම් ඇති තැනැත්තකු, එම උපවගන්තියට හා (2) වන උපවගන්තිය යටතේ සාදන ලද නියෝග වලට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරියහොත් මේ පනත යටතේ ඔහු වරදකට වරදකරු විය යුතු ය.

හිඟ බද්ද වෙනුවෙන් පොලී ගෙවිය යුතු බව.

**17.** යම් කුඹුරු ප්‍රමාණයක බද්ද හිඟ බවට පැමිණි විට මේ පනතේ විධිවිධාන අනුව මුදලින් ගණන් බැලූ හිඟ බද්ද වෙනුවෙන් නියමිත ප්‍රමාණයක සුළු පොලියක් ගෙවිය යුතු ය.

හිඟ බවට පැමිණි බදු සහ පොලී අය කර ගැනීම.

**18.** (1) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියාගෙන් හිඟ බවට පැමිණි බදු වශයෙන් හෝ ඒ බද්ද වෙනුවෙන් වූ පොලී වශයෙන් හෝ ඒ දෙවිධියෙන් ම හෝ ඔහුගේ ඉඩම් හිමියාට යම් මුදලක් අය විය යුතුව ඇති විට මේ වගන්තිය යටතේ නියමයක් සඳහා ඉඩම් හිමියා විසින් ලිඛිත ඉල්ලීමක් කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලැබූ අවස්ථාවක ඒ ඉල්ලීම

සම්බන්ධයෙන් ගොවිජන විනිශ්චය සභාව මගින් විභාගයක් පැවැත්වීමට සැලැස්විය යුතු ය. අඳ ගොවියා විසින් ඉඩම් හිමියාට යම් මුදලක් ගෙවිය යුතුව ඇති බව ගොවිජන විනිශ්චය සභාව විසින් තීරණය කරනු ලබන්නේ නම් සහ ඒ බව කොමසාරිස් ජනරාල්වරයා වෙත දන්වා සිටින්නේ නම්, එවිට, ඒ මුදල මුදලින් හෝ වී වලින් නැතහොත් මුදලින් හා වී වලින් යන දෙවිධියෙන් ම හෝ නියමයේ නියමිතව ඇති අන්දමට සහ එහි නියමිතව ඇති කාල සීමාව ඇතුළත ගෙවීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නියමයක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නියමය මගින් නිශ්චිතව දෙන ලද කාල සීමාව තුළ ඒ මුදල ගෙවීම අඳ ගොවියා විසින් පැහැර හරිනු ලැබුවහොත් බද්ද ගෙවීමට ඇත්තේ යම් කුඹුරු ඉඩමක් සම්බන්ධයෙන් ද ඒ ඉඩම පිහිටා ඇති ස්ථානය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණයට ඉඩම් හිමියා විසින් කරන ලද ඉල්ලීමක් අනුව, ඒ මුදල, එය එම අධිකරණය විසින් ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කළ හැකි දඩ ප්‍රමාණය ඉක්මවන්නේ වුව ද, ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් අය කර ගන්නා ආකාරයෙන් අය කර ගත හැකි අතර, එසේ අය කර ගනු ලැබූ යම් මුදලක්, ඒ අධිකරණය විසින් ඉල්ලුම්කාර ඉඩම් හිමියාට ගෙවනු ලැබිය යුතු ය.

(3) නියමයේ නිශ්චිතව සඳහන් කරන ලද මුදල අඳ ගොවියාගෙන් ඉඩම් හිමියාට අය විය යුතු බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් දෙනු ලබන සහතිකයක්, (2) වන උපවගන්තියේ කාර්ය සඳහා, ඒ මුදල අය විය යුතුව තිබෙන බවට මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

අඳ ගොවියාට ගෙවිය යුතු වන්දිය නියම කිරීම.

**19.** (1) යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක ඉඩම් හිමියා විසින් ඒ ඉඩම් ප්‍රමාණයට 6 වන වගන්තිය අදාළ වීමෙන් නිදහස් කරවා ගැනීම පිණිස කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කර ඇත්තේ යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ද ඒ ඉඩම් ප්‍රමාණයේ අඳ ගොවියාට ඉල්ලුම්කරු විසින් එක කන්නයක දී ඒ ඉඩම් ප්‍රමාණයෙන් ලබා ගත හැකි වී බුසල් ගණන (මේ කාර්ය සඳහා ඒ ඉඩම් ප්‍රමාණය පිහිටි ප්‍රදේශයේ කුඹුරු අක්කරයකින් ලබාගත හැකි වී බුසල් ගණන කෙරෙහි සැලකිල්ල ඇතිව) දහයෙන් වැඩි කරන ලද ගණනට

සමාන මුදලකට අඩු නොවන මුදලකින් වන්දි ගෙවා ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වීමෙන් පසු, ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය කෙරෙහි 6 වන වගන්තියේ විධිවිධාන අදාළ වීම නතර විය යුතු බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව නියමයක් කළ යුතු ය.

ඉඩම් අත් කර ගැනීමේ පනත අදාළ කිරීම.

**20.** (1) අඳ ගොවියකු විසින් වගා කරනු ලබන සහ මේ පනත ආරම්භ වීමේ දිනයේ සිට අවුරුදු දෙකක කාල සීමාවක් අවසානයේ දී ඒ අඳ ගොවියාට විකුණා නොමැති කුඹුරක් 6 වන වගන්තියේ නිශ්චිතව සඳහන් යම් කුඹුරු ඉඩමක් මේ පනතේ කාර්ය සඳහා අත් කර ගැනීමට අවශ්‍යව ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත් කර ගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අත් කර ගනු ලබන කුඹුරු ඉඩමක් මේ පනත යටතේ පිහිටුවනු ලබන ඉඩම් බැංකුව වෙත සතු විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අත් කර ගනු ලබන යම් කුඹුරු ඉඩමක අඳ ගොවියන්ට මේ පනතේ 19 වන වගන්තිය අනුව ගණන් බලන ලද වන්දි ගෙවිය යුතු ය.

ඉඩම් හිමියා සහ අඳගොවියා විසින් ඉඩම් පිළිබඳ විස්තර ඉදිරිපත් කළ යුතු බව.

**21.** (1) කුඹුරු ඉඩම් ප්‍රමාණයක් අයිති සෑම ඉඩම් හිමියකු විසින් සහ කුඹුරු ඉඩම් ප්‍රමාණයක සෑම අඳ ගොවියකු විසින් ඒ කුඹුරු ප්‍රමාණය පිළිබඳ තොරතුරු කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය. සැපයීමට අවශ්‍ය කෙරෙන තොරතුරුවල ස්වභාවය සහ ඒ කාර්යය සඳහා භාවිත කරනු ලැබිය යුතු ආකෘති පත්‍ර නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අවශ්‍ය කෙරෙන තොරතුරු සැපයීමේ කාර්ය සඳහා ඉඩම් හිමියා විසින් සහ බුක්තිකරු විසින් ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය පිහිටි ප්‍රදේශයේ තත් කාලයේ ක්‍රියාත්මකව පවත්නා කෘෂිකාර්මික ඉඩම් ලේඛනය පරීක්ෂා කර බැලිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සපයන ලද තොරතුරුවල වෙනස් වීමක් වූ අවස්ථාවක, ඉඩම් හිමියා සහ අඳ ගොවියා විසින් ඒ වෙනස් වීම සිදු වී මාස හයක් ඇතුළත ඒ වෙනස් වීම කොමසාරිස් ජනරාල්වරයා වෙත නිවේදනය කළ යුතු ය.

(4) (1) වන උපවගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන ඉඩම් හිමියකු හෝ අඳ ගොවියකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

## II වන කොටස

## කෘෂිකාර්මික ප්‍රතිපත්තිවලට අනුකූලව කෘෂිකාර්මික ඉඩම් යෙදවීම

කෘෂිකාර්මික ඉඩම්වල ගොවිතැන් කිරීමට සහ ඒ ඉඩම් පාලනය කිරීමට අදාළව ඉඩම්හිමි ගොවියන් හෝ භුක්තිකරුවන් සතු කාර්ය.

**22.** (1) යම් කෘෂිකාර්මික ඉඩමක ප්‍රමාණය, පිහිටීම සහ ස්වාභාවික සම්පත් සැලකිල්ලට ගෙන ඒ ඉඩමට ඉතාම ගැලපෙන බෝගවර්ග එහි වගා කිරීම හෝ සත්ව වර්ග ඇති කිරීම, මිරිදිය මත්ස්‍ය ඇති කිරීම හෝ කාර්යක්ෂම වගා කරවීම පිණිස කෘෂිකාර්මික ඉඩම් මනා කළමනාකරණය කිරීම සහ මේ පනත මගින් මෙහි මින් මතු සලස්වා ඇති හෝ ඒ යටතේ පනවනු ලැබූ නියෝග මගින් සලස්වා ඇති විධිවිධාන ප්‍රකාර වගා කිරීමේ සම්මතයන්ට අනුකූලව නිෂ්පාදනවල තත්ත්වය හා ප්‍රමාණය යන දෙඅංශයෙන් ම පලද වර්ධනය දියුණු කිරීමේ සහ නිෂ්පාදනය විෂයෙහි කාර්යක්ෂම සම්මත තත්ත්වයන් පවත්වා ගෙන යාමේ අරමුණ ඇතිව ඒ ඉඩම වගා කිරීම, යම් කෘෂිකාර්මික ඉඩමක සෑම ඉඩම් හිමි ගොවියකුගේ ම හෝ බුක්තිකරුවකුගේ ම කාර්යය හා වගකීම විය යුතු ය.

(2) ඉඩමේ පිහිටීම සහ ස්වාභාවික සම්පත්වලට අනුව වගා කළ යුතු බෝග වර්ග සහ ඇති කළ යුතු සත්ව වර්ග, මිරිදිය මත්ස්‍ය වර්ග සහ කෘෂිකාර්මික ඉඩම් කාර්යක්ෂම ලෙස වගා කරවීම පිණිස මනා කළමනාකරණය සැලැස්වීම නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

සුපරීක්ෂක නියමයන් නිකුත් කිරීම.

**23.** (1) යම් කෘෂිකාර්මික ඉඩමක් ඇත්තේ කවර ගොවි සංවිධානයක බල ප්‍රදේශය ඇතුළත ද ඒ ගොවි සංවිධානය විසින් ඒ කෘෂිකාර්මික ඉඩම මේ පනතේ හෝ ඒ කාරණය පිළිබඳව සාදන ලද නියෝගවල විධිවිධානවලට අනුකූලව වගා නොකරනු ලබන බව කොමසාරිස් ජනරාල්වරයාට දන්වා සිටිනු ලැබූ අවස්ථාවක හෝ කෘෂිකාර්මික ඉඩමක් මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව වගා නොකරන බව වෙනත් යම් ආකාරයකින් කොමසාරිස් ජනරාල්වරයාට දැන ගන්නට ලැබුණු විට, ඒ කෘෂිකාර්මික ඉඩම් හිමි ගොවියාට හෝ බුක්තිකරුවාට තමා වෙත හෝ තමාගේ බලය ලත් නියෝජිතයාට නියෝජනයක් කිරීම පිණිස අවස්ථාවක් දීමෙන් පසු, කොමසාරිස් ජනරාල්වරයා විසින් (මෙහි මින් මතු "සුපරීක්ෂක" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින්, ඒ නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාල සීමාවන් සඳහා ඉඩම් හිමි ගොවියා හෝ බුක්තිකරු කොමසාරිස් ජනරාල්වරයාගේ අධීක්ෂණය යටතට පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ පරීක්ෂණ පැවැත්විය යුතු ආකාරය, සුපරීක්ෂක නියෝග නිකුත් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ඒවා ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ ආකාරය නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

නිසි ලෙස වගා කර නොමැති කෘෂිකාර්මික ඉඩම් සම්බන්ධයෙන් වන්දි ගෙවිය යුතු බව.

**24.** (1) 23 වන වගන්තිය යටතේ වූ සුපරීක්ෂක නියමයක් අදාළ වන ඉඩම් ප්‍රමාණයක වගා කිරීමේ කටයුතු ඒ නියමයේ නිශ්චිතව සඳහන් කාල සීමාව තුළ වැඩිදියුණු වීමක් නොපෙන්වන බව 25 වන වගන්තිය යටතේ පත් කරන ලද සුපරීක්ෂක කමිටුවක් විසින්, කොමසාරිස් ජනරාල්වරයා වෙත වාර්තා කරනු ලැබූ අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව ඒ ඉඩම් අක්කරයක් සඳහා හෝ ඉන් කොටසකට රුපියල් පත් දහසකට වැඩි නොවන වන්දියක් ගොවිජන සංවර්ධන අරමුදලේ බැරට ගෙවන ලෙස ඒ ඉඩමේ ඉඩම් හිමි ගොවියාට හෝ බුක්තිකරුට නියම කරමින් නියමයක් නිකුත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයකින් අතෘප්තියට පත් තැනැත්තකු විසින්, නියමයේ දිනයේ සිට මාසයක් ඇතුළත, නියමය කරන ලද්දේ කවර ගොවිජන විනිශ්චය සභාවක ප්‍රාදේශීය බල ප්‍රදේශයක් තුළ පිහිටි ඉඩමක් සම්බන්ධයෙන් ද ඒ ඉඩම පිහිටා ඇති ප්‍රාදේශීය බල ප්‍රදේශයේ ගොවිජන විනිශ්චය සභාව වෙත ඒ නියමයට විරුද්ධව අභියාචනයක් කරනු ලැබිය හැකි ය. ඒ අභියාචනයේ පිටපතක් එම අවස්ථාවේ දී ම කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතු ය.

(3) කොමසාරිස් ජනරාල්වරයා විසින් 1 වන උපවගන්තිය යටතේ කරන ලද නියමයකට විරුද්ධව ගොවිජන විනිශ්චය සභාවක් වෙත අභියාචනයක් කර නැති හෝ අභියාචනයේ දී ගොවිජන විනිශ්චය සභාව විසින් ඒ නියමය ස්ථිර කර ඇති අවස්ථාවක, නියමයේ නිශ්චිතව සඳහන් වන්දිය ගෙවිය යුත්තේ කවර දිනයකට ප්‍රථමයෙන් ද ඒ දිනය ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ලිඛිත දැන්වීමක් මගින් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉඩම් හිමි ගොවියාට හෝ බුක්තිකරුට දැන්විය යුතු ය.

(4) කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරන ලද දිනයේ දී හෝ ඊට ප්‍රථමයෙන් වන්දිය ගෙවීම ඉඩම් හිමියා හෝ බුක්තිකරු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, වන්දිය ගෙවනු ලැබිය යුත්තේ කවර ඉඩමක් සම්බන්ධයෙන් ද ඒ ඉඩම පිහිටියේ කවර මහේස්ත්‍රාත් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඒ මුදල, ඒ අධිකරණය විසින් පනවන ලද දඩයක් අය කර ගන්නා ආකාරයෙන්, ඒ මුදල

ඒ අධිකරණය විසින් එහි සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී පනවනු ලැබිය හැකි දඩයක ප්‍රමාණය ඉක්මවූයේ වුව ද අය කර ගන්නා ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(5) වන්දි වශයෙන් ඒ මුදල අය විය යුතුව තිබෙන බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක්, ඒ මුදල එසේ අය විමට තිබෙන බවට සාක්ෂියක් විය යුතු ය.

සුපරීක්ෂක කමිටු පත් කිරීම.

**25.** (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් සෑම ගොවිජන සංවර්ධන සභා ප්‍රදේශයක් සඳහා සුපරීක්ෂක කමිටු පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද සුපරීක්ෂක කමිටුවක සාමාජිකයන් කොමසාරිස් ජනරාල්වරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, එම ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මකව පවත්නා දෙපාර්තමේන්තුවල, රාජ්‍ය සංස්ථාවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවානියුක්තයන් අතුරෙන් පත් කරනු ලැබිය යුතු තැනැත්තන් පස් දෙනකුට නොවැඩි ගණනකින් සමන්විත විය යුතු ය.

(3) කොමසාරිස් ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තියේ සඳහන් සෑම සුපරීක්ෂක කමිටුවක් සඳහා ම ලේකම්වරයකු පත් කරනු ලැබිය යුතු ය.

(4) සුපරීක්ෂක කමිටුවල සාමාජිකයන් පත් කිරීම, මවුන්ගේ ධුර කාලය, කමිටුවල රැස්වීම්වල ගණපූරණය, ඒ රැස්වීම්වල කටයුතු කර ගෙන යාම සඳහා වූ කාර්ය පටිපාටිය සඳහා විධිධාන සලස්වමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

අභිමි කිරීමේ නියමය නිකුත් කිරීම.'

**26.** (1) අවුරුදු එකක් සඳහා සුපරීක්ෂක නියමයකට යටත් කරනු ලැබූ කෘෂිකාර්මික ඉඩමක් වගා කිරීම ඊට ඉක්බිතිව ම එළඹෙන අවුරුද්දේ දී පවා සතුටුදායක ලෙස වගා කරනු නොලබන බව අධීක්ෂණ කමිටුවක් විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දෙන ලද අවස්ථාවක, ඒ ඉඩම, ඒ ඉඩමේ ඉඩම් හිමි ගොවියාට හෝ බුක්තිකරුට අහිමි නොකළ යුත්තේ මන්දැයි කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ ඔහුගේ නියෝජිතයා වෙත හේතු දැක්වීම සඳහා ඉඩම් හිමි ගොවියාට හෝ බුක්තිකරුට අවස්ථාවක් සලසා දීමෙන් පසු, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ ඉඩම වගා කිරීම පිණිස සහ ඒ ඉඩමෙන් පලදාව ලැබීම පිණිස ඉඩමේ ඉඩම් හිමි ගොවියාට හෝ බුක්තිකරුට ඇති අයිතිය නියමයේ නිශ්චිතව සඳහන් කාල සීමාවන් සඳහා අහිමි කරමින් (මෙහි මින් මතු "අහිමි කිරීමේ නියෝගය" යනුවෙන් සඳහන් කරනු ලබන) ආඥාවක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් භාර දෙනු ලැබූ තැනැත්තකු ඒ ආඥාවෙන් අතෘප්තියට පත් වූ අවස්ථාවක, ඒ ආඥාව ලැබී දින තිහක් ඇතුළත දී අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ඒ අභියාචනයේ පිටපතක් ඒ අවස්ථාවේ දී ම ලියාපදිංචි තැපෑලෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවිය යුතු ය.

(3) ඒ ආඥාවට විරුද්ධව (2) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, ඒ ආඥාව අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ අහිමි කිරීමේ ආඥාව අවසානාත්මක සහ තීරණාත්මක වූ අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ පනතේ 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ කෘෂිකාර්මික ඉඩමේ ඉඩම් හිමි ගොවියා හෝ බුක්තිකරු එයින් නෙරපිය යුතු අතර ඒ කෘෂිකාර්මික ඉඩම ඉඩම් බැංකුව වෙත භාර දිය යුතු ය.

(5) කෘෂිකාර්මික ඉඩමක් අහිමි කිරීමේ ආඥාවක් මත පවත්නා අවස්ථාවක, ඒ ඉඩමෙහි කරන ලද වැඩි දියුණු කිරීම් මත දැරූ සියලු වියදම් ද ඒ ඉඩමට අදාළව කරන ලද්දා වූ එවැනි වෙනත් සියලු වියදම් ද ඉඩම් හිමි ගොවියා හෝ බුක්තිකරු විසින් ගෙවීම මත හැර, ඒ ඉඩම ඉඩම් හිමි ගොවියාට හෝ බුක්තිකරුට ආපසු නොදිය යුතු ය.

(6) අහිමි කිරීමේ ආඥාවක් නිකුත් කිරීමේ, භාර දීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ආකාරය, එවැනි නියෝගයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ කාර්ය පටිපාටිය සහ සන්තකය ආපසු භාර දීම සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

ආරාවුලකට යටත් ඉඩම වගා කිරීම.

27. (1) යම් කෘෂිකාර්මික ඉඩමකට අදාළව ආරාවුලක් පැවතීම නිසා ඒ ඉඩම වගා නොකරන බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වූ අවස්ථාවක, තමා වෙත හෝ තමාගේ බලය ලත් නියෝජිතයා වෙත නියෝජනයක් ඉදිරිපත් කිරීමට ඒ කෘෂිකාර්මික ඉඩමේ ඉඩම් හිමි ගොවියාට හෝ බුක්තිකරුට අවස්ථාවක් සලස්වා දීමෙන් පසු, කොමසාරිස් ජනරාල්වරයා විසින්, නියමය භාර දෙනු ලැබූ තැනැත්තාට නියමයේ නිශ්චිතව සඳහන් කර ඇති කාල සීමාව තුළ දී ඉඩමෙන් ඉවත් වී ඉඩමේ සන්තකය කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ ඔහුගේ නියෝජිතයා වෙත භාර දෙන ලෙස නියම කරමින් ඒ කෘෂිකාර්මික ඉඩමේ ඉඩම්හිමි ගොවියා වෙත හෝ බුක්තිකරු වෙත නියමයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) සෑම නියමයක්ම එය අදාළවන තැනැත්තා වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය :

එසේ වුව ද, ඒ ඉඩමේ ඉඩම් හිමි ගොවියන් හෝ බුක්තිකරුවන් ගණනාවක් සිටින සහ ඒ ඉඩම් හිමි ගොවියන්ගේ සහ බුක්තිකරුවන්ගේ ලිපින නිශ්චය වශයෙන් දැන ගත නොහැකි අවස්ථාවක, නියමය අදාලවන ඉඩම තුළ හෝ එය මත හොඳින් පෙනෙන ස්ථානයක ඒ නියමය ප්‍රදර්ශනය කිරීම එහි සියලු ඉඩම්හිමි ගොවියන් හා බුක්තිකරුවන් වෙත නියමය භාර දෙනු ලැබීමක් ලෙස සැලකිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් භාර දෙනු ලැබූ තැනැත්තකු විසින්, ඒ නියමයේ නිශ්චිතව සඳහන් කාල සීමාව තුළ දී ඉඩමෙන් ඉවත්ව යාම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තා ඉවත් කළ යුතු ය.

(4) ඒ ඉඩමට අදාළ ආරාවුල සමථයට පත් කරන තෙක් හෝ ඒ කෘෂිකාර්මික ඉඩම වගා කිරීමේ කාර්ය සඳහා ඉඩම් බැංකුව වෙත භාර දෙනු ලැබිය යුතු අතර එයින් උපදින ආදායම කොමසාරිස් ජනරාල්වරයා විසින් විධාන කරන ආකාරයෙන් බැහැර කරනු ලැබිය යුතු ය.

ඇතැම් ඉඩම් කුඹුරු ඉඩම් බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කළ හැකි බව.

**28.** (1) යම් ඉඩම් ප්‍රමාණයක් කුඹුරු ඉඩමක් ද යන්න කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තීරණයක් කිරීමේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඉඩම් ප්‍රමාණය පිහිටියේ කවර ගොවිජන සංවර්ධන සභාවක බල ප්‍රදේශය ඇතුළත ද ඒ ගොවිජන සංවර්ධන සභාවෙන් සහ අදාළ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලින් ව්‍යවස්ථාපිත මණ්ඩල සහ ආයතන වලින් නිරීක්ෂණ සහ තොරතුරු ඉල්ලා ලබා ගත හැකි ය. ඒ නිරීක්ෂණ සහ තොරතුරු ප්‍රායෝගික වශයෙන් හැකි තාක් ඉක්මනින් සැපයීම ඒ සෑම ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හා ව්‍යවස්ථාපිත මණ්ඩල සහ ආයතනයක ම කාර්යය විය යුතු ය.

වගා කළ හැකි හා වෙනත් භෝග වගා කළ හැකි කුඹුරු ඉඩම් හඳුනා ගැනීම.

**29.** (1) වී වගා කළ විට ප්‍රමාණවත් ඵලදාවක් ලබා ගත හැකි කුඹුරු ඉඩම් සහ වෙනත් කෘෂිකාර්මික බෝග වගා කළ විට ප්‍රමාණවත් ඵලදාවක් ලබා ගත හැකි කුඹුරු ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් හඳුනා ගත යුතු ය. එසේ හඳුනාගැනීමේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින්, ගොවි

සංවිධානවලින් සහ ඒ ඉඩම පිහිටියේ කවර ගොවිජන සංවර්ධන සභාවක බල ප්‍රදේශය ඇතුළත ද ඒ ගොවිජන සංවර්ධන සභාවෙන් නිරීක්ෂණ ලබා ගත යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා කෘෂිකාර්මික ඉඩම් හඳුනා ගැනීමේ දී සහාය වීමේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා හෝ පරිපාලන දිස්ත්‍රික්කයක වෙනස් වෙනස් කොටස් සඳහා ඵලදායිතා කමිටු පත් කරනු ලැබිය හැකි ය.

(3) එවැනි එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල, ව්‍යාවස්ථාපිත මණ්ඩලවල හෝ ආයතනවල සේවයෙහි නියුක්ත තැනැත්තන්ගෙන් සහ කෘෂිකර්මයෙහි නිරත වී සිටින තැනැත්තන්ගෙන් ඵලදායිතා කමිටු සමන්විත විය යුතු ය.

(4) සෑම ඵලදායිතා කමිටුවක් විසින් ම, තම කමිටුව සඳහා ලේකම්වරයකු පත් කර ගත යුතු ය.

(5) වෙනත් කෘෂිකාර්මික බෝග වගා කිරීමෙන් ප්‍රමාණවත් ඵලදාවක් ලබා ගත හැකි කුඹුරු ඉඩම් හඳුනා ගැනීමෙන් පසු, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඒ කුඹුරු ඉඩම් සඳහා 6 වන වගන්තියේ (1) වන හා (2) වන උපවගන්තිවල විධිවිධාන අදාළ වීම නතර විය යුතු බවට ප්‍රකාශ කළ යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ නිවේදනයක් පළකරනු ලැබුවේ කවර කුඹුරු ඉඩමක් සම්බන්ධයෙන් ද ඒ කුඹුරු ඉඩම වගා කරන යම් තැනැත්තකු කෙරෙහි මේ පනතේ 6 වන වගන්තියේ (1) වන හා (2) වන උපලේඛනවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

වගා කළ හැකි සෑම කුඹුරු ඉඩමක් ම වී වගා කිරීම සඳහා යෙදිය යුතු බව.

**30.** (1) වී වගා කිරීමෙන් උපරිම ඵලදාවක් ලබා ගත හැකි කුඹුරු ඉඩම් ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් හඳුනා ගෙන ඇති කුඹුරු ඉඩම්වල වී වගා කරනු ලැබිය හැකි සෑම කන්නයක ම වී වගා කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ හඳුනා ගන්නා ලද කුඹුරු ඉඩම් ප්‍රමාණයක ස්වාභාවික හෝ වෙනත් හේතුවක් නිසා, යම් කන්නයක් තුළ වී වගා කිරීමට නොහැකි වන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත අවසරය ලබා ගැනීමෙන් පසු, ඒ කුඹුරු ඉඩමේ බහු වාර්ෂික නොවන බෝගයක් වගා කරනු ලැබිය හැකි ය.

(3) වී හැර වෙනත් යම් බෝගයක් වගා කිරීමෙන් සතුටුදායක ඵලදාවක් ලබාගත හැකි කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් වන විට, 29(5) වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත අවසරය ලබාගෙන ඒ කුඹුරු ඉඩමේ වී හැර, වෙනත් අර්ධ වාර්ෂික බෝග වගා කරනු ලැබිය හැකි ය. ඒ කුඹුරු ඉඩම්වල දීර්ඝ කාලීන භෝග වගා කිරීමේ කාර්ය සඳහා, ඒ වගාකටයුතු ආරම්භවීමට පෙරාතුව, කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත අවසරය ලබාගත යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධාන උල්ලංඝණය කරන සෑම තැනැත්තෙක් ම මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(5) මේ වගන්තියේ විධිවිධාන උල්ලංඝණය කරනු ලැබ ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් සාක්ෂියේ දී ආවේශ්‍ය විය යුතු අතර ඒ කාරණය පිළිබඳ මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

කෘෂිකාර්මික ඉඩම් භාවිත කරන කාර්ය සොයා ගැනීම පිණිස ඒ ඉඩම් පරීක්ෂා කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට සහ නිලධරයන්ට බලය තිබෙන බව.

**31.** (1) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා, කොමසාරිස් ජනරාල්වරයා හෝ 38 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයකු විසින්, සියලු සාධාරණ කාලයේ දී යම් කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයකට ඇතුල් වී ඒ කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය පරීක්ෂා කර බැලිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කෘෂිකාර්මික ඉඩමක් පරීක්ෂා කරන නිලධරයකු විසින්-

(අ) කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය පස්වලින් හෝ වෙනත් ද්‍රව්‍යවලින් පුරවමින් තිබෙන්නේ ද නැතහොත් පිරවීමට ආසන්නව තිබෙන්නේ ද යන වග ;

(ආ) ඒ කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයෙහි යම් ඉදි කිරීමක් කර ගෙන යන්නේ ද නැතහොත් යම් ගොඩනැගිල්ලක් සාදා ගෙන යන්නේ ද යන වග ;

(ඇ) ඒ කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයෙන් පස් ඉවතට රැගෙන යාම සඳහා ක්‍රියා කරන්නේ ද නැතහොත් එයින් පස් ඉවතට ගෙන යමින් තිබේ ද යන වග ;

(ඈ) ඒ කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය කෘෂිකාර්මික බෝගයක් වගා කිරීම සඳහා නොව වෙනත් යම් කාර්යයක් සඳහා සූදානම් කරමින් හෝ භාවිත කරමින් තිබේ ද යන වග හෝ කෘෂිකාර්මික ඉඩම කාර්යක්ෂමව වගා කරනු ලබන්නේ ද නැද්ද යන වග ;

(ඉ) මේ පනතේ 32 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 33 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් අවසරයක නියම සහ කොන්දේසි උල්ලංඝනය කෙරෙන ක්‍රියා කෘෂිකාර්මික ඉඩම් සම්බන්ධයෙන් සිදු කරන්නේ ද යන වග,

ස්ථිර ලෙස දැන ගැනීම පිණිස අවශ්‍ය විය හැකි පරීක්ෂණ හා විමසීම් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද නිලධරයන් විසින් අවශ්‍ය අවස්ථාවක, 32 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 33 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අවසරයක් නිකුත් කරන ලද්දේ කවර නියම සහ කොන්දේසි යටතේ ද ඒ නියම හා කොන්දේසි අනුව ක්‍රියා කරන්නේ දැයි ස්ථිර ලෙස දැන ගැනීම සඳහා එසේ නිකුත් කළ අවසරය පරීක්ෂා කර බැලිය හැකි ය.

(4) (1) වන උපවගන්තියෙහි සඳහන් කරන ලද යම් නිලධරයකු විසින් (2) වන හා (3) උපවගන්තිවලින් ඔහු වෙත පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඔහුට බාධා කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ සඳහන් නිලධරයකුට ඔහු වෙත (1) වන, (2) වන හා (3) වන උපවගන්තිවලින් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී යම් තැනැත්තකු විසින් බාධා කරන අවස්ථාවක, ඒ නිලධරයා විසින් ඒ බාධා කිරීම ගැන කෘෂිකාර්මික ඉඩම පිහිටි ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධරයා වෙත පැමිණිල්ලක් කළ යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ යම් කෘෂිකාර්මික ඉඩමක් පරීක්ෂා කරන නිලධරයකු විසින්, (2) වන හා (3) වන උපවගන්තිවලින් ඔහු වෙත පවරනු ලැබූ බලතල ඔහු විසින් ක්‍රියාත්මක

කිරීමේ දී දිවුරුම් ප්‍රකාශයේ නම් සඳහන් කර ඇති තැනැත්තකු විසින් ඔහුට බාධා කරන ලද බව හෝ අවහිර කරන ලද බව සඳහන් කරමින් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශයක් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු අතර ඒ කාරණය පිළිබඳ මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

කොමසාරිස් ජනරාල්වරයාගේ අවසරයක් නොමැතිව කුඹුරු ඉඩමක් කෘෂිකාර්මික වගාවක් සඳහා හැර වෙනත් කාර්යයක් සඳහා භාවිත කිරීම දඬුවමට යටත් බව.

**32.** (1) කොමසාරිස් ජනරාල්වරයාගෙන් ලිඛිත අවසරයක් ලබා නොගෙන–

(අ) කුඹුරු ඉඩම් ප්‍රමාණයක් පස්වලින් හෝ වෙනත් ද්‍රව්‍යයකින් ගොඩ කරන්නා වූ හෝ ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය පිරවීමට තැත් කරන්නා වූ ;

(ආ) යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක් කෘෂිකාර්මික කාර්ය සඳහා හැර වෙනත් යම් කාර්යයක් සඳහා භාවිත කරන්නා වූ හෝ ඒ කාර්යය සඳහා වෙනත් යම් ක්‍රියාවක් කරන්නා වූ ;

(ඇ) කුඹුරු ඉඩම් ප්‍රමාණයේ යම් ගොඩනැගිල්ලක් ඉදි කරන්නා වූ හෝ ඒ කාර්යය තව දුරටත් තහවුරු කිරීමෙහි ලා යම් ක්‍රියාවක් කරන්නා වූ ;

(ඈ) කුඹුරු ඉඩම් ප්‍රමාණයකින් පස් ඉවතට ගෙන යන්නා වූ හෝ එසේ කිරීමට තැත් කරන්නා වූ ; නැතහොත්

(ඉ) කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද අවසරයක නියම සහ කොන්දේසි උල්ලංඝණය කරමින් කුඹුරු ඉඩම් ප්‍රමාණයක් භාවිතයට යොදා ගන්නා වූ,

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(2) (1) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් යම් ක්‍රියාවක් කරන තැනැත්තකුට ඒ ක්‍රියා කිරීමේ දී ආධාර හා අනුබල දෙන යම් තැනැත්තකු ඒ වරදට ම වරදකරුවකු විය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය යටතේ වරදක් කළ විට, කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ 38 වන වගන්තියේ (2) වන උපවගන්තිය අනුව පත් කරන ලද නිලධරයකු විසින්, ඒ වරද කිරීමෙන් වළකින ලෙස ඊට සම්බන්ධ වී සිටින

සියලු තැනැත්තන් වෙත වහාම දැන්වීමක් නිකුත් කළ යුතු ය. ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය තුළ හෝ ඒ මත හොඳින් පෙනෙන ස්ථානයක ඒ දැන්වීම ප්‍රදර්ශනය කරවීම එවැනි සියලු තැනැත්තන් වෙත ඒ දැන්වීම භාර දීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක (3) වන උපවගන්තිය යටතේ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක, ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය සම්බන්ධයෙන් සිදු කරනු ලබන වරදෙහි ස්වභාවය සහ ඔප්පු කරනු ලැබුවහොත් ඒ වරද සිදු කිරීම සඳහා ඒ තැනැත්තා යටත් කරනු ලැබිය හැකි දණ්ඩනය සඳහන් කරමින් වූ කෙටි ප්‍රකාශයක් අන්තර්ගත විය යුතු ය.

(5) යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය යටතේ වරදක් කර ඇති අවස්ථාවක හෝ එසේ කිරීම පිණිස යම් ක්‍රියාමාර්ගයක් ගෙන ඇති විටෙක, 38 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයකු විසින්, ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය පිහිටි ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධරයා වෙත පැමිණිලි කළ යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ පැමිණිල්ලක් කිරීමෙන් පසු ඒ පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධරයා විසින් ඒ පැමිණිල්ලේ සඳහන් කර ඇති සියලු තැනැත්තන් සහ ඒ වරදකට සම්බන්ධ වී සිටින බවට ඔහු විශ්වාස කරන සියලු තැනැත්තන් ද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රයක්, වාහනයක් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් හෝ ලේඛනයක් ද අත් අඩංගුවට ගත යුතු ය.

(7) (6) වන උපවගන්තිය යටතේ අත් අඩංගුවට ගත් සියලු තැනැත්තන් ද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රයක්, වාහනයක් හෝ වෙනත් යම් ද්‍රව්‍ය හෝ ලේඛනයක් වහාම මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තිය යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකුට මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ යටත් විය යුතු ය.

(9) මේ වගන්තිය යටතේ තැනැත්තකු වරදකට වරදකරු කරනු ලැබීමෙන් පසු එසේ වරදකරු කරනු ලැබූ තැනැත්තා විසින්, වරදකරු කිරීමෙන් පසු ද ඒ වරද අඛණ්ඩව කර ගෙන

යන සෑම දිනයක් සඳහා ම ඒ එක් එක් දිනයක් සඳහා රුපියල් එක් දහස බැගින් වූ දඩයක් ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

(10) මේ වගන්තිය යටතේ යම් තැනැත්තකු වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, ඒ වරද සිදු කිරීම හා සම්බන්ධ පස්, යම් භාණ්ඩ (ද්‍රව්‍ය) හෝ ඉදි කිරීම් අධිකරණය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාල සීමාවක් තුළ දී ඉවත් කරන ලෙස ඒ තැනැත්තාට අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

වගා කිරීම හැර වෙනත් යම් කාර්යයක් සඳහා කුඹුරු ඉඩම් ගොඩ කිරීම හෝ යොදා ගැනීම.

**33.** (1) කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිදු තැනැත්තකු විසින් යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක් ගොඩ කිරීම හෝ යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයකින් පස් ඉවත් කිරීම හෝ යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක යම් ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝණය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(3) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය උල්ලංඝණය කරමින් ක්‍රියා කරන බව කොමසාරිස් ජනරාල්වරයා හෝ අතිරේක කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ කොමසාරිස්වරයා වෙත හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයා වෙත හෝ සහකාර කොමසාරිස්වරයා වෙත දන්වා සිටිනු ලැබූ අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා හෝ අතිරේක කොමසාරිස් ජනරාල්වරයා හෝ කොමසාරිස්වරයා හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයා හෝ සහකාර කොමසාරිස්වරයා විසින්, මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල ආකෘතියකින් (1) වන උපවගන්තියේ විධිවිධාන එලෙස උල්ලංඝණය කරන තැනැත්තා සහ ඔහුගේ අනුයෝජිතයන් හා සේවකයන් විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝණය කරමින් ක්‍රියා කිරීම තහනම් කරමින් වූ ආඥාවක් නිකුත් කිරීම සඳහා අයැදමින් ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය හෝ එහි යම් කොටසක් පිහිටා ඇත්තේ කවර මහේස්ත්‍රාත් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බලසීමා ඇතුළත ද ඒ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ලියවිල්ලකින් වූ ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් ම, ඒ ඉල්ලීමේ දක්වා ඇති කරුණු සත්‍ය බව සහතික කරන්නා වූ දිවුරුම් ප්‍රකාශයක් මගින් තහවුරු කරනු ලැබිය යුතු ය.

(5) ඒ ඉල්ලීම ලැබීමෙන් පසු, මේ වගන්තිය උල්ලංඝණය කරමින් යම් ක්‍රියාවක් කරනු ලැබුවේ ද යන්න මහෙස්ත්‍රාත්වරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, ඒ විනිශ්චයට එළඹීමෙන් පසු, මහෙස්ත්‍රාත්වරයා විසින්, ඉල්ලීමේ නම් කර ඇති තැනැත්තා සහ ඔහුගේ සේවකයන් හෝ අනුයෝජිතයන් විසින් (1) වන උපවගන්තිය උල්ලංඝණය කරමින් ක්‍රියා කිරීම තහනම් කරමින් අතුරු ආඥාවක් කරනු ලැබිය යුතු ය ; තව ද ඉල්ලීමෙහි නම් කරනු ලැබ ඇති තැනැත්තා හෝ තැනැත්තන් වෙත වහාම සිතාසි නිකුත් කළ යුතු අතර, සිතාසියෙහි සඳහන් කරනු ලබන දිනයේ දී අධිකරණයට පැමිණ ඉල්ලීමෙහි අයැද සිටිනු ලබන ආකාරයට ඔහු හෝ ඔහුගේ සේවකයන් හෝ අනුයෝජිතයන් වළක්වනු නොලැබිය යුත්තේ මන්දැයි හේතු දක්වන ලෙස එම සිතාසියෙන් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(6) (අ) එම සිතාසිය නියම කරනු ලැබූ තැනැත්තා සිතාසියේ සඳහන් දිනයේ දී අධිකරණයේ පෙනී සිටීම පැහැර හරිනු ලැබුවේ නම් හෝ එම ආඥාව නිකුත් කිරීමට එරෙහිව දැක්වීමට තමාට කිසිඳු හේතුවක් නැති බව ප්‍රකාශ කරන්නේ නම්, අධිකරණය විසින් අතුරු ආඥාව ස්ථිර කළ යුතු ය.

(ආ) සිතාසිය නිකුත් කරනු ලැබූ තැනැත්තා යථා පරිදි අධිකරණයේ පෙනී සිට, එම ආඥාව නිකුත් කිරීමට එරෙහිව දැක්වීමට තමාට හේතු ඇති බව සඳහන් කරන්නේ නම්, මහෙස්ත්‍රාත් අධිකරණය විසින් වහාම නඩුව පිළිබඳව කටයුතු කිරීම හෝ නඩුව පසු දිනයක විභාග කිරීමට නියම කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(7) ඉල්ලීම සනාථ කිරීම සඳහා යම් සාක්ෂියක් ඉදිරිපත් කරන ලෙස කොමසාරිස් ජනරාල්වරයාට හෝ අතිරේක කොමසාරිස් ජනරාල්වරයාට හෝ කොමසාරිස්වරයාට හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාට හෝ සහකාර කොමසාරිස්වරයාට නියම කිරීමට මහෙස්ත්‍රාත් අධිකරණයට බලයක් නැත්තේ ය.

(8) කුඹුරු ඉඩම් ප්‍රමාණය ගොඩ කිරීමට හෝ එයින් පස් ඉවත් කිරීමට හෝ එහි ගොඩනැගිල්ලක් ඉදි කිරීමට ඒ හේතු

දක්වන තැනැත්තාට නීත්‍යානුකූල බලයක් ඇති බවට නඩු විභාගයෙන් පසුව මහෙස්ත්‍රාත්වරයා සෑහීමකට පත් නොවන්නේ නම්, ඒ තැනැත්තා සහ ඔහුගේ සේවකයන් හා අනුයෝජිතයන් විසින් මේ වගන්තිය උල්ලංඝණය කිරීමේ යම් ක්‍රියාවක් කිරීමෙන් වළක්වාලමින් (5) වන උපවගන්තිය යටතේ කරන ලද අතුරු ආඥාව ස්ථිර කළ යුතු ය.

(9) (අ) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක ; වරද කිරීමෙහි ලා හෝ ඒ හා සම්බන්ධයෙන් භාවිත කරන ලද්දා වූ යම් මෙවලම්, උපකරණ, යන්ත්‍රෝපකරණ හෝ වාහන රාජ්‍ය සන්තක කිරීම සඳහා අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය. එසේ රාජ්‍ය සන්තක කරන ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක් හෝ වාහනයක් සියලු බැඳීම්වලින් නිදහස්ව රාජ්‍ය සන්තක විය යුතු ය.

ඒ රාජ්‍ය සන්තක වීම—

(i) අභියාචනාධිකරණය වෙත හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුත්තේ යම් කාල සීමාවක් ඇතුළත ද ඒ කාල සීමාව ඉකුත් වීමෙන් පසු රාජ්‍ය සන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත හෝ ඒ මහාධිකරණය වෙත හෝ අභියාචනයක් කර නොමැති අවස්ථාවක ;

(ii) රාජ්‍ය සන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණය වෙත හෝ අභියාචනයක් කර ඇති අවස්ථාවක රාජ්‍ය සන්තක කිරීමේ ආඥාව ස්ථිර කරමින් අභියාචනය පිළිබඳව තීරණයක් කිරීමෙන් පසු,

බලාත්මක විය යුතු ය.

(ආ) මේ වගන්තිය යටතේ රාජ්‍ය සතු වන යම් මෙවලමක, උපකරණයක, යන්ත්‍රෝපකරණයක හෝ වාහනයක සන්තකය කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබා ගත යුතු අතර ඔහු විසින් සුදුසු යයි කල්පනා කරන පරිදි ඒවා විකිණීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම කරනු ලැබිය හැකි ය. එවැනි විකිණීමකින් ලැබෙන මුදල් ගොවිජන සංවර්ධන අරමුදලට බැරකරනු ලැබිය යුතු ය.

කුඹුරු ඉඩම් කෘෂිකාර්මික වගා හැර වෙනත් කාර්ය සඳහා භාවිත නොකළ යුතු බව.

**34.** (1) කොමසාරිස් ජනරාල්වරායයගේ ලිඛිත අවසරය ඇතිව හැර කිසිදු තැනැත්තකු විසින් කුඹුරු ඉඩම් ප්‍රමාණයක් කෘෂිකාර්මික වගාව සඳහා හැර වෙනත් යම් කාර්යක් සඳහා භාවිත නොකළ යුතු ය.

(2) කෘෂිකාර්මික නිෂ්පාදන වැඩි කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන නැතහොත් ඒ අවසරයට කොමසාරිස් ජනරාල්වරයා විසින් යා කරන ලද කොන්දේසි උල්ලංඝණය කිරීම නිසා, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තා වෙත භාර දෙනු ලබන දැන්වීමක් මගින්, කවර හෝ අවස්ථාවක, ඒ ලිඛිත අවසරය අස් කර ගනු ලැබිය හැකි ය.

(3) යම් තැනැත්තකු විසින් යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක් (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝණය කරමින් භාවිත කරන්නේ නම්, ඒ තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(4) (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ වූ ලිඛිත අවසරය අස් කර ගනු ලැබූ අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයක දී හෝ ඊට ප්‍රථමයෙන්, ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය, ලිඛිත අවසරය දීමට පෙරාතුව තිබුණු තත්වයට ම නැවත පත් කරනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියෙන් නියම කරනු ලැබ ඇති පරිදි ඒ ඉඩම යථා තත්ත්වයට පත් කිරීම පැහැර හරිනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් විසිපන්දාහකට නොවැඩි දඩයකට ද ඒ දඩය ගෙවීම පැහැර හැරීමේ දී මාස තුනකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට ද ඔහු යටත් විය යුතු ය.

(6) වරදකරු කරනු ලැබීමෙන් පසුව තව දුරටත් වරද කර ගෙන යනු ලබන අවස්ථාවක, වරදකරු කිරීමෙන් පසු ඒ වරද කර ගෙන ගිය එක් එක් දිනය සම්බන්ධයෙන් රුපියල් එක් දහසක දඩයකට වරදකරු යටත් විය යුතු ය. එසේ නියම කරනු ලැබූ දඩය, අධිකරණය විසින් නියම කරන ලද ආකාරයෙන් අය කර ගත යුතු අතර, එය ගොවිජන සංවර්ධන අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

වෙනත් කෘෂිකාර්මික බෝග සම්බන්ධයෙන් ගෙවිය යුතු බද්ද.

**35.** (1) යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක, මේ පනත යටතේ අවසරය දී ඇති පරිදි වෙනත් යම් කෘෂිකාර්මික බෝගයක් වගා කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයේ අඳ ගොවියා විසින්, ඒ කුඹුරු ප්‍රමාණය වෙනුවෙන් ඉඩම් හිමියා වෙත ගෙවිය යුතු බද්ද, මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව කලින් කල කොමසාරිස් ජනරාල් විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) වෙනත් යම් කෘෂිකාර්මික බෝගයක් වගා කරනු ලැබ ඇති යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු බද්ද නිශ්චය කිරීමේ දී, කොමසාරිස් ජනරාල් විසින්, ඒ බෝගයේ නිෂ්පාදන වියදම හා වෙළෙඳ වටිනාකම සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිශ්චය කරනු ලැබූ බද්ද, විවිධ පරිපාලන දිස්ත්‍රික්ක හෝ පරිපාලන දිස්ත්‍රික්කයක විවිධ කොට්ඨාස සම්බන්ධයෙන් වෙනස් විය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ නිශ්චිත බද්ද, වගා කරනු ලැබූ එක් එක් අක්කරය සඳහා නියමිත මුදල් ප්‍රමාණයක් පදනම් කරගෙන ගණන් බලනු ලැබූ අවස්ථාවක අක්කර එකකට අඩුවෙන් වගාකරනු ලැබූ ප්‍රදේශයක් සඳහා වූ බද්ද, ඒ ප්‍රදේශයෙන් අක්කරයක් අතර අනුපාතය අනුව ගණන් බලනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ නිශ්චිත බද්ද ඒ කුඹුරු ප්‍රමාණයේ වගා කළ බෝගයේ අස්වැන්න ලබා ගැනීමෙන් දින තිහක් ඇතුළත ගෙවිය යුතු ය. එසේ ගෙවනු නොලැබුවහොත්, එකී තිස්වන දිනට පසුව ප්‍රථම දිනයේ දී බද්ද හිඟ වීම ආරම්භ වන්නේ ය.

(6) ඒ කුඹුරු ප්‍රමාණය සඳහා වූ හිඟ බද්ද සම්බන්ධයෙන් මේ පනතේ 10 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරනු ලැබිය හැකි ය.

කුඹුරු ඉඩමක බණිජ සම්පත් ලබා ගැනීම සඳහා දෙනු ලබන අවසරය.

36. (1) යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක අඳ ගොවියා විසින්, ඒ කුඹුරු ප්‍රමාණයෙන් බණිජ සම්පත් ලබා ගැනීම සඳහා ඒ කුඹුරු ප්‍රමාණයේ අයිතිකරු වෙත සිය කැමැත්ත දීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක කොමසාරිස් ජනරාල් විසින්, යම් නිශ්චිත කාල සීමාවක් තුළ දී ඒ බණිජ සම්පත් ලබා ගැනීමේ කාර්යය සඳහා ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් පර්චස් විස්සකට නොවැඩි ප්‍රමාණයක් යොදා ගැනීමට ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයේ අයිතිකරුට අවසර දෙනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ දෙන ලද අවසරය, ඒ කුඹුරු ප්‍රමාණය පාවිච්චි කිරීම සඳහා දෙන ලද අවසරය වන අතර, ඒ බනිජ සම්පත් ලබා ගැනීම සඳහා අවසර දෙන බලපත්‍රයක් ලෙස තේරුම් නොගත යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඒ කුඹුරු ඉඩම් හිමියා වෙත අවසරය දීමට පෙරාතුව, ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් බණිජ සම්පත් ලබා ගැනීම සඳහා අයිතිකරු වෙත අවසරය ලබා දුන් කාල සීමාව සඳහා සන්තකය නැති වීම වෙනුවෙන් ඉඩම් හිමියා විසින් අඳ ගොවියාට වන්දි ගෙවිය යුතු යයි කොමසාරිස් ජනරාල් විසින් නියම කරනු ලැබිය යුතු ය. ගෙවිය යුතු වන්දි මුදල් නිශ්චය කිරීමේ දී, අවසරය දෙනු ලැබූ කාල සීමාව තුළ දී ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් ලබා ගත හැකි වී බුසල් ප්‍රමාණය කොමසාරිස් ජනරාල් විසින් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නියම කරනු ලැබූ වන්දිය පිළිගැනීම අඳ ගොවියා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, ඒ කුඹුරු ඉඩම පිහිටා ඇති බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන සභාවෙහි වන්දි මුදල තැන්පත් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ගොවිජන සංවර්ධන සභාවක වන්දි මුදල් තැන්පත් කරනු ලැබූ විට, ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිපියක් මගින් ලිපියේ සඳහන් දින පටන් මාස හයක කාලයක් ඇතුළත ඒ වන්දි මුදල ලබාගැනීමට අවශ්‍ය පියවර ගත යුතු බැව් ඒ සභාව විසින් ඒ වන්දි මුදල අයවිය යුතු තැනැත්තා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ සඳහන් මාස හයක කාලය ඇතුළත ඒ වන්දි මුදල ඒ තැනැත්තා විසින් ලබා නොගතහොත්, ඒ වන්දි මුදල ගොවිජන සංවර්ධන අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල් විසින් දෙනලද අවසරය, ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයේ භුක්තියෙන් අඳ ගොවියා පිටමංකිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

37. (1) පහත දැක්වෙන කාර්ය සියල්ලම හෝ ඒ අතුරෙන් යම් කාර්යයක් සඳහා, මේ පනත යටතේ ඇතැම් කෘෂිකාර්මික ඉඩම්වල සන්තකය භාර කෙරෙන ඉඩම් බැංකුවක් පිහිටුවනු ලැබේ :— ඉඩම් බැංකුව පිහිටුවීම.

(අ) යම් කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාව වැඩි දියුණු කළ හැකි ගොවියන් වෙත ඒ කෘෂිකාර්මික ඉඩම් දීම ;

(ආ) සතුටුදායක ලෙස වගා කරනු නොලැබූ කෘෂිකාර්මික ඉඩම්, මේ පනතේ විධිවිධානවලට අනුව වගා කිරීමට හැකි කර වීම ;

(ඇ) අඳ ගොවියන් විසින් වගා කරනු ලබන කුඹුරු ඉඩම්වල අයිතිය මිලට ගැනීම සඳහා ඒ අඳ ගොවියන්ට මුදල් ආධාර සැපයීම ;

(ඈ) ඒ කුඹුරු ඉඩම් වගා කිරීමේ අයිතිය මිලට ගැනීම සඳහා කුඹුරු ඉඩම් අයිතිකරුවන්ට මුදල් ආධාර සැපයීම හා මුදල් සපයා ගැනීමට ආධාර කිරීම.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ඉඩම් බැංකුවක් සංස්ථාපනය කරන තුරු එක් එක් ගොවිජන සංවර්ධන සභාව විසින් ඉඩම් බැංකුවේ කටයුතු ඉටු කරනු ලැබිය යුතු ය. එසේ වුව ද ගොවිජන සංවර්ධන සභාවක් විසින්, ඉඩම් බැංකුවේ කර්තව්‍ය ඉටු කරනු ලබන විට,කොමසාරිස් ජනරාල්ගේ විධානවලට අනුව එය ක්‍රියා කළ යුතු ය.

(3) ඉඩම් බැංකුවේ බලතල හා කටයුතු සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

## III වන කොටස

## කොමසාරිස් ජනරාල්, අතිරේක කොමසාරිස් ජනරාල්, කොමසාරිස්වරුන්, නියෝජ්‍ය කොමසාරිස්වරුන්, සහකාර කොමසාරිස්වරුන් සහ ගොවිජන සංවර්ධන නිලධරයන් පත් කිරීම හා ඔවුන්ගේ බලතල සහ කාර්ය

ගොවිජන කොමසාරිස් ජනරාල්, අතිරේක කොමසාරිස් ජනරාල්, කොමසාරිස්වරුන්, නියෝජ්‍ය කොමසාරිස්වරුන්, සහකාර කොමසාරිස්වරුන් සහ සංවර්ධන නිලධරයන් පත් කිරීම.

**38.** (1) මේ පනතේ කාර්ය සඳහා මේ පනතේ කොමසාරිස් ජනරාල් යනුවෙන් සඳහන් කරනු ලබන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයකු, පත් කරනු ලැබිය යුතු ය. තව ද වෙන යම් පනතක හෝ නියෝගයක ගොවිජන සේවා කොමසාරිස් යන නිල නාමය යොදා ඇති සෑම අවස්ථාවකම ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් අන්වර්ථ වේ.

(2) මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි අතිරේක කොමසාරිස් ජනරාල්වරයකු, කොමසාරිස්වරුන්, නියෝජ්‍ය කොමසාරිස්වරුන්, සහකාර කොමසාරිස්වරුන්, ගොවිජන සංවර්ධන නිලධරයන් සහ වෙනත් නිලධරයන් යම් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය.

(3) අතිරේක කොමසාරිස් ජනරාල් සහ ගොවිජන සංවර්ධන කොමසාරිස්වරු විසින් මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්ගේ බලතල අතුරෙන් කිසිවක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(4) සෑම නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් ම, ඒ නියෝජ්‍ය කොමසාරිස්වරයා පත් කරනු ලැබුවේ යම් ප්‍රදේශයකට ද ඒ ප්‍රදේශය ඇතුළත මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්ගේ බලතල සියල්ලම හෝ ඒ බලතල අතුරෙන් කිසිවක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(5) සෑම සහකාර කොමසාරිස්වරයකු විසින් ම, ඒ සහකාර කොමසාරිස්වරයා පත් කරන ලද්දේ යම් ප්‍රදේශයකට ද ඒ ප්‍රදේශය ඇතුළත, කොමසාරිස් ජනරාල්ගේ බලතල සියල්ල ම හෝ ඒ බලතල අතුරෙන් කිසිවක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(6) මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්ගේ බලතල සියල්ල ම හෝ ඒ බලතල අතුරෙන් කිසිවක් හෝ ක්‍රියාත්මක කිරීමට යම් ගොවිජන සංවර්ධන නිලධරයකුගේ බල ප්‍රදේශය අයත් වන අතිරේක කොමසාරිස් ජනරාල් හෝ කොමසාරිස් හෝ නියෝජ්‍ය කොමසාරිස් හෝ සහකාර කොමසාරිස් හෝ විසින් ප්‍රකාශිතව ම බලය දෙනු ලැබූ සෑම ගොවිජන සංවර්ධන නිලධරයකු විසින් ම, තමා පත් කරනු ලැබ ඇති ප්‍රදේශය ඇතුළත ඒ බලතල එසේ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(7) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ ස්වකීය කාර්ය කිරීමේ දී අතිරේක කොමසාරිස් ජනරාල්, කොමසාරිස්, නියෝජ්‍ය කොමසාරිස්වරු, සෑම සහකාර කොමසාරිස්වරයෙක් සහ සෑම ගොවිජන සංවර්ධන නිලධරයෙක් ම, කොමසාරිස් ජනරාල්ගේ විධානයට හා පාලනයට යටත් විය යුතු ය.

## IV වන කොටස

### ගොවිජන විනිශ්චය සභා පිහිටුවීම

**39.** (1) සෑම පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා හෝ පරිපාලන දිස්ත්‍රික්ක එකක් හෝ වැඩි ගණනක් සඳහා විශ්‍රාම ලත් විනිශ්චයකාරවරුන් හෝ අවුරුදු හතකට වැඩි පළපුරුද්දක් ඇති නීතිඥයන් හෝ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ අවුරුදු හතක පළපුරුද්දක් ලැබූ තැනැත්තන් හෝ අතුරෙන් පත් කරනු ලබන තැනැත්තන් තිදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකගෙන් සමන්විත ගොවිජන විනිශ්චය සභාවක් හෝ වැඩි ගණනක් පත් කරනු ලැබිය හැකි ය. ගොවිජන විනිශ්චය සභාව පිහිටුවීම.

(2) මරණය, ධූරයෙන් ඉල්ලා අස් වීම, ඉවත් කිරීම, ශ්‍රී ලංකාවෙන් බැහැරවීම හෝ අසනීප වීම හේතුකොට ගෙන ගොවිජන විනිශ්චය සභාවක සාමාජිකයකු ධූරය අත් හරින අවස්ථාවක, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(3) ගොවිජන විනිශ්චය සභාවේ සෑම සාමාජිකයකු විසින් ම, තමා කලින් ධූරය අත් හරිනු ලැබුවහොත් මිස, අවුරුදු තුනක කාලයක් සඳහා ධූරය දැරිය යුතු ය.

එසේ වුව ද,

(අ) මිය ගිය, ධූරයෙන් ඉල්ලා අස්වූ හෝ ඉවත් කරනු ලැබූ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලැබූ තැනැත්තකු, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවූ කාල පරිච්ඡේදය සඳහා ධූර දැරිය යුතු ය ; තව ද

(ආ) නොපැමිණි, විදේශගත වූ හෝ අසනීප වූ සාමාජිකයකු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා පත් කරන ලද තැනැත්තකු, ඒ සාමාජිකයා නොපැමිණි හෝ අසනීප වූ කාලපරිච්ඡේදය සඳහා ධූරය දැරිය යුතු ය.

(4) කාලය ගෙවී යාම නිසා ධුරය අත්හැර යන සාමාජිකයකු තැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(5) ගොවිජන විනිශ්චය සභාවක රැස්වීමක් සඳහා ගණපූරණය දෙදෙනකු විය යුතු ය.

(6) සෑම ගොවිජන විනිශ්චය සභාවකට ම ලේකම්වරයකු පත් කරනු ලැබිය හැකි ය.

(7) ගොවිජන විනිශ්චය සභාවක් විසින් යම් සාක්ෂිකරුවකු දිවුරුම් පිට විභාග කිරීම සුදුසු යයි සලකනු ලබන්නේ නම්, විනිශ්චය සභාව විසින් එසේ කරනු ලැබිය හැකි අතර, විනිශ්චය සභාව ඉදිරියේ පෙනී සිටීමට හෝ විනිශ්චය සභාවේ මතය අනුව, විනිශ්චය සභාව විසින් විමසා ගෙන යනු ලබන ඉල්ලීමට, පැමිණිල්ලට හෝ සඳහනට අදාළ විය හැකි ලේඛන කිසිවක් ඉදිරිපත් කිරීමට හෝ යම් තැනැත්තකු කැඳවනු ලැබිය හැකි ය.

(8) ගොවිජන විනිශ්චය සභාවක් විසින් නිකුත් කරන ලද සිතාසියක් භාර දෙන ලද්දේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා-

(අ) සාධාරණ හේතුවක් නොමැතිව ඒ සිතාසියේ සඳහන් වේලාවේ දී සහ ස්ථානයේ දී පෙනී සිටීමට අපොහොසත් වුවහොත් ; හෝ

(ආ) සාධාරණ හේතුවක් නොමැතිව දිවුරුම් දීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ දිවුරුම් දී සාධාරණ හේතුවක් නොමැතිව, ගොවිජන විනිශ්චය සභාවේ සාමාජිකයකු විසින් විමසා ගෙන යනු ලබන කරුණු සම්බන්ධයෙන් වූ යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ එවැනි යම් ප්‍රශ්නයකට හිතාමතාම වැරදි පිළිතුරක් දෙනු ලැබුවහොත් ; හෝ

(ඇ) තම සන්තකයේ හෝ පාලනයේ තමාට ඇත්තා වූ සහ ඉදිරිපත් කළ යුතු යයි නියම කරනු ලැබ ඇත්තා වූ ද යම් ලේඛනයක් සාධාරණ හේතුවක් නොමැතිව විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්,

මේ පනත යටතේ ඔහු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට

නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(9) මේ පනතේ යටතේ ගොවිජන විනිශ්චය සභාවක් වෙත යොමු කරන ලද සියලු ඉල්ලීම්, පැමිණිලි හෝ අභියාචනා ගොවිජන විනිශ්චය සභාව විසින්, විමසා බැලිය යුතු අතර, ඒ පිළිබඳ වූ ස්වකීය තීරණ, ඊට සම්බන්ධ පාර්ශවකරුවන් හා කොමසාරිස් ජනරාල්වරයා වෙත දන්වනු ලැබිය යුතු ය.

(10) (8) වන උපවගන්තියේ දක්වා ඇති ආකාරයට යම් තැනැත්තකු විසින් ක්‍රියා කරනු ලැබ ඇති බවට ගොවිජන විනිශ්චය සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක්, එහි ප්‍රකාශිත කරුණු පිළිබඳ බැලූ බැල්මට ඔප්පු කෙරෙන සාධකයක් වන්නේ ය.

(11) ගොවිජන විනිශ්චය සභාවක් වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම්, පැමිණිලි හෝ අභියාචන කළ යුතු ආකාරය, එවැනි යම් ඉල්ලීමක, පැමිණිල්ලක හෝ අභියාචනයක ඇතුළත් කළ යුතු විස්තර සහ විනිශ්චය සභාවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය දැක්වෙන නියෝග සාදනු ලැබිය හැකි ය.

ගොවිජන විනිශ්චය සභාවේ තීරණය.

**40.** ගොවිජන විනිශ්චය සභාවේ සාමාජිකයන්ගෙන් බහුතරයක් විසින් ගොවිජන විනිශ්චය සභාවේ රැස්වීමක දී ඉල්ලීමක්, පැමිණිල්ලක් හෝ යොමු කිරීමක් මත ගනු ලැබූ තීරණයක් විනිශ්චය සභාවේ තීරණය ලෙස සලකනු ලැබිය යුතු ය.

ගොවිජන විනිශ්චය සභාවේ තීරණය ක්‍රියාත්මක කළ යුත්තේ කෙදිනක ද යන බව.

**41.** (1) එවැනි යම් ඉල්ලීමක්, පැමිණිල්ලක් හෝ අභියාචනයක් කරනු ලබන යම් පාර්ශවකරුවකු විසින් ගොවිජන විනිශ්චය සභාවේ තීරණය පිළිබඳ දැන්වීම තමා වෙත ලැබීමෙන් දින තිහක් ඇතුළත ඒ පිළිබඳ වූ, ගොවිජන විනිශ්චය සභාවේ තීරණයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කරනු නො ලැබූ අවස්ථාවක, ගොවිජන විනිශ්චය සභාවේ තීරණය බලාත්මක කළ යුතු ය.

(2) ගොවිජන විනිශ්චය සභාවේ තීරණය තමා වෙත ලැබීමෙන් දින තිහක් ඇතුළත, එවැනි යම් පාර්ශවකරුවකු විසින් ගොවිජන විනිශ්චය සභාවේ තීරණයට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, අභියාචනාධිකරණයේ තීරණය බලාත්මක කළ යුතු ය.

අභියාචනා කිරීමේ අයිතිය.

**42.** ගොවිජන විනිශ්චය සභාවක් වෙත යොමුකරන ලද යම් ඉල්ලීමක්, පැමිණිල්ලක් හෝ අභියාචනයක් පිළිබඳ වූ එහි තීරණය අවසානාත්මක විය යුතු ය. එසේ වුවද, ඒ තීරණය තමා වෙත ලැබීමෙන් දින තිහක් ඇතුළත, අතෘප්තියට පත් පාර්ශ්වකරුවකු විසින්, නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

## V වන කොටස

### ගොවි සංවිධානවල ආයතනික ව්‍යුහය

ගොවි සංවිධාන පිහිටුවීම.

**43.** (1) කොමසාරිස් ජනරාල් විසින් නිශ්චය කරනු ලබන යම් ප්‍රදේශයක් සඳහා ගොවි සංවිධාන එකක් හෝ වැඩි ගණනක් පිහිටුවනු ලැබිය හැකි අතර, ඒවායේ සාමාජිකයන් වීමට සුදුසුකම් ලත් තැනැත්තන්ගෙන් ඒ ගොවි සංවිධාන සමන්විත විය යුතු ය.

(2) ගොවි සංවිධානයක් විසින් ලියාපදිංචි කිරීම සඳහා තමා වෙත ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, කොමසාරිස් ජනරාල් විසින් ඒ ගොවි සංවිධානය ලියාපදිංචි කරනු ලැබිය යුතු ය. ලියාපදිංචි කරනු ලැබූ විට, කොමසාරිස් ජනරාල් විසින් ඒ ගොවි සංවිධානයට අංකයක් නියම කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, වාරිමාර්ග යෝජනා ක්‍රමයක් යටතේ වූ යම් ප්‍රදේශයක් සඳහා හෝ රාජ්‍ය සංස්ථාවක බල ප්‍රදේශයක් යටතට පත් වන යම් ප්‍රදේශයක් සඳහා හෝ කොමසාරිස් ජනරාල් විසින් ගොවි සංවිධානයක් ලියාපදිංචි කිරීම, අවස්ථාවෝචිත පරිදි වාරිමාර්ග කටයුතු හෝ ඒ රාජ්‍ය සංස්ථාව භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟත්වය ඇතිව හැර කරනු නොලැබිය යුතු ය.

(3) ලියාපදිංචි කරනු ලැබූ සෑම ගොවි සංවිධානයක් ම අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, සංස්ථා නාමයෙන්, එය විසින් නඩු පැවරීම සහ එයට විරුද්ධව නඩු පවරනු ලැබීම කළ හැකි ය.

(4) කෘෂිකර්මය තම ජීවිකාව කර ගත් සෑම තැනැත්තකු ම, තමා-

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නම් ;

(ආ) වයස අවුරුදු දහසයට නොඅඩු නම් ; සහ

(ඇ) තමා සාමාජිකත්වය අපේක්ෂා කරන ගොවි සංවිධාන බල ප්‍රදේශයේ පදිංචි වී ඇත්නම් හෝ අවුරුදු දෙකකට වැඩි කාල පරිච්ඡේදයක් සඳහා ඒ බල ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතුවල නිරතව සිටියේ නම්,

(1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද ගොවි සංවිධානයක සාමාජිකත්වය සඳහා සුදුස්සකු විය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද ගොවි සංවිධානයක ආශ්‍රිත සාමාජිකත්වය-

(අ) තම ප්‍රධාන ජීවිකාව කෘෂිකර්මය නොවන්නා වූ ද ගොවි සංවිධානයක බල ප්‍රදේශය ඇතුළත කෘෂිකාර්මික ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරු ; නැතහොත්

(ආ) කෘෂිකර්මයට අදාළ යම් නිෂ්පාදනයක හෝ කෘෂිකාර්මික නිෂ්පාදන හෝ භාණ්ඩ අලෙවියෙහි නිරත වූ යම් තැනැත්තකු විසින්,

ලබා ගත හැකි ය.

(6) සෑම ගොවි සංවිධානයක් විසින් ම, ස්වකීය නිලධරයන් තෝරා ගනු ලැබිය යුතු ය. නිලධරයන් තෝරා ගනු ලබන ආකාරය, ඔවුන්ගේ ධුර කාලය, සංවිධාන රැස්වීම්වල කටයුතු කර ගෙන යන ආකාරය, සංවිධාන කර්තව්‍ය, සංවිධානවල ගිණුම් පවත්වා ගෙන යාම සහ ඒ ගිණුම් විගණනය සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(7) මේ වගන්තිය යටතේ ගොවි සංවිධානයක සාමාජිකයන් වශයෙන් බඳවා ගැනීම සඳහා නුසුදුසු තැනැත්තන් නිරීක්ෂකයන් වශයෙන් බඳවා ගැනීම සඳහා සුදුස්සන් විය යුතු ය.

(8) මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය වූ විටෙක, යම් ගොවි සංවිධානයක් විසින්, එහි බල ප්‍රදේශය ඇතුළත හෝ එහි සාමාජිකයන්ගේ කෘෂිකාර්මික ඉඩම්වල, ඉඩම් හිමි ගොවීන්ගේ සහ එහි බුක්තිකරුවන්ගේ රැස්වීම් කැඳවනු ලැබිය හැකි ය.

(9) ගොවි සංවිධානයක සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක් සෑම අවුරුද්දකටම එක්වරක් කැඳවනු ලැබිය යුතු ය. සෑම අවුරුදු දෙකකට වරක්වත් මහා සභා රැස්වීමක් කැඳවීමට

ගොවි සංවිධානයක් අපොහොසත්වන අවස්ථාවක, ඒ රැස්වීම කැඳවීමේ බලය ඒ ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන සභාවට තිබිය යුතු ය.

(10) ගොවි සංවිධානයක කමිටුව තෝරා පත් කර ගනු ලබන ආකාරය, එහි සාමාජිකයන්ගේ ධුර කාල, ගොවි සංවිධානයේ රැස්වීම්වල කටයුතු කිරීම, කමිටු සාමාජිකයන් ඉවත් කිරීම හා ඉල්ලා අස් වීම, ගොවි සංවිධානයක කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම, ගොවි සංවිධානයේ රැස්වීමක ගණපූරණය, ගොවි සංවිධානයක සාමාජිකයන් බඳවා ගැනීම, සාමාජික ගාස්තු අය කර ගැනීම, ඉඩම් හිමි ගොවීන්ගේ හා බුක්තිකරුවන්ගේ හෝ සාමාජිකයන්ගේ රැස්වීම් කැඳවීම සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය දක්වමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

ගොවි සංවිධානවල ගිණුම් කොමසාරිස් ජනරාල් විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි බව.

44. (1) කොමසාරිස් ජනරාල් හෝ ඒ සඳහා සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙන ලද නියෝජිතයකු සෑම ගොවි සංවිධානයක ම ගිණුම් පරීක්ෂා කිරීමට හිමිකම ලැබිය යුතු ය.

(2) ගොවි සංවිධානයක අරමුදල් නියමිත බැංකුවක ගිණුම්වල තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) ගොවි සංවිධානයක ගිණුම් පවත්වා ගෙන යා යුතු ආකාරය සහ ඒ ගිණුම් පවත්වා ගෙන යාම සඳහා වගකිව යුතු තැනැත්තන් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

ණය පහසුකම් ලබා ගැනීමේ බලය ගොවි සංවිධානවලට තිබිය යුතු බව.

45. (1) සෑම ගොවි සංවිධානයක් විසින් -

(අ) නියමිත බැංකු හෝ රාජ්‍ය ආයතනවලින් ණය හෝ අත්තිකාරම් ලබා ගැනීම ;

(ආ) නියමිත කාල පරිච්ඡේදයක් ඇතුළත ණය ආපසු අය කර ගැනීමේ හා ආපසු ගෙවීමේ පදනම මත හවුල් ණය යෝජනාක්‍රම යටතේ තම සාමාජිකයන් සඳහා නියමිත බැංකුවලින් හෝ ණය ආයතනවලින් ණය ලබා ගැනීම ;

(ඇ) යම් වංචල හෝ නිශ්චල දේපළක් අත් කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ ඔප්පනය කිරීම ;

(ඇ) ගොවි සංවිධානයක මුදල්, එහි කාර්ය කිරීමෙහි ලා ප්‍රයෝජනයට ගැනීම ;

(ඉ) ස්වකීය සාමාජිකයන් වෙත ණය දීම සඳහා ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී මුදල් ප්‍රයෝජනයට ගැනීම,

කරනු ලැබිය හැකි ය.

(2) ගොවි සංවිධානයක් විසින් තම සාමාජිකයන්ගෙන් තැන්පතු ලබා ගෙන, තම සාමාජිකයන් වෙත ණය දීම සඳහා ඒ තැන්පතු ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි ය.

(3) ගොවි සංවිධානයක සාමාජිකයකු විසින්, සංවිධානයේ තැන්පත් කරන ලද මුදල් කිසිවක් ආපසු ලබා ගැනීමට තමා අදහස් කරන බවට දින දාහතරක දැනුම් දීමක් සංවිධානය වෙත ලැබූ විටෙක ගොවි සංවිධානය විසින් ඒ සාමාජිකයා වෙත එසේ තැන්පත් කරන ලද මුදල්, ඊට අයත් පොළිය ද සමඟ ගෙවනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය මගින් පැවරුණු බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ආකාරය නියම කෙරෙමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

කුඩා ගොවි කණ්ඩායම්.

**46.** කුඩා ගොවි කණ්ඩායම් විසින් කර ගෙන යනු ලබන කෘෂිකාර්මික කටයුතු හෝ ඔවුන් අතර පවත්නා සම්බන්ධතා සැලකිල්ලට ගනිමින්, ඔවුනට එක්ව සංවිධානය වීමට ඔවුන් ධෛර්යමත් කිරීම ගොවි සංවිධානයක කාර්ය වන්නේ ය.

ගොවි සංවිධානයක් විසින් ගොවිජන සංවර්ධන සභාවට සාමාජිකයකු පත් කළ යුතු බව.

**47.** ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයක පිහිටුවන ලද සෑම ලියාපදිංචි කරන ලද ගොවි සංවිධානයක් විසින් ම, ඒ ප්‍රදේශය සඳහා පිහිටුවන ලද ගොවිජන සංවර්ධන සභාවක ස්වකීය සාමාජිකත්වය නියෝජනය කිරීම සඳහා නියෝජිතයකු හෝ නියෝජිතයන් තෝරා පත් කරනු ලැබිය යුතු ය.

ගොවි සංවිධානය ගොවිජන සංවර්ධන සභාවට සහාය විය යුතු බව.

**48.** සෑම ගොවි සංවිධානයක් විසින් ම ගොවිජන සංවර්ධන සභාවට පහත සඳහන් ආකාරයෙන් සහාය විය යුතු ය :-

(අ) ස්වකීය බල ප්‍රදේශය ඇතුළත කෘෂිකාර්මික ඉඩම්වල ඉඩම් හිමි ගොවීන් සහ භුක්තිකරුවන් මේ පනතේ විධිවිධානවලට අනුකූලව ස්වකීය කෘෂිකාර්මික ඉඩම් වගා කිරීමට පෙළඹවීමෙන් සහ එක් එක් කන්නය

සඳහා කුඹුරු ඉඩම් වගා කිරීම සඳහා වැඩ සටහන් සකස් කිරීමෙන්, සහ ගොඩබිම් වගා කිරීම සඳහා වාර්ෂික වැඩ සටහන් සකස් කිරීමෙන් ;

(ආ) ස්වකීය බල ප්‍රදේශය ඇතුළත සතුටුදායක ලෙස වගා කරනු නොලබන කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ තොරතුරු එකතු කිරීමෙන් හා වාර්තා ඉදිරිපත් කිරීමෙන් ;

(ඇ) ස්වකීය බල ප්‍රදේශය තුළ කෘෂිකාර්මික ඉඩම්, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ කෘෂිකාර්මික සත්ත්වයන් පිළිබඳ දත්ත එකතු කිරීමෙන් හා ඒ දත්ත ගොවිජන සංවර්ධන සභාවට සැපයීමෙන් ;

(ඈ) ස්වකීය බල ප්‍රදේශය ඇතුළත පස සංරක්ෂණය, කාර්යක්ෂම ජල පරිහරණය, කොම්පෝස්ට් පොහොර භාවිතය ධෛර්යමත් කිරීමෙන් හා ඒ ප්‍රදේශය සඳහා නිර්දේශිත කෘෂිකාර්මික භෝග වගාව නිර්දේශ කිරීමෙන් සහ ඒ ප්‍රදේශය සඳහා ඉතාමත් ම සුදුසු ඇති කරන සතුන් වර්ග බෝ කිරීමෙන් හෝ මිරිදිය මත්ස්‍යයන් වගාකිරීමෙන් ;

(ඉ) එම බෝග හා සතුන් හෝ මිරිදිය මත්ස්‍යයන් රෝගවලින් හා වසංගතවලින් මිදී ඇති බවට වග බලා ගැනීම සඳහා පියවර ගැනීමෙන් ;

(ඊ) ස්වකීය බල ප්‍රදේශය තුළ ඉඩම් හිමි ගොවීන්ට, බුක්තිකරුවන්ට හා කෘෂිකාර්මිකයන්ට දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමෙන් හා පාරිසරික වශයෙන් හිතකර ක්‍රම යොදා ගැනීම සඳහා ඔවුන් ධෛර්යමත් කිරීමෙන්.

ගොවි සංවිධාන විසින් ගොවිජන සංවර්ධන සභාවට ඉඩම්හිමි ගොවීන්ගේ හා බුක්තිකරුවන්ගේ තොරතුරු ඉදිරිපත් කළ යුතු බව.

**49.** (1) සෑම ලියාපදිංචි ගොවි සංවිධානයක් විසින් ම, ස්වකීය බල ප්‍රදේශය තුළ කෘෂිකාර්මික ඉඩම්වල අයිතිකාර ඉඩම් හිමි ගොවීන්ගේ හා බුක්තිකරුවන්ගේ තොරතුරු ගොවිජන සංවර්ධන සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) ලියාපදිංචි ගොවි සංවිධානයක් විසින් කෘෂිකර්මයට අදාළ භාණ්ඩ හා සේවා සැපයීමෙහි නිරත වීම නීත්‍යනුකූල වන්නේ ය.

ලියාපදිංචි වීම අවලංගු කිරීම.

50. (1) ගොවි සංවිධානයක් ලියාපදිංචි කිරීම අවලංගු කිරීම සහ එහි කටයුතු ගණන් බේරා වසාදැමීම සඳහා ඈවරකරුවකු හෝ ඈවරකරුවන් පත් කිරීම :-

(අ) ඒ ගොවි සංවිධානයේ සාමාජික සංඛ්‍යාව විසි පහකට අඩු වේ නම් ;

(ආ) ගොවි සංවිධානය ලියාපදිංචි කිරීමේ දින පටන් එක් අවුරුද්දක් ඉක්මවන කාල පරිච්ඡේදයක් එය ක්‍රියාත්මක නොවී ඇත්නම් ; හෝ

(ඇ) ගොවි සංවිධානයේ පරමාර්ථවලට පටහැනිව ගොවි සංවිධානය කටයුතු කර ඇති බව හෝ එහි සාමාජිකයන්ගේ සුභ සාධනය සඳහා කටයුතු කිරීමට අපොහොසත් වී ඇති බව ප්‍රකාශ කරමින් ඒ ගොවි සංවිධානයේ සාමාජික සංඛ්‍යාවෙන් හතරෙන් එකකට නොඅඩු සංඛ්‍යාවක් විසින්, කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරනු ලබන්නේ නම්,

කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(2) එම අවලංගු කිරීම පිළිබඳ නිවේදනය, පිළිවෙළින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සංසරණය වන ප්‍රවෘත්ති පත්‍රයක පළ කරනු ලැබිය යුතු ය.

(3) සංවිධානයේ කටයුතු ගණන් බේරා වසා දැමීම සඳහා පත් කරන ලද ඈවරකරුවාට හෝ ඈවරකරුවන්ට–

(අ) සංවිධානයේ ණය හිමියන් අතර ප්‍රමුඛතාව අදාළ යම් ප්‍රශ්නයක් තීරණය කිරීමේ ;

(ආ) සංවිධානයේ දේපළ විකිණීමේ ;

(ඇ) කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව, සංවිධානය විසින් හෝ ඊට එරෙහිව හිමිකම් පෑම් කිසිවක් සමථයකට පත් කිරීමේ ;

(ඈ) සංවිධානයේ වත්කම් නියමිත ආකාරයෙන් බෙදා හැරීම සඳහා කටයුතු කිරීමේ

බලය ඇත්තේ ය.

(4) සංවිධානය ඈවර කිරීමේ දී එහි අරමුදල ඈවර කිරීමේ වියදම පියවීම සඳහා ප්‍රථමයෙන් යෙදවිය යුතු අතර, ඉක්බිතිව, එහි බැරකම්වලින් නිදහස් වීම සඳහා යෙදවිය යුතු ය. ඈවර කිරීම නිම කිරීමෙන් පසුව, ඉතිරි වන යම් අතිරික්තයක් ගොවිජන සංවර්ධන අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

## VI වන කොටස

### ගොවිජන සංවර්ධන සභා

ගොවිජන සංවර්ධන සභා පිහිටුවීම.

**51.** (1) කොමසාරිස් ජනරාල් විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් ප්‍රදේශයක් සඳහා ගොවිජන සංවර්ධන සභාවක් සංස්ථාපනය කරනු ලැබීමටත් ගොවිජන කේන්ද්‍රයක් පිහිටුවීමටත් ක්‍රියා කළ යුතු ය. ඒ සභාවේ කාර්යාලය ඒ ගොවිජන කේන්ද්‍රයේ පිහිටුවනු ලැබිය යුතු ය.

(2) සෑම ගොවිජන සංවර්ධන සභාවක් ම අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එහි සංස්ථා නාමයෙන් එය විසින් නඩු පැවරීම හෝ එයට විරුද්ධව නඩු පැවරීම කරනු ලැබිය හැකි ය.

(3) සෑම ගොවිජන සංවර්ධන සභාවක් ම–

(i) ඒ සභාව පිහිටුවන ලද්දේ යම් ගොවිජන සංවර්ධන ප්‍රදේශයක් සඳහා ද ඒ ගොවිජන සංවර්ධන ප්‍රදේශය තුළ මේ පනත යටතේ පිහිටුවන ලද එක් එක් ගොවි සංවිධානයක් යටත් පිරිසෙයින් එක් නියෝජිතයකුගෙන් ; සහ

(ii) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු හා රාජ්‍ය සංස්ථා නියෝජනය කිරීම සඳහා, ඒ ගොවිජන සංවර්ධන ප්‍රදේශය තුළ කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි නියැලි, කොමසාරිස් ජනරාල් විසින් පත් කරන ලද තැනැත්තන්ගෙන්

සමන්විත විය යුතු ය.

(4) කොමසාරිස් ජනරාල් විසින් (3) වන උපවගන්තියේ (ii) වන ඡේදය යටතේ ගොවිජන සංවර්ධන සභාවක සාමාජිකයකු ලෙස පත් කරන ලද තැනැත්තකුට, ඒ සභාවේ යම් රැස්වීමක දී ඡන්දය දීමේ බලය නැත්තේ ය.

(5) ගොවිජන සංවර්ධන සභාවක සාමාජිකයකුගේ ධුර කාලය අවුරුදු දෙකක් විය යුතු වුව ද, කාලය ඉකුත්වීම නිසා ධුරය අත්හරින සාමාජිකයකු නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(6) (අ) (3) (1) වන උපවගන්තිය යටතේ ගොවිජන සංවර්ධන සභාවක සාමාජිකයකු වශයෙන් පත් කරන ලද තැනැත්තකු විසින් තමා නියෝජනය වන ගොවිජන සංවර්ධන සභාව වෙත, කොමසාරිස් ජනරාල් සහ ගොවි සංවිධානය වෙත අමතන ලද ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(ආ) ගොවි සංවිධානයක නියෝජිතයකු ධුරය අත්හරින අවස්ථාවක, ගොවි සංවිධානය විසින්, ඔහු වෙනුවට, වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(ඇ) එසේ පත් කරනු ලැබූ සාමාජිකයා තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයේ ඉකුත් නොවූ කාල පරිච්ඡේදය සඳහා ධුරය දැරිය යුතු ය.

(ඈ) ගොවිජන සංවර්ධන සභාවක සාමාජිකයකු සාධාරණ හේතුවක් නොමැතිව, ඒ සභාවේ අනුගාමී රැස්වීම් තුනකට සහභාගිවීමට අපොහොසත් වුවහොත් එම සභාව විසින්,-

(i) ඔහු (3) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සාමාජිකයකු වේ නම් ඔහුගේ පත්වීම අවසන් කර, ඒ සාමාජිකයා නියෝජනය කළ ගොවි සංවිධානය වෙත එම අවසන් කිරීම පිළිබඳව ලියවිල්ලකින් දැනුම් දිය යුතු අතර, ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය ;

තවද,

(ii) ඔහු (3) (ii) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සාමාජිකයකු වේ නම්, ඒ අවසන් කිරීම පිළිබඳව කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දිය යුතු අතර, ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(7) ගොවිජන සංවර්ධන සභාවේ සභාපති පත් කිරීම, සභාපතිගේ කාර්ය, ස්ථාවර කාරක සභා පත් කිරීම සහ ලේකම් හා භාණ්ඩාගාරික කෝරා පත් කර ගැනීම පිළිබඳව නියෝග සාදනු ලැබිය හැකි ය.

ගොවිජන සංවර්ධන සභාවේ කර්තව්‍ය.

52. (1) සෑම ගොවිජන සංවර්ධන සභාවක් විසින් ම, සෑම වගා කන්නයකට පෙරාතුව ම, ගොවිජන සංවර්ධන ප්‍රදේශයක් සඳහා කෘෂිකාර්මික වැඩ සටහනක් පිළියෙල කරනු ලැබිය යුතු අතර, අවශ්‍ය සංවර්ධන සැලසුම් පිළියෙල කළ යුතු ය. තවද, එහි පිටපතක් ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව ගොවිජන සංවර්ධන සභාවකට–

(i) යම් ඇංවල හෝ තිස්වල දේපළක් අත්කරගැනීමේ, දැරීමේ, බද්දට හෝ කුලියට ගැනීමේ හෝ දීමේ, උකස් කිරීමේ, ඔඩපනය කිරීමේ, විකිණීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ ;

(ii) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, එහි බල ප්‍රදේශය ඇතුළත යම් කෘෂිකාර්මික ඉඩමක ඉඩම් හිමි ගොවීන්ට හෝ බුක්තිකරුවන්ට ඒ කෘෂිකාර්මික ඉඩමේ ප්‍රමාණය මත පදනම් වූ අක්කර බද්දක් පැනවීමේ හා අයකර ගැනීමේ ද මේ පනත යටතේ කරන ලද සේවාවන් වෙනුවෙන් වෙනත් ගාස්තු අයකර ගැනීමේ ;

(iii) ගොවි ජනතා සමාගම් පිහිටුවීමේ ;

(iv) ගොවි ජනතා සමාගම්වල කොටස් මිලට ගැනීමේ ;

(v) ගොවි වෙළඳපොලවල් පවත්වාගෙන යාම සඳහා ගොවියන්ට සහාය වීමේ හා ඔවුන් දිරි ගැන්වීමේ ;

(vi) ගොවි සංවිධාන හා කුඩා ගොවි කණ්ඩායම් ප්‍රවර්ධනය කිරීමේ ;

(vii) වැඩමුළු මගින් ගොවි සංවිධානවලට සහ කුඩා ගොවි කණ්ඩායම් දැනුවත් කිරීමේ ;

(viii) නියමිත බැංකුවලින් හෝ රාජ්‍ය ආයතනවලින් ණය ලබාගන්නා ලියාපදිංචි ගොවි සංවිධාන වෙනුවෙන් ඇපකරුවකු වශයෙන් ක්‍රියා කිරීමේ ;

(ix) කොමසාරිස් ජනරාල් අනුමත කර ඇති පරිදි, ලියාපදිංචි ගොවි සංවිධානවලට මුදල් අත්තිකාරම් දීමේ ;

(x) ස්වකීය බල ප්‍රදේශය ඇතුළත ලියාපදිංචි ගොවි සංවිධානවලට හෝ කුඩා ගොවි කණ්ඩායම්වලට හෝ කෘෂිකාර්මික ඉඩම්වල ඉඩම් හිමි ගොවීන්ට හෝ බුක්තිකරුවන්ට ණය දීමේ ;

(xi) කෘෂිකාර්මික කටයුතුවල නිරත වූ වාණිජ සංවිධානවල හෝ සමාගම්වල අනුයෝජිතයින් වශයෙන් ක්‍රියා කිරීමේ ;

(xii) කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ ;

(xiii) නියමිත බැංකුවක ගිණුමක් පවත්වා ගෙන යාමේ හා කොමසාරිස් ජනරාල් විසින් කලින් කල නිකුත් කරනු ලබන උපදෙස්වලට අනුකූලව ඒ ගිණුම ක්‍රියාත්මක කිරීමේ ;

(xiv) ස්වකීය බල ප්‍රදේශය ඇතුළත වාරිමාර්ග කටයුතු අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා එහි අරමුදල් යෙදවීමේ ;

(xv) කෘෂිකර්මය සංවර්ධනය කිරීමේ අදහසින් නිලධරයන් හා ගොවියන් පුහුණු කිරීම සඳහා මූලාධාර සැපයීමේ

බලය ඇත්තේ ය.

**53.** (1) සෑම ගොවිජන සංවර්ධන සභාවක් විසින් ම, ස්වකීය බල ප්‍රදේශය ඇතුළත කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ ලේඛනයක් පිළියෙල කරනු ලැබ සංශෝධනය සහ ප්‍රතිශෝධනය කර, පවත්වා ගත යුතු ය : කෘෂිකාර්මික ඉඩම් ලේඛන.

එසේ වුව ද, එම සභාවේ බල ප්‍රදේශය ඇතුළත කෘෂිකාර්මික ඉඩම්වලට අදාළ පළමුවන ලේඛනය කොමසාරිස් ජනරාල් විසින් පිළියෙල කර, සහතික කරනු ලැබිය යුතු ය.

(2) එවැනි සෑම ලේඛනයක් ම එක් එක් කෘෂිකාර්මික ඉඩමේ නම හා ප්‍රමාණය, ඉඩම් හිමියාගේ, අවස්ථාවෝචිත පරිදි, බුක්තිකරුගේ හෝ ඉඩම් හිමි ගොවියාගේ නම සහ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් විස්තර ඇතුළත් විය යුතු ය.

(3) කෘෂිකාර්මික ඉඩම් ලේඛනයක ඇතුළත් කුඹුරු ඉඩම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් අලුත් අඳ ගොවියකුගේ නම ඇතුළත් කිරීමෙන් ලේඛනය සංශෝධනය කිරීම සඳහා වූ ඉල්ලීමක් කොමසාරිස් ජනරාල් වෙත ලියවිල්ලකින් කරනු ලැබිය යුතු අතර, ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය සම්බන්ධයෙන් ඉල්ලුම්කරු අඳ ගොවියා වශයෙන් ලියාපදිංචි කිරීමට කැමැත්ත දෙමින් අයිතිකරුගෙන් ලිපියක් ඊ සමඟ ඉදිරිපත් කළ යුතු ය. තව ද, කොමසාරිස් ජනරාල් විසින් ඊ පිළිබඳව නියමයක් කරනු ලැබිය යුතු ය.

(4) (අ) මේ පනත ආරම්භ වීමේ දිනයෙන් පසුව, සෑම අවුරුදු තුනකට වරක් සෑම ලේඛනයක් ම කොමසාරිස් ජනරාල් විසින් පරීක්ෂා කර සහතික කරනු ලැබිය යුතු ය.

(ආ) ලේඛනය සෑම අවුරුද්දක ම ජනවාරි සහ ජූලි මාසවල දී මහජන පරීක්ෂණය සඳහා විවෘතව තැබිය යුතු ය.

(5) කෘෂිකාර්මික ඉඩම පිහිටා ඇති ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන කෘෂිකාර්මික ඉඩම් ලේඛනයෙහි, කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් ඇතැම් තොරතුරු ඇතුළත් කර නොමැති බවට කොමසාරිස් ජනරාල් සෑහීමට පත් වූ විට, පීඩාවට පත් වූ පාර්ශ්වකරුවන් කිසිවකුට පවත් දීමෙන් පසුව, ඒ කෘෂිකාර්මික ඉඩමට අදාළ විස්තර කෘෂිකාර්මික ඉඩම් ලේඛනයෙහි ඇතුළත් කිරීමේ බලය කොමසාරිස් ජනරාල්ට ඇත්තේ ය.

(6) මේ වගන්තියේ විධිවිධාන යටතේ පිළියෙල කරනු ලැබූ හෝ සංශෝධනය කරනු ලැබූ හෝ ප්‍රතිශෝධනය කරනු ලැබූ තත් කාලයෙහි බලාත්මකව පවත්නා වූ ද ලේඛනයක සටහනක් සාක්ෂිවල දී ආවේශ්‍ය කරනු ලැබිය යුතු අතර, එහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පිළිගත හැකි සාධකයක් වන්නේ ය.

(7) කෘෂිකාර්මික ඉඩම් ලේඛනය සංශෝධනය කිරීම සඳහා වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් කරන ලද නියමයක් මගින් අතෘප්තියට පත් තැනැත්තා විසින් ඉඩම පිහිටි ප්‍රදේශයේ ගොවිජන විනිශ්චය සභාව වෙත, ගොවිජන සංවර්ධන සභාව වෙත පිටපතක් ද සහිත ලියවිල්ලකින් වූ අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(8) කෘෂිකාර්මික ඉඩම් ලේඛනය සංශෝධනය කිරීම පිළිබඳව ඒ අභියාචනය සම්බන්ධයෙන් ගොවිජන විනිශ්චය සභාවේ ආඥාව අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

(ii) (1) වන වගන්තියේ සඳහන් ලේඛනය පිළියෙල කිරීමේ දී හෝ සංශෝධනය කිරීමේ දී හෝ පවත්වාගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, සංශෝධන පිළිබඳ අභියාචනා සම්බන්ධයෙන් සහ තට්ටුමාරු/කට්ටිමාරු කුඹුරු ඉඩම් ලේඛනය පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ කාර්ය පරිපාටිය පිළිබඳව නියෝග සාදනු ලැබිය හැකි ය.

කෘෂිකාර්මිකයන් විසින් ගොවිජන සංවර්ධන සභාවට තොරතුරු දිය යුතු බව.

54. (1) පැම කෘෂිකාර්මික ඉඩමකම ඉඩම් හිමි ගොවියා හෝ බුක්තිකරු විසින්, ඒ ඉඩම පිහිටි බල ප්‍රදේශය ඇතුළත වූ ගොවිජන සංවර්ධන සභාව වෙත, එම කෘෂිකාර්මික ඉඩම පිළිබඳ නියමිත විස්තර, එහි අයිතිය, නත් කාලයේ පදිංචිය සහ එම සභාව විසින් සඳහන් කරනු ලැබිය හැකි යම් කාල පරිච්ඡේදයක් ඇතුළත කර ගෙන ගිය සියලු කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

(2) යම් ඉඩම් හිමි ගොවියකු හෝ බුක්තිකරුවකු (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වී ඇතැයි ගොවිජන සංවර්ධන සභාව විසින් කොමසාරිස් ජනරාල් වෙත දන්වනු ලැබ ඇති අවස්ථාවක, කොමසාරිස් ජනරාල් විසින්, ඒ ප්‍රදේශය සඳහා පිහිටුවන ලද ගොවිජන විනිශ්චය සභාව ලවා පරීක්ෂණයක් පැවැත්වීමට සලස්වනු ලැබිය යුතු ය.

(3) ඉඩම්. හිමි ගොවියා හෝ බුක්තිකරු විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කර ඇත්ද යන බව ගොවිජන විනිශ්චය සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, ගොවිජන විනිශ්චය සභාව විසින් ස්වකීය තීරණය පිළිබඳව ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලියවිල්ලක් මගින් කොමසාරිස් ජනරාල් හා ගොවිජන සංවර්ධන සභාව වෙත දන්වනු ලැබිය යුතු ය. ඉඩම් හිමි ගොවියකු හෝ බුක්තිකරුවකු විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරනු ලැබ ඇතැයි ගොවිජන විනිශ්චය සභාව විසින් නිශ්චය කරනු ලැබ ඇති අවස්ථාවක, ගොවිජන සංවර්ධන සභාවට රුපියල් එක් දහසක දඩයක් ගෙවිය යුතු යයි ඔහුට නියම කරනු ලැබිය හැකි ය.

(4) යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය යටතේ තමා වෙත නියම කරන දඩ මුදල ගෙවීම පැහැර හරිනු ලැබුවහොත්, ගොවිජන සංවර්ධන සභාව විසින් හෝ ඒ වෙනුවෙන් බලය දෙන ලද යම් නිලධරයකු විසින් ඒ කෘෂිකාර්මික ඉඩම

පිහිටි අධිකරණ බල ප්‍රදේශයේ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත, එම මුදල අධිකරණය විසින් නියම කරන ලද දඩයක ආකාරයෙන් අය කර ගැනීම සඳහා ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර, එසේ අය කර ගනු ලැබූ මුදල් ප්‍රමාණය ගොවිජන සංවර්ධන සභාවට ගෙවනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කිරීම සම්බන්ධයෙන් එහි සඳහන් තැනැත්තාගෙන් යම් මුදල් ප්‍රමාණයක් ගොවිජන සංවර්ධන සභාවට අය විය යුතු බවට ගොවිජන විනිශ්චය සභාවෙන් ලබා ගත් සහතිකයක්, ඒ මුදල් ප්‍රමාණය ඒ තැනැත්තාගෙන් ගොවිජන සංවර්ධන සභාවට අය විය යුතු බවට බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් වන්නේ ය.

කෘෂිකාර්මික ඉඩම් මැනීම.

55. (1) කොමසාරිස් ජනරාල්ගේ විධානවලට අනුකූලව සෑම ගොවිජන සංවර්ධන සභාවක් විසින් ම, ස්වකීය බලප්‍රදේශය ඇතුළත කෘෂිකාර්මික ඉඩම් මැනීමට සැලැස්විය යුතු ය.

(2) ගොවිජන සංවර්ධන සභාවක් විසින්, ස්වකීය බලප්‍රදේශය ඇතුළත කෘෂිකාර්මික ඉඩම් මැනීමේ අනුපාතික වියදම්, ඒ කෘෂිකාර්මික ඉඩම්වල අයිතිකරුවන්ගෙන් හෝ බුක්තිකරුවන්ගෙන් අය කර ගනු ලැබිය හැකි අතර, ඒ ගෙවීම් කිරීම ඒ අයිතිකරුවන්ගේ හා බුක්තිකරුවන්ගේ කාර්යය විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ තමා විසින් ගෙවීමට නියමිත මිනුම් ගාස්තු ගෙවීම, යම් තැනැත්තකු විසින් පැහැර හැරීම පිළිබඳව ගොවිජන සංවර්ධන සභාව විසින් කොමසාරිස් ජනරාල් වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබූ විට, ඔහු විසින් ඒ පැහැර හැරීම සම්බන්ධයෙන් ප්‍රදේශයේ ගොවිජන විනිශ්චය සභාව ලවා පරීක්ෂණයක් පැවැත්වීමට සලස්වනු ලැබිය යුතු ය.

(4) යම් තැනැත්තකු, (2) වන උපවගන්තිය යටතේ තමා විසින් ගෙවීමට නියමිත මිනුම් ගාස්තු ගෙවීම පැහැර හැර ඇති බවට ගොවිජන විනිශ්චය සභාව විසින් නිශ්චය කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ ගාස්තු නිශ්චිත දිනයකට පෙර ගොවිජන සංවර්ධන සභාවට ගෙවිය යුතු යයි විනිශ්චය සභාව විසින් ඒ තැනැත්තාට ආඥා කරනු ලැබිය යුතු ය. එම ආඥාවේ පිටපත් කොමසාරිස් ජනරාල් සහ ගොවිජන සංවර්ධන සභාව වෙත යැවිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ නමා විසින් ගෙවිය යුතු යයි ආඥා කරන ලද ගාස්තු ගෙවීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා වාසය කරන අධිකරණ බල ප්‍රදේශය අයත් වන්නා වූ මහෙස්ත්‍රාත් අධිකරණය විසින් පනවන ලද දඩයක ආකාරයෙන් එම ගාස්තු අය කර ගැනීම සඳහා ගොවිජන සංවර්ධන සභාව විසින් හෝ ඒ සභාව විසින් ඒ සඳහා බලය දෙන ලද යම් නිලධරයකු විසින් හෝ ඒ අධිකරණය වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි අතර, එසේ අයකර ගනු ලබන ගාස්තු ගොවිජන සංවර්ධන සභාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

(6) එහි සඳහන් මුදල් ප්‍රමාණය එහි සඳහන් තැනැත්තා විසින් මිනුම් ගාස්තු වශයෙන් ගොවිජන සංවර්ධන සභාවට ගෙවීමට නියමිතව ඇති බවට ගොවිජන විනිශ්චය සභාවෙන් ලබා ගත් සහතිකයක් එහි ප්‍රකාශිත කරුණු පිළිබඳ බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් විය යුතු ය.

අක්කර බද්ද අයකර ගැනීම.

**56.** (1) සෑම කෘෂිකාර්මික ඉඩමක් සඳහා ම නියම කරනු ලබන අක්කර බදු මුදල් කෘෂිකාර්මික ඉඩමක සෑම අයිතිකරුවකු හෝ බුක්තිකරුවකු විසින් ම, එම බද්ද එක් එක් වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දින හෝ ඊට පෙර ගොවිජන සංවර්ධන සභාවට ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව යම් තැනැත්තකු විසින් යම් වර්ෂයක් සඳහා අක්කර බද්ද ගෙවීමට අපොහොසත් වුවහොත් ඔහු විසින් ගෙවීමට පැහැර හැර ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් අක්කර බද්ද ගෙවීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, ලිඛිත දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් දින හෝ ඊට පෙර ඒ බද්ද ගෙවිය යුතු යයි ගොවිජන සංවර්ධන සභාව විසින් ඔහුට නියම කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ දැන්වීමක් යවන ලද්දේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා විසින් ඒ දැන්වීමේ සඳහන් මුදල් ප්‍රමාණය ඒ සඳහා අවසර දී ඇති කාල පරිච්ඡේදය ඇතුළත ගෙවීම පැහැර හරිනු ලැබ ඇති බවත්, එම මුදල අක්කර බදු වශයෙන් අයවිය යුතු බවටත් පරීක්ෂණයකින් පසු කොමසාරිස් ජනරාල් තෑනීමට පත් වූ විට, ඒ සඳහා කොමසාරිස්

ජනරාල් විසින් බලය දී ඇති නිලධරයකු විසින් ඒ ඉඩම පිහිටි අධිකරණ බල සීමාවට අයත් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, ඒ මුදල ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක ආකාරයෙන් අය කර ගනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල් විසින් හෝ ඒ වෙනුවෙන් බලය දෙන ලද යම් නිලධරයකුගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක නම සඳහන් තැනැත්තා විසින් අක්කර බදු වශයෙන් එහි සඳහන් මුදල් ප්‍රමාණය ගොවිජන සංවර්ධන සභාවට ගෙවිය යුතු බව ප්‍රකාශ කෙරෙන ඒ සහතිකය, ඒ තැනැත්තා විසින් ඒ මුදල් ප්‍රමාණය ගොවිජන සංවර්ධන සභාවට ගෙවිය යුතු බවට ධූ බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් විය යුතු ය.

ගොවි සංවිධාන හා ගොවිජන සංවර්ධන සභා විසින් දෙනු ලබන ණය අය කර ගත යුතු බව.

**57.** (1) ගොවිජන සංවර්ධන සභාවක් විසින් හෝ ගොවි සංවිධානයක් විසින් යම් තැනැත්තකුට දෙන ලද ණයක් ගෙවීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබූ විටක, එම සභාව හෝ සංවිධානය විසින් ලියාපදිංචි තැපැලෙන් වූ ලිඛිත දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කාල සීමාව ඇතුළත ඒ ණය ආපසු ගෙවිය යුතු බවට ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලිඛිත දැන්වීමක් යවන ලද්දේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින්, ඒ දැන්වීමේ සඳහන් මුදල් ප්‍රමාණය එහි සඳහන් කාල පරිච්ඡේදය ඇතුළත ගෙවීමට අපොහොසත් වී ඇති බව කොමසාරිස් ජනරාල් වෙත ලියවිල්ලකින් දැනුම් දී ඇති විටෙක ඒ කරුණ විනිශ්චය සභාව වෙත යොමු කොට ඒ විනිශ්චය සභාව ලවා පරීක්ෂණයක් පැවැත්වීමට කොමසාරිස් ජනරාල් විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) ගොවිජන සංවර්ධන සභාව හෝ ගොවි සංවිධානයක් විසින් යම් තැනැත්තකුට දෙන ලද ණයක් ගෙවීම, ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබ ඇතැයි ගොවිජන විනිශ්චය සභාව විසින් නිශ්චය කරනු ලැබූ අවස්ථාවක පැහැර හරිනු ලැබූ මුදල නිශ්චිත කාල පරිච්ඡේදයක් ඇතුළත ගෙවිය යුතු යයි ගොවිජන විනිශ්චය සභාව විසින් ලිඛිත දැන්වීමක් මගින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මගින්, එම දැන්වීමේ සඳහන් කාල පරිච්ඡේදය ඇතුළත තමාට ගෙවීමට නියමිත මුදල් ප්‍රමාණයක් ගෙවීම යම් තැනැත්තකු පැහැර හරිනු

ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා වාසය කරන හෝ ණය දෙන ලද්දේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද ඒ ඉඩම පිහිටි අධිකරණ බල සීමාව ඇතුළත වූ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ගොවිජන සංවර්ධන සභාව හෝ ගොවි සංවිධානය ඉල්ලීමක් කරනු ලැබිය යුතු අතර, ඒ මුදල් ප්‍රමාණය ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක ආකාරයෙන් අයකර ගනු ලැබිය යුතු ය.

(5) ගොවිජන විනිශ්චය සභාවේ අත්සන යටතේ වූ සහතිකයක්, එහි ප්‍රකාශිත මුදල් ප්‍රමාණය ණයක් ගෙවීමක් වශයෙන් එහි සඳහන් තැනැත්තාගෙන් අය විය යුතු බවට එහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් විය යුතු ය.

**58.** (1) සෑම ගොවිජන සංවර්ධන සභාවක ම ගිණුම්, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, කොමසාරිස් ජනරාල් විසින් තත් කාලයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් ආකෘතියක් වූ යම් විස්තර ඇතුළත් කර පවත්වා ගෙන යා යුතු ය. සෑම ගොවිජන සංවර්ධන සභාවකම එක් එක් වර්ෂය සඳහා වූ ගිණුම් විගණකාධිපති විසින් විගණනය කරනු ලැබිය යුතු ය. විගණනය සහ ගිණුම්.

(2) සෑම ගොවිජන සංවර්ධන සභාවකම ගිණුම් කොමසාරිස් ජනරාල්ගේ විධාන මත එම ගොවිජන සංවර්ධන සභාවට පත් කරන ලද පරිපාලන සම්බන්ධීකරණ ලේකම් විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(3) ගොවිජන සංවර්ධන සභාවක සම්බන්ධීකරණ ලේකම් විසින්, සභාවේ ගිණුම් එම ගොවිජන සංවර්ධන සභාවේ සාමාජිකයන් විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා තැබිය යුතු ය.

**59.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථානුකූලව සෑම ගොවිජන සංවර්ධන සභාවක් ම රාජ්‍ය සංස්ථාවක් මෙන් සලකා, එම සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව අදාළ කරනු ලැබිය යුතු ය. එසේ වුවද එකී සභාවක ගිණුම් විගණනය කිරීමේ ක්‍රියා පරිපාටිය සකස් කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට බාධාවක් නොවිය යුතු ය. ගොවිජන සංවර්ධන සභාවේ විගණනය කිරීම.

(2) තම මතය අනුව අක්‍රමික හෝ නීති විරෝධී යයි හැඟී යන ගිණුම් පිළිබඳ සෑම විෂයකට ම විගණකාධිපති විසින් අවසර දෙනු නොලැබිය යුතු අතර, ඒ ගෙවීම කරන හෝ

ක්‍රියාත්මක කරන එම ගොවිජන සංවර්ධන සභාවේ නිලධරයා හෝ සේවා නියුක්තයා මත කොමසාරිස් ජනරාල් විසින් අධිභාරයක් පැනවිය යුතු ය. තව ද, ඒ නිලධරයා හෝ සේවා නියුක්තයා විසින් ගිණුම් ගත කළ යුතුව තිබිය දී ගිණුම් ගත නොකළ යම් මුදලක්, කොමසාරිස් ජනරාල් විසින් ඒ නිලධරයාට හෝ සේවා නියුක්තයාට එරෙහිව වැය බරක් කළ යුතු ය. ඉනික්බිතිව, කොමසාරිස් ජනරාල් විසින් ඒ තැනැත්තාගෙන් අය විය යුතු මුදල සහතික කරනු ලැබිය යුතු ය.

(3) එවැනි යම් අධිභාරයක් හෝ අවසර නොදීමක් සහතික කිරීමට පෙරාතුව, කොමසාරිස් ජනරාල් විසින් යෝජිත අධිභාරය හෝ අවසර නොදීම පිළිබඳව ඒ තැනැත්තා වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර, ඒ අධිභාරය හෝ අවසර නොදීමට එරෙහිව නියෝජන ඉදිරිපත් කිරීමට හෝ කරුණු විමසා බැලීමට ඒ තැනැත්තාට අවස්ථාවක් සලස්වා දිය යුතු ය. ඉක්බිතිව, කොමසාරිස් ජනරාල් විසින් තම තීරණය පිළිබඳව එයට හේතු ද සමඟ ඒ තැනැත්තා වෙත දැනුම් දිය යුතු ය.

(4) යම් තැනැත්තකුට එරෙහිව අධිභාරයක් හෝ අවසර නොදීමක් කොමසාරිස් ජනරාල් විසින් සහතික කරනු ලැබූ අවස්ථාවක, එම සහතිකය, එහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් තීරණාත්මක සාධකයක් වන්නේ ය.

(5) යම් අධිභාරයක් හෝ අවසර නොදීමක් නිසා අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, කොමසාරිස් ජනරාල්ගේ තීරණය තමා වෙත දැනුම් දුන් දින පටන් දින තිහක් ඇතුළත තීරණයට එරෙහිව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනා කරනු ලැබිය හැකි අතර, අභියාචනයේ පිටපතක් කොමසාරිස් ජනරාල් වෙත යැවිය යුතු ය. එවැනි යම් අභියාචනයක් කරනු ලැබූ විට, විෂයානුගත භාරය අනුව, ඒ ලේකම් විසින් ප්‍රශ්නය තීරණය කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

(6) අවස්ථාවෝචිත පරිදි, අධිභාරයට හෝ අවසර නොදීමට ලක් වූ මුදල සම්පූර්ණයෙන් හෝ ඉන් යම් කොටසක් අයකර ගැනීමට හේතු ඇතැයි තමා සිතන්නේ නම්, එම මුදල එම අභියාචනය කරනු ලැබූ තැනැත්තාගෙන් අයකරගත යුතු බවට අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නියමයක් මඟින් විධාන කරනු ලැබිය හැකි අතර, අධිභාරය හෝ අවසර නොදීම නීත්‍යනුකූල ලෙස සර ඇත්තේ වූ ද, විෂයානුගත විශේෂ අවස්ථා අනුව අධිභාරය හෝ අවසර නොදීම ලිහිල් කිරීම සාධාරණ හා

යුක්ති සහගත යයි තමාට හැඟී යන්නේ නම් ඔහු විසින්, එය ලිහිල් කළ යුතු බවට ද නියමයක් මගින් විධාන කරනු ලැබිය හැකි ය. එහෙත්, එම අධිභාරය හෝ අවසර නොදීම හෝ ලේකම් විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඒ අධිභාරයෙන් යම් කොටසක් බලාත්මක කිරීමේ දී දැරීමට සිදුවිය හැකි ගාස්තු සහ වියදම් ප්‍රමාණයක් එම තැනැත්තාගෙන් අයකරගනු ලැබිය යුතු ය.

(7) අධිභාරය හෝ අවසර නොදීම පිළිබඳ හෝ අභියාචනයක් මත කරන ලද ලේකම්ගේ තීරණය පිළිබඳ, සහතිකය ලැබුණු විට කොමසාරිස් ජනරාල් විසින් ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන නිවේදනයක් මගින් නිවේදනයේ දැක්වෙන මුදල, නිවේදනයේ දින පටන් මාස තුනක් පසු නොවන දිනයක් වන, එහි සඳහන් දිනයකට පෙර ගෙවීමට ඒ තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ වූ නිවේදනයක අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක අය විය යුතු මුදල් ප්‍රමාණය පිළිබඳ විස්තර, තැනැත්තාගේ නම සහ අවසන් වරට දැන සිටි ඔහුගේ වාසස්ථානය දැක්වෙන සහතිකයක් ඒ වාසස්ථානය පිහිටි අධිකරණ බලසීමාව ඇතුළත මහෙස්ත්‍රාත් අධිකරණය වෙත කොමසාරිස් ජනරාල් විසින් ගොනු කරනු ලැබිය යුතු අතර, ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක ආකාරයෙන් ඒ මුදල ඒ තැනැත්තාගෙන් අය කර ගනු ලැබිය යුතු ය.

(9) අධිභාරයක් හෝ අවසර නොදීමක් බලාත්මක කිරීමේ දී දරන ලද ගාස්තු හෝ වියදම් වශයෙන් ගෙවනු ලැබූ හෝ අය කර ගනු ලැබූ මුදල් නොවන, මේ වගන්තිය යටතේ ගෙවනු ලැබූ හෝ අය කර ගනු ලැබූ සියලු මුදල් ප්‍රමාණ ගොවිජන සංවර්ධන අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

ගොවිජන සංවිධාන දිස්ත්‍රික්ක බලමණ්ඩල පිහිටුවීම.

60. (1) එක් එක් දිස්ත්‍රික්කය ඇතුළත පිහිටුවන ලද ගොවිජන සංවර්ධන සභා විසින් ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක් පිහිටුවනු ලැබිය හැකි ය. ඒ සෑම ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක් ම කොමසාරිස් ජනරාල් විසින් නියම කරනු ලබන නමක් යටතේ ලියා පදිංචි කරනු ලැබිය හැකි ය.

(2) දිස්ත්‍රික්කයක් තුළ සෑම ගොවිජන සංවර්ධන සභාවක් විසින් ම ඒ දිස්ත්‍රික්කය සඳහා පිහිටුවන ලද ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලය සඳහා නියෝජිතයන් දෙදෙනකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(3) සෑම ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයකට ම බල මණ්ඩලය තුල, දෙපාර්තමේන්තු හා රාජ්‍ය සංස්ථා නියෝජනය කිරීම සඳහා දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ තැනැත්තන් යම් සංඛ්‍යාවක් කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලැබිය යුතු ය. ඒ තැනැත්තන්ට ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයේ රැස්වීම්වල දී ඡන්දය දීමට හිමිකමක් නැත්තේ ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලය ලියාපදිංචි කිරීමේ දින පටන් හා ඉන් පසුව, ඒ බලමණ්ඩලය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එය ලියාපදිංචි කරනු ලැබූ නාමය යටතේ එය විසින් නඩු පැවරීම සහ එයට විරුද්ධව නඩු පැවරීම කරනු ලැබිය හැකි ය.

(5) ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක කිසිම ක්‍රියාවක් හෝ නඩු කටයුත්තක් එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසාම පමණක් නිර්බල වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

(6) සෑම ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක් විසින් ම, එහි සාමාජිකයන්ගේ රැස්වීමක් වාර්ෂිකව පැවැත්වීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(7) සෑම ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයකට ම කොමසාරිස් ජනරාල් විසින් සම්බන්ධීකරණ ලේකම්වරයකු පත් කරනු ලැබිය යුතු ය.

(8) ගොවිසංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාල සීමාව, ඒ සාමාජිකයන් විසින් ධුරය අත්හැරීම, බලමණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය යුතු ය.

ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලවල බලතල හා කර්තව්‍ය.

61. (1) සෑම ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක් විසින් ම, දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික කටයුතු සමාලෝචනය කිරීමෙහි දී සහ දිස්ත්‍රික්කය ඇතුළත ආණ්ඩුවේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති ක්‍රියාවෙහි යෙදවීමෙහි දී සහාය විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයට –

(අ) යම් වංචල හෝ නිශ්චල දේපළක් අත් කර ගැනීමේ, බද්දට හෝ කුලියට ගැනීමේ හෝ උකස් කිරීමේ, ඔඩපනය කිරීමේ, විකිණීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ ;

(ආ) ගොවි ජනතා සමාගම් පිහිටුවීමේ ;

(ඇ) ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය වෙත ආණ්ඩුවේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමේ ;

(ඈ) ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයට නියෝජිතයන් තිදෙනකු තෝරා පත් කර ගැනීමේ

බලය ඇත්තේ ය.

62. සෑම ගොවි සංවිධාන දිස්ත්‍රික් බලමණ්ඩලයක් විසින් ම– සාමාජික ගාස්තු ආදිය.

(අ) තම කටයුතු සඳහා දිස්ත්‍රික්කය ඇතුළත සියලු ගොවි සංවිධානවලින් සාමාජික ගාස්තු එකතු කිරීම ;

(ආ) තම කටයුතු කරගෙන යාම සඳහා ණය මගින් හෝ අන්‍යාකාරයකින් ආධාර ලබාගැනීම ;

(ඇ) නියමිත බැංකුවක ගිණුමක් පවත්වාගෙන යාම ;

(ඈ) බලමණ්ඩලයේ ආදායම හා වියදම පිළිබඳ ගිණුම් පවත්වාගෙන යාමට භාණ්ඩාගාරිකට නියම කිරීම

කරනු ලැබිය හැකි ය.

63. (1) සෑම ගොවිජන සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක් විසින් ම, එහි ගිණුම් කොමසාරිස් ජනරාල් විසින් නියම කරනු ලැබූ ආකාරයට පවත්වාගෙන යනු ලැබිය යුතු ය. කොමසාරිස් ජනරාල්වරයා, එවැනි ගිණුම් විගණනය කිරීම සඳහා කටයුතු කළ යුතුය. ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක ගිණුම් පවත්වාගෙන යාම.

(2) ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක පොත් සහ ගිණුම් කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ කාර්ය සඳහා ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක් විසින් අවශ්‍ය සියලු පොත්, ලේඛන සහ ගිණුම් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, (2) වන උපවගන්තියේ සඳහන් පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය විය හැකි යම්තාක් වූ සියලු සහාය ද ලබා දිය යුතු ය.

ගොවි සංවිධාන පළාත් බල මණ්ඩල පිහිටුවීම.

**64.** (1) පළාතක ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක් විසින් ඒ පළාත සඳහා පළාත් බල මණ්ඩලයක් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලය පිළිබඳ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ගොවි සංවිධාන පළාත් ඒකාබද්ධ සංගමයට අදාළ විය යුතු ය.

ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය පිහිටුවීම.

**65.** (1) දිවයිනේ ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයක් පිහිටුවනු ලැබිය හැකි ය. ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය කොමසාරිස් ජනරාල් විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය එක් එක් නියෝජිතයා සෑම ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයකින් ම තෝරා පත් කර ගනු ලැබූ නියෝජිතයන් තිදෙනකු බැගින් නියෝජනය විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය ලියාපදිංචි කිරීමේ දින පටන් සහ ඉන් පසුව, එම බලමණ්ඩලය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් නඩු පැවරීම හා එයට විරුද්ධව නඩු පවරනු ලැබීම කළ හැකි විය යුතු ය.

(4) ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය ස්වකීය කාර්යාලය කොළඹ නගරය තුළ පවත්වාගෙන යා යුතු ය.

(5) ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ ක්‍රියාවක් හෝ නඩු කටයුත්තක්, එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීමේ හේතුව නිසාම පමණක් නිර්බල වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

(6) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථා නියෝජනය කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් සත් දෙනකුට නොවැඩි තැනැත්තන් යම් සංඛ්‍යාවක් කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලැබිය යුතු ය. එසේ පත් කරනු ලැබූ සාමාජිකයන්ට ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ රැස්වීම්වල දී ඡන්දය දීමේ හිමිකම නැත්තේ ය.

(7) කොමසාරිස් ජනරාල් විසින් ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයට සම්බන්ධීකරණ ලේකම්වරයකු පත් කරනු ලැබිය යුතු ය.

(8) බල මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය ඒ සාමාජිකයන් විසින් ධුරය අත් හැරීම, බල මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පත් කිරීම සහ බල මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය විසින් සාමාජික ගාස්තු ආදිය ලබාගත හැකි බව.

66. ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය විසින් -

(අ) ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලවලින් සාමාජික ගාස්තු අය කර ගනු ලැබිය හැකි ය ;

(ආ) රජයෙන් හෝ රාජ්‍ය සංස්ථාවලින් හෝ ආණ්ඩුවේ නොවන සංවිධානවලින් මූල්‍යාධාර හෝ ද්‍රව්‍යාධාර ලබාගත හැකි ය ;

(ඇ) නියමිත බැංකුවක ගිණුම් පවත්වා ගෙන යා හැකි ය ;

(ඈ) නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යා හැකි ය ;

(ඉ) එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා එහි අරමුදල් වැය කරනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ බලතල හා කර්තව්‍ය.

67. (1) ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බලමණ්ඩලය විසින් ආණ්ඩුවේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහි ලා සහාය දිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව -

(අ) යම් වංවල හෝ නියරවල දේපළක් අත් කර ගැනීමේ, දැරීමේ, බද්දට හෝ කුලියට ගැනීමේ හෝ දීමේ උකස් කිරීමේ, මධ්‍යපනය කිරීමේ, විකිණීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ ;

(ආ) ලියාපදිංචි ගොවි සංවිධානවලට, ගොවිජන සංවර්ධන සභාවලට ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලවලට සහ ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලවලට ආධාර සහ සහාය ලබා දීමේ ;

(ඇ) ඒ සංවිධානවලට සහ සභාවලට සහ බල මණ්ඩලවලට මේ පනත යටතේ වූ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමට හැකි වන පරිදි, ඒවාට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය හා සහාය ලබා දීමේ ;

(ඈ) ජාතික කෘෂිකාර්මික කමිටුවට නියෝජිතයකු තෝරා ගැනීමේ ;

(ඉ) ආණ්ඩුවේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති පිළිබඳව ආණ්ඩුවට යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමේ ;

(ඊ) කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිය පිළිබඳව ගොවි සංවිධානවලට, ගොවිජන සංවර්ධන සභාවලට, ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලවලට සහ ගොවි සමාගම්වලට උපදෙස් හා සහාය ලබා දීමේ ;

(උ) කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවියෙහි ලා කුඩා ගොවි කණ්ඩායම්වලට උපදෙස් හා සහාය ලබා දීමේ හා ඒවා දිරි ගැන්වීමේ

බලය එයට ඇත්තේ ය.

ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ ගිණුම් පවත්වා ගෙන යාම හා පරීක්ෂා කිරීම.

68. (1) ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය විසින් පොත් හා ගිණුම් පවත්වා ගෙන යාම, කොමසාරිස් ජනරාල් විසින් සඳහන් කරනු ලබන ආකාරයට කරනු ලැබිය යුතු ය. ඒ ගිණුම් විගණනය කිරීම සඳහා කොමසාරිස් ජනරාල් විසින් විධිවිධාන සලස්වනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ පොත්, ලියවිලි, ලේඛන හා ගිණුම් පරීක්ෂා කිරීම, කොමසාරිස් ජනරාල් විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙන ලද නිලධරයකු විසින් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ විගණක කටයුතු සඳහා අවශ්‍ය සියලු පොත්, ලියවිලි, ලේඛන හා ගිණුම් ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**69.** ලියාපදිංචි කළ සෑම ගොවි සංවිධානයක්ම, සෑම ගොවිජන සංවර්ධන සභාවක් ම, සෑම ගොවිජන සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක් ම, සෑම ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලයක් ම සහ ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය – ගොවි සංවිධානයක්, ගොවිජන සංවර්ධන සභාවක්, ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක්, ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලයක්, ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය මුද්දර ගාස්තු වලින් නිදහස් වන බව.

(අ) ඒ සංවිධානය, සභාව හෝ බල මණ්ඩලය විසින් හෝ ඒ වෙනුවෙන් හෝ එහි වාසියට හෝ ලියා අත්සන් කරනු ලබන යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් හෝ ඒ යම් සංවිධානයක්, සභාවක් හෝ බල මණ්ඩලයක් විසින් අධිකරණයට ඉදිරිපත් කරනු ලබන යම් ලේඛනයක් සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් යටතේ අය කළ යුතු මුද්දර ගාස්තුව මේ වගන්තියෙන් දෙන ලද නිදහස නොවේ නම්, ගෙවීමට ඒ සංවිධානය හෝ ඒ සභාව හෝ ඒ බල මණ්ඩලය හෝ යටත් වන අවස්ථාවක එකී සාධන පත්‍රය හෝ ලේඛනය සම්බන්ධයෙන් අය විය යුතු ගාස්තුවෙන් ; සහ

(ආ) ලේඛන ලියාපදිංචි කිරීමට අදාළ තත් කාලයෙහි බල පවත්නා නීතිය යටතේ ගෙවිය යුතු යම් වෙනත් ගාස්තුවකින්

නිදහස් වන්නේ ය.

**70.** සෑම ලියාපදිංචි ගොවි සංවිධානයක් ම ද සෑම ගොවිජන සංවර්ධන සභාවක් ම ද සෑම ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක් ම ද සෑම ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලයක් ම සහ ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය විසින් ලබා ගන්නා ආදායම හෝ ලාභ වෙනුවෙන් 1979 අංක 28 දරන දේශීය ආදායම් බදු පනතේ විධිවිධාන යටතේ යම් බද්දක් ගෙවීමෙන් නිදහස් වන්නේ ය. ගොවි සංවිධාන, ගොවිජන සංවර්ධන සභා, ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩල, ගොවි සංවිධාන පළාත් බල මණ්ඩල සහ ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය දේශීය ආදායම් පනතෙන් නිදහස් බව.

ගොවි සංවිධාන, ගොවිජන සංවර්ධන සභාව, ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලය, ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලය හා ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

71. සෑම ලියාපදිංචි ගොවි සංවිධානයක් හෝ ගොවි සංවර්ධන සභාවක් හෝ ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක් හෝ ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලයක් හෝ ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය හෝ අල්ලස් පනතෙහි අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

ගොවි සංවිධානයක, ගොවිජන සංවර්ධන සභාවක, ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක, ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලයක, හා ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකෙන බව.

72. ලියාපදිංචි ගොවි සංවිධානයක හෝ ගොවි සංවර්ධන සභාවක හෝ ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක හෝ ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලයක හෝ ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ හෝ සියලුම නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු ය.

ගොවි සංවිධානයක, ගොවිජන සංවර්ධන සභාවක, ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක, ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලයක හෝ ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ සාමාජිකයන්ට හෝ සේවකයන්ට විරුද්ධව නඩු පැවරිය නොහැකි බව.

73. මේ පනතින් හෝ මේ පනත යටතේ හෝ පත් කරනු ලැබූ ලියාපදිංචි ගොවි සංවිධානයක, ගොවිජන සංවර්ධන සභාවක, ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක, ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලයක හෝ ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ එම සභාවේ හෝ සංවිධානයේ යම් සේවකයකු හෝ නියෝජිතයකු හෝ විසින් මේ පනත යටතේ හෝ එය යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් යටතේ හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව සිවිල් හෝ අපරාධ නඩුවක් හෝ නොපැවරිය යුතු ය.

කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකරුවන්ගේ බලතල හා කාර්යයන්.

**74.** (1) මේ පනතේ කාර්යය සඳහා අවශ්‍ය වන කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකරුවන් හා වෙනත් තැනැත්තන් සංඛ්‍යාවක් නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරනු ලැබූ තැනැත්තන් කොමසාරිස් ජනරාල් වරයාගේ සාමාන්‍ය පාලනයට සහ විධානයට යටත් විය යුතු ය.

(2) කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් තම බල ප්‍රදේශයේ ගොවි සංවිධානවල කැඳවුම්කරු ලෙස ද ක්‍රියා කළ යුතු ය.

ගොවිජන සංවර්ධන සභා විසින් හැඳුනුම්පත් නිකුත් කල යුතු බව.

**75.** (1) සෑම ගොවිජන සංවර්ධන සභාවක් ම විසින් ස්වකීය බල ප්‍රදේශය ඇතුළත ඉඩම් හිමි ගොවියන්ට හෝ කෘෂිකාර්මික ඉඩම්වල භුක්තිකරුවන්ට හැඳුනුම්පත් නියමිත ආකාරයට නිකුත් කිරීමට කටයුතු කළ යුතු ය.

(2) එසේ හැඳුනුම්පත් නිකුත් කිරීමේ දී වෙනත් දේ අතර, ඒ ප්‍රදේශයේ අවසානයට සහතික කරන ලද කෘෂිකාර්මික ඉඩම් ලේඛනය අදාළ කර ගනු ලැබිය යුතු ය.

කොමසාරිස් ජනරාල්වරයා විසින් තොරතුරු ඉල්ලා සිටිය හැකි බව.

**76.** (1) කොමසාරිස් ජනරාල්වරයා විසින්, දැන්වීමක් යවමින්, යම් කෘෂිකාර්මික ඉඩමක් හිමි ගොවියා හෝ එවැනි ඉඩමක භුක්තිකරු හෝ එවැනි ඉඩමකට සම්බන්ධතාවක් ඇති වෙනත් යම් තැනැත්තකු විසින් දරනු ලබන කෘෂිකාර්මික ඉඩමෙහි විශාලත්වය, ඒ කෘෂිකාර්මික ඉඩමේ ඔහු විසින් කර ඇති වගාවේ ස්වභාවය සහ ඒ දැන්වීමේ සඳහන් කොට ඇති වෙනත් තොරතුරු ඒ දැන්වීමේ සඳහන් දිනයේ දී හෝ ඊට පෙර තමා වෙත සපයන ලෙස ඒ කෘෂිකාර්මික ඉඩම හිමි ගොවියාට, ඒ ඉඩමේ භුක්තිකරුට හෝ ඊට සම්බන්ධතාවක් ඇති තැනැත්තාට හෝ නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

කොමසාරිස් ජනරාල්වරයාගේ බලතල.

77. (1) මේ පනතින් හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් හෝ යම් ගොවි සංවිධානයක්, ගොවිජන සංවර්ධන සභාවක්, ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක්, ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලයක් හෝ ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය වෙත පවරා දී ඇති යම් බලයක් අනිසි ලෙස පාවිච්චි කොට ඇති බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක දී ඒ අනිසි ලෙස පාවිච්චි කිරීම තවදුරටත් කරගෙන යාම වැළැක්වීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් වහාම පියවර ගත යුතු ය.

(2) යම් ලියාපදිංචි කළ ගොවි සංවිධානයක් හෝ ගොවිජන සංවර්ධන සභාවක් හෝ යම් ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක් හෝ ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලයක් හෝ ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය හෝ වෙත යම් පනතකින් හෝ මේ පනත යටතේ සාදනු ලැබූ යම් නියෝගයකින් හෝ පවරා දී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීම ඒ සංවිධානය, සභාව හෝ බල මණ්ඩලය විසින් නොකර ඇති අවස්ථාවක දී, ඒ බලය ක්‍රියාත්මක කරන ලෙස ඒ සංවිධානයට, සභාවට හෝ බල මණ්ඩලයට කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය හෝ යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබූ යම් නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින ලියාපදිංචි කළ ගොවි සංවිධානයක්, ගොවිජන සංවර්ධන සභාවක්, ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක්, ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලයක් හෝ ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් විසුරුවා හරිනු ලැබිය හැකි අතර, එසේ විසුරුවා හරින ලද ගොවි සංවිධානය, ගොවිජන සංවර්ධන සභාව, ගොවි සංවිධාන දිස්ත්‍රික බල මණ්ඩලය, ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලය හෝ ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය නැවත පිහිටුවනු ලබන තෙක් ඒ සංවිධානයේ හෝ බල මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා සුදුසු පියවර කොමසාරිස් ජනරාල්වරයා විසින් ගනු ලැබිය හැකි ය.

කොමසාරිස් ජනරාල්වරයා අමාත්‍යවරයාගේ විධානවලට යටත් විය යුතු බව.

**78.** මේ පනත යටතේ තුදෙක් පරිපාලනමය වූ බලතල පාවිච්චි කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී කොමසාරිස් ජනරාල්වරයා අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධානවලට යටත් විය යුතු ය.

නඩු පැවරීමට බලය දී ඇති තැනැත්තන්.

**79.** මේ පනත යටතේ සිදු කරනු ලබන වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීමේ හිමිකම, කොමසාරිස් ජනරාල්වරයාට හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට හෝ ඇත්තේ ය.

කොමසාරිස් ජනරාල්වරයාට දිසා අධිකරණයක බලතල ඇති බව.

**80.** මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයාට තමා වෙත යොමු කරනු ලබන යම් ආරවුලක් අසා තීරණය කිරීමේ කාර්යය සඳහා, දිසා අධිකරණයක් සතු සියලු ම බලතල ඇත්තේ ය, එනම්–

(අ) යම් සාක්ෂිකරුවකු කැඳවීම සහ පැමිණ සිටීමට සාක්ෂිකරුවකුට බල කිරීම ;

(ආ) ලේඛන ඉදිරිපත් කිරීමට බල කිරීම ; සහ

(ඇ) සාක්ෂිකරුවන් ලවා දිවුරවීම හෝ ප්‍රතිඥා ලබා ගැනීම.

## VII වන කොටස

### වාරිකර්මාන්ත හා වාරිමාර්ග ජලය කළමනාකරණය කිරීම

වාරි කර්මාන්ත අධීක්ෂණය කිරීම සහ පරිපාලනය කිරීම ගොවිසංවිධාන යටතට පත් කිරීම.

**81.** (1) යම් ගොවි සංවිධානයක බල ප්‍රදේශය තුළ පිහිටි සෑම වැවක්, වේල්ලක්, ඇලක්, ජල මාර්ගයක්, ඉවුරක්, රක්ෂිතයක් හෝ වෙනත් වාරි කර්මාන්තයක් ඒ ගොවි සංවිධානයේ අධීක්ෂණයට යටත් කරනු ලැබිය යුතු ය.

(2) එවැනි අධීක්ෂණයක් ගොවි සංවිධානයක් විසින් කළ යුත්තේ කවර ආකාරයට ද යන්න දක්වමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් පවරනු ලැබූ බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමට ගොවි සංවිධානයක් විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට, නීත්‍යානුකූල හේතුවක් නොමැතිව, ප්‍රතිරෝධනය පාන හෝ බාධා කරන සෑම තැනැත්තෙක් ම, මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

ඉදිකිරීම්, ව්‍යාපෘති යනාදිය පිළිබඳව ගොවි සංවිධානවලට දැනුම් දිය යුතු බව.

**82.** (1) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක්, තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින්, ගොවි සංවිධානයක බල ප්‍රදේශ තුළ වැවක්, වේල්ලක්, ඇලක් හෝ ජල මාර්ගයක් ඉදි කිරීමට යෝජනා කරනු ලබන හෝ යම් සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලබන හෝ අවස්ථාවක, ඒ යෝජිත ඉදි කිරීම හෝ ව්‍යාපෘතිය හෝ පිළිබඳව ගොවි සංවිධානය වෙත දැනුම් දී එම ගොවි සංවිධානයේ අදහස් විමසා බැලීම ඒ දෙපාර්තමේන්තුවේ හෝ සංස්ථාවේ හෝ ප්‍රධානියාගේ ද ඒ තැනැත්තාගේ හෝ පුද්ගල මණ්ඩලයේ ද යුතුකම වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගොවි සංවිධානයක අදහස් දැනුම් දෙනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, ඒ ව්‍යාපෘතිය ඉදි කිරීම හෝ සංවර්ධනය කිරීම හෝ සඳහා වූ සැලසුම් අවසානාත්මක කිරීම සම්බන්ධයෙන් ඒ ගොවි සංවිධානයේ අදහස් තමන් විසින් සැලකිල්ලට ගන්නා ලද්දේ ද යන වග සහ එසේ සැලකිල්ලට ගන්නා ලද්දේ කවර ආකාරයකට ද යන වග හෝ අවස්ථාවෝචිත පරිදි, ඒ සැලසුම් හෝ ව්‍යාපෘතිය පිළිබඳව එකී අදහස් ක්‍රියාත්මක කිරීමට තමාට නොහැකි මන්ද යන වග, ඒ දෙපාර්තමේන්තුවේ හෝ සංස්ථාවේ හෝ ප්‍රධානියා විසින් නැතහොත් ඒ තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය හෝ විසින් නොපමාව ඒ ගොවි සංවිධානය වෙත දැනුම් දිය යුතු ය.

වාරිකර්මාන්ත ආරක්ෂා කිරීමට බාධා පැමිණවීම.

**83.** (1) යම් තැනැත්තකු විසින්,-

(අ) යම් වාරි මාර්ගයක්, ජල මාර්ගයක්, බැම්මක්, ඉවුරක්, රක්ෂිතයක්, වැවක්, වේල්ලක්, වැවක ප්‍රවේශයක් හෝ වාරි කර්මාන්ත සංචිතයක් අවහිර කරනු ලැබ, ඊට බාධා කරනු ලැබ හෝ අනවසරයෙන් කොටු කරගනු ලැබ ඇති බව හෝ එසේ අවහිර කිරීමට, බාධා කිරීමට හෝ කොටු කර ගැනීමට කටයුතු සලස්වා ඇති බව හෝ එවැන්නකට අලාභ හානි කර හෝ අලාභ හානි කිරීමට කටයුතු සලස්වා ඇති බව ;

(ආ) යම් වාරි කර්මාන්තයක රැස් කොට ඇති ජලය ඕනෑකමින් ම හෝ ද්වේෂ සහගතව අපතේ හැරීමට කටයුතු සලස්වා ඇති බව ;

(ඇ) කොමසාරිස් ජනරාල්වරයාගේ නිසි ලිඛිත අනුමැතිය නොමැතිව, යම් වැවක හෝ ජලාධාර ප්‍රදේශය තුළ වූ ඇලක හෝ ගොවිතැන් කර ඇති බව හෝ, යම් වැවකින්, ජලාධාර ප්‍රදේශයක පිහිටි ඇලකින්, වාරි කර්මාන්තයකින්, ජල මාර්ගයකින්, බැම්මකින්, ඉවුරකින්, රක්ෂිතයකින්, වැවකින්, වේල්ලකින්, වැවක ප්‍රවේශයකින් හෝ වාරි කර්මාන්ත සංචිතයකින් පස් ඉවත් කර ඇති බව හෝ ඉවත් කිරීමට සලස්වා ඇති බව

කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන අවස්ථාවක දී ඒ තැනැත්තා වෙත විධානයක් නිකුත් කරමින් ඒ විධානයේ සඳහන් ප්‍රතිකර්මීය පියවර ගන්නා ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ විධානයක අඩංගු විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරනු ලැබීම සහතික කිරීම් වස්, ඒ වාරිමාර්ගය, ඇල, ජල මාර්ගය, බැම්ම, ඉවුර, රක්ෂිතය, වැව, වේල්ල, වැව් ප්‍රවේශය හෝ වාරි කර්මාන්ත සංචිතය පිහිටා ඇත්තේ යම් සාම නිලධරයකුගේ බල ප්‍රදේශය තුළ ද ඒ නිලධරයාගේ සහාය කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉල්ලා සිටිය හැකි අතර, එසේ ඉල්ලා ඇති සහාය දීම ඒ සාම නිලධරයාගේ කාර්යය වන්නේ ය. තව ද ඒ කාර්යය සඳහා එකී විධානවලට අනුකූලව ක්‍රියා කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය වන බලය ඒ සාම නිලධරයා විසින් යොදවනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ විධානයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ විධානයකට අනුකූලව ක්‍රියා කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හැර ඇති බව සඳහන් කරමින් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක්, ඒ සහතිකයේ සඳහන් ක්‍රියා ඒ තැනැත්තා විසින් සිදු කර ඇති බවට බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂි වන්නේ ය.

අපද්‍රව්‍ය කුඹුරු ඉඩම්වලට හෝ ජල මාර්ගයකට ගලා යාමට සැලැස්වීම.

**84.** (1) යම් වාරි මාර්ගයකට, ඇලකට, ජල මාර්ගයකට, වාරි රක්ෂිතයකට හෝ කුඹුරු ඉඩමකට අප ද්‍රව්‍ය මුදා හැරීම හෝ මුදා හැරීමට සැලැස්වීම හෝ ගලා යාමට ඉඩ හැරීම හෝ කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝණය කරමින් යම් ක්‍රියාවක් යම් තැනැත්තකු විසින් සිදු කරමින් ඇති බව කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන අවස්ථාවක දී ඒ ක්‍රියාව කර ගෙන යාමෙන් වැළකී සිටින ලෙස ඒ තැනැත්තාට නියම කරමින් විධානයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරන ලද විධානයක විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරනු ලබන බව සහතික කිරීම අරගයා, ඒ විධාන කරන ලද්දේ යම් වාරි මාර්ගයක්, ඇලක්, ජල මාර්ගයක්, වාරි රක්ෂිතයක් හෝ කුඹුරු ඉඩමක් සම්බන්ධයෙන් ද ඒ වාරිමාර්ගය, ඇල, ජල මාර්ගය, වාරි රක්ෂිතය හෝ කුඹුරු ඉඩම පිහිටා ඇත්තේ යම් සාම නිලධරයකුගේ බල ප්‍රදේශයක් තුළ ද ඒ සාම නිලධරයාගේ සහාය කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි අතර, එසේ ඉල්ලා සිටින ලද සහාය දීම ඒ සාම නිලධරයාගේ කාර්යය විය යුතු ය. තව ද, ඒ විධානයට අනුකූලව ක්‍රියා කරනු ලැබීම නිසැක කිරීම සඳහා අවශ්‍ය වන බලය යෙදීමෙන් තත් කාර්යය සඳහා ඒ සාම නිලධරයා විසින් කරනු ලැබිය හැකි ය.

(4) (2) වන උපවගන්තිය යටතේ කරන ලද විධානයක් නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් ඉවත් කරනු ලබන තෙක්, ඒ විධානය කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා, ඒ විධානයෙන් බැඳී සිටිය යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ කරන ලද විධානයක විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තෙක් ම මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(6) (2) වන උපවගන්තිය යටතේ කරන ලද විධානයක විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇති තැනැත්තා කවුරුන්දැයි සඳහන් කරමින් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක්, ඒ සහතිකයේ අඩංගු කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් වන්නේ ය.

කුඹුරු ඉඩම්වලට සහ ජල මාර්ග වලට අපද්‍රව්‍ය දැමීමට අදාළ වැරදි.

**85.** (1) යම් වාරි මාර්ගයකට හෝ ඇලකට හෝ ජල මාර්ගයකට හෝ වාරි රක්ෂිතයකට හෝ කුඹුරු ඉඩමකට හෝ කිසිදු අපද්‍රව්‍යයක් යම් තැනැත්තකු විසින් නොදැමිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කෙරෙන යම් ක්‍රියාවක් යම් තැනැත්තකු විසින් සිදු කරනු ලබන අවස්ථාවක, දී, ඒ වාරි මාර්ගය, වාරි රක්ෂිතය, ඇල, ජල මාර්ගය හෝ කුඹුරු ඉඩම පිහිටා ඇති ප්‍රදේශය විෂයයෙහි බලය ඇති ගොවි සංවිධානය විසින්, ඒ කාරණය ඒ වාරි මාර්ගය, වාරි රක්ෂිතය, ඇල, ජල මාර්ගය හෝ කුඹුරු ඉඩම පිහිටා ඇති ප්‍රදේශය විෂයයෙහි අධිකරණ බලය ඇති ගොවිජන විනිශ්චය සභාව වෙත වාර්තා කරනු ලැබිය හැකි ය.

(4) එවැනි ගොවිජන විනිශ්චය සභාවක් වෙත (3) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද වාර්තාවක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් ඒ ගොවිජන විනිශ්චය සභාව විසින් පැවැත්විය යුතු අතර, (1) වන උපවගන්තියේ විධිවිධාන යම් තැනැත්තකු විසින් උල්ලංඝනය කර ඇති බවට ඒ පරීක්ෂණයෙන් පසු ඒ ගොවිජන විනිශ්චය සභාව සෑහීමට පත් වන්නේ නම් ඒ බවට සහතිකයක් ඒ ගොවිජන විනිශ්චය සභාව විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක්, ඒ සහතිකයේ සඳහන් වැරදි ඒ සහතිකයේ සඳහන් තැනැත්තා විසින් සිදු කරන ලද බවට බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් වන්නේ ය.

ඉඩම් හිමි ගොවියන්ගේ සහ බුක්තිකරුවන්ගේ රැස්වීම්.

**86.** (1) සෑම ගොවි සංවිධානයක් ම විසින්, තම බල ප්‍රදේශය තුළ,-

(අ) කෘෂිකාර්මික ඉඩම්වල හෝ කුඹුරු ඉඩම්වල හෝ වී වගා කිරීම නැතහොත් වෙනත් ආකාරයක බෝග වගා කිරීම සඳහා ධෛර්ය දීම සහ එම වගා කටයුතු ව්‍යාප්ත කිරීම කළ යුතු ය ;

(ආ) වී වගා කිරීමට හෝ වෙනත් ආකාරයේ වගා කිරීම්වලට අදාළ චාරිත්‍ර වාරිත්‍ර සිදු කිරීම බලාත්මක කළ යුතු ය ;

(ඇ) කෘෂිකාර්මික කටයුතු නියි කලට වේලාවට කරනු ලබන බවට වග බලා ගත යුතු ය ;

(ඈ) වාරි කර්මාන්තවලින් සැපයෙන ජලය සහ කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රයෝජනයට ගන්නා ජලය කාර්යක්ෂම ලෙස කළමනාකරණය කළ යුතු ය ;

(ඉ) වගා කිරීම සම්බන්ධයෙන් වූ පිළිගත් චාරිත්‍ර චාරිත්‍රවලට අනුකූලව, වාරි කර්මාන්තවලට අදාළ කටයුතු ඉටු කළ යුතු ය ;

(ඊ) පස සංරක්ෂණය කිරීම සඳහා සහ පළිබෝධකවලින් හා රෝගවලින් බෝග ආරක්ෂා කිරීම සඳහා පියවර ගත යුතු ය ;

(උ) සෑම ගොවි සංවිධානයක් ම විසින් ස්වකීය බල ප්‍රදේශය තුළ පිහිටි යම් කුඹුරු ඉඩමකට යාබදව පිහිටි ගොඩ ඉඩම්වල අතු හා අකුල් කපා ඉවත් කිරීමට සහ යම් කුඹුරු ඉඩමක හෝ ගොඩ ඉඩමක හෝ වගා කොට ඇති බෝගවලට බාධාවක්ව පිහිටා ඇති ළඳු කැලෑ කපා ඉවත් කිරීම සහතික කිරීමට පියවර ගත යුතු ය ; තව ද

(ඌ) ඉඩම් සහ සාමූහික කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය කිරීමට අදාළ රීති සෑදීමේ කාර්යය සඳහා ඉඩම් හිමි ගොවීන්ගේ සහ බුක්තිකරුවන්ගේ රැස්වීම් කැඳවිය යුතු ය.

(2) මේ වගන්තියේ විධිවිධාන යටතේ යම් රැස්වීමක් කැඳවනු ලබන අවස්ථාවක දී, ඒ රැස්වීම පවත්වනු ලබන දිනය, වේලාව සහ ස්ථානය පිළිබඳවත් ඒ රැස්වීමේ පරමාර්ථය පිළිබඳවත් දැන්වීමක් කිරීමට ගොවි සංවිධානය විසින් හෝ ඒ ගොවි සංවිධානය වෙනුවෙන් තත් කාර්යය සඳහා සාමාන්‍ය හෝ විශේෂ බලයක් පවරනු ලැබූ වෙනත් යම් තැනැත්තකු විසින් හෝ කටයුතු යෙදිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් දැන්වීම, එම ප්‍රදේශය තුළ සුදුසු ස්ථානවල ලිඛිත දැන්වීම් ප්‍රදර්ශනය කිරීමෙන් සහ ඒ රැස්වීම පිළිබඳ ප්‍රචාරයක් කිරීම සඳහා ප්‍රමාණවත් යයි පෙනී යන වෙනත් ආකාරයකින් ප්‍රසිද්ධ කළ යුතු ය.

(4) ගොවි සංවිධානය විසින් නම් කරනු ලබන තැනැත්තකු හෝ ගොවි සංවිධානය විසින් තත් කාර්යය සඳහා සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් හෝ බලය පවරනු ලැබූ තැනැත්තකු විසින්, මේ වගන්තියේ විධිවිධාන යටතේ පවත්වනු ලබන සෑම රැස්වීමක ම මුලසුන දැරිය යුතු ය.

(5) මේ වගන්තියේ විධිවිධාන යටතේ පවත්වනු ලබන සෑම රැස්වීමකම වාර්තා, ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා විසින් ම හෝ, තත් කාර්යය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් හෝ බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් පවත්වාගෙන යා යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධාන යටතේ පවත්වනු ලබන රැස්වීමකට, ඒ ගොවි සංවිධානයේ බල ප්‍රදේශය තුළ පිහිටි කෘෂිකාර්මික ඉඩම්වල ඉඩම්හිමි ගොවීන් හෝ බුක්තිකරුවන් මුළු සංඛ්‍යාව අතුරෙන් යටත් පිරිසෙයින් හතරෙන් එකක් නැතහොත් ඉඩම් හිමි ගොවීන් හෝ බුක්තිකරුවන් විසිපස් දෙනෙක් පැමිණ ඇත්නම් මිස, එවැනි රැස්වීමක් වලංගු ලෙස සංයුක්ත වන සේ නොසැලකිය යුතු ය. අනුයාත රැස්වීම් දෙකක දී ම ගණ පූරණයක් නොතිබුණහොත් මූලසුන දරන නිලධරයා වශයෙන් ක්‍රියා කරන තැනැත්තා විසින් එම දෙවන රැස්වීම අඩාළව කල් තබා තුන්වන රැස්වීම සඳහා දිනයක් නියම කරනු ලැබිය යුතු ය. එම තුන්වන රැස්වීමේ ද ගණපූරණයක් නොතිබුණ හොත්, එසේ ගණපූරණයක් නොතිබුණේ වුව ද ඒ නොතකා සියලු කාර්ය සඳහා එම රැස්වීම වලංගු පරිදි සංයුක්ත වූ රැස්වීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාර රැස්වීම් පැවැත්වීම යම් ගොවි සංවිධානයක් විසින් පැහැර හරිනු ලැබුවහොත්, එම ප්‍රදේශය විෂයයෙහි බලය ඇති ගොවිජන සංවර්ධන සභාව විසින් මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(8) මේ වගන්තියේ විධිවිධාන යටතේ වූ රැස්වීමක දී සාදන ලද යම් රීතියක් ඒ රැස්වීමට පැමිණ සිටි තැනැත්තන් විසින් පිළිගනු ලැබිය යුතු අතර, ඉන් පසු ඒ ගොවි සංවිධානයේ බල ප්‍රදේශය තුළ පදිංචි ඉඩම් හිමි ගොවියෝ සහ භුක්තිකරුවෝ ඒ රීතිවලින් බැඳී සිටිය යුත්තා හ.

(9) (අ) මේ වගන්තියේ විධිවිධාන යටතේ පවත්වනු ලැබූ යම් රැස්වීමක දී ඡන්දය දීමට යම් තැනැත්තකුගේ අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් පැන නැඟුනහොත්, මූලසුන දරන නිලධරයා විසින් ඒ ප්‍රශ්නය නිරාකරණය කරනු ලැබිය යුතු ය.

(ආ) යම් කාරණයක් සම්බන්ධයෙන් සම සමව ඡන්දය දෙන ලද අවස්ථාවක දී මූලසුන දරන නිලධරයාට තීරක ඡන්දයක් ඇත්තේ ය.

(10) එවැනි සෑම රැස්වීමක ම වාර්තා මෙම වගන්තියේ (5) වන උප වගන්තිය යටතේ බලය පවරනු ලැබූ තැනැත්තා විසින් පවත්වා ගෙන යා යුතු අතර, ඒ වාර්තා එම තැනැත්තා සහ මුලසුන දරන නිලධරයා විසින් අත්සන් තැබිය යුතු ය. එවැනි වාර්තා, ඒවායේ අඩංගු කාරණා සම්බන්ධයෙන් සාක්ෂි වන්නේ ය.

(11) යම් කෘෂිකාර්මික ඉඩමක ඉඩම් හිමියා හෝ භුක්තිකරු මේ වගන්තියේ සඳහන් යම් රැස්වීමක දී සාදන ලද යම් රීතියක් කඩවන ආකාරයට ක්‍රියා කරනු ලබයි නම්, ඔහු මේ පනත යටතේ යම් වරදකට වරදකරු විය යුතු ය.

කෘෂි ක්ෂේත්‍රයේ චාරිත්‍ර වාරිත්‍ර වලට හෝ රීති වලට පටහැනි ක්‍රියා සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග.

87. (1) යම් ගොවි සංවිධානයක බල ප්‍රදේශය තුළ යම් තැනැත්තකු විසින්, පිළිගත් චාරිත්‍ර වාරිත්‍ර කිසිවකට හෝ යම් රීතියකට හෝ පටහැනි යම් ක්‍රියාවක් කර ඇති හෝ කළ යුතු යම් ක්‍රියාවක් නොකර හැර ඇති හෝ අවස්ථාවක දී, එමගින් එම බල ප්‍රදේශය තුළ වූ කෘෂිකාර්මික ඉඩමක් හිමි ගොවියකුට හෝ බුක්තිකරුවකුට හෝ යම් හානියක් සිදු විය හැකි විටක, ඒ ක්‍රියාව හෝ නොකර හැරීම හෝ, එවැනි අලාභයක් සිදුවීම වැළැක්වීම සඳහා අප්‍රමාදව කටයුතු කළ යුතු තරම් ස්වභාවයක ක්‍රියාවක් හෝ නොකර හැරීමක් වන්නේ නම්, එම අවස්ථාවට අනුව අවශ්‍ය යම් පියවරක් ගැනීම සහ යම් වියදමක් දැරීම ඒ ගොවි සංවිධානය විසින් කළ යුතු අතර, එසේ ගනු ලැබූ පියවර සහ දරන ලද වියදම පිළිබඳ වාර්තාවක් කොමසාරිස් ජනරාල්වරයා වෙත සහ ඒ ක්‍රියාව හෝ නොකර හැරීම හෝ සිදු කරන ලද්දේ යම් ගොවිජන සංවර්ධන සභාවක බල ප්‍රදේශය තුළ ද ඒ ගොවිජන සංවර්ධන සභාව වෙත යටකී ගොවි සංවිධානය විසින් ලිඛිතව නොපමාව ම ඉදිරිපත් කළ යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ යම් වියදමක් දරන ලද්දේ කවර තැනැත්තකුගේ ක්‍රියාවක් හෝ නොකර හැරීමක් හේතු කොට ගෙන ද, එම මුදල් ප්‍රමාණය ඒ ගොවි සංවිධානය වෙත ගෙවීමට ඒ තැනැත්තා යටත් වන්නේ ය.

(ආ) ගොවි සංවිධානය විසින් ඒ තැනැත්තා වෙත ලියාපදිංචි තැපැල් මගින් වූ ලිඛිත දැන්වීමක් යවමින් ඒ දැන්වීමෙහි සඳහන් කාලය තුළ දී එම මුදල් ප්‍රමාණය ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

(3) එවැනි දැන්වීමක සඳහන් කාලය තුළ දී ඒ මුදල් ප්‍රමාණය ගෙවීම ඒ තැනැත්තා විසින් පැහැර හැර ඇති විටක, ඒ මුදල් ප්‍රමාණය අය කර ගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් ඒ ගොවි සංවිධානය විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) ඒ මුදල ගෙවන ලද්දේ යම් වියදමක් දැරීමට ද ඒ වියදම නිසි පරිදි දරන ලද්දක් ද යන ප්‍රශ්නය තීරණය කිරීම සඳහා පරීක්ෂණයක් පවත්වන ලෙස ගොවිජන විනිශ්චය සභාවට කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(5) එවැනි පරීක්ෂණයකට පෞද්ගලික හෝ නියෝජිතයකු මගින් හෝ පෙනී සිටීමට අවස්ථාවක් ගොවි සංවිධානයට සහ දරන ලද වියදම ගෙවිය යුතු තැනැත්තාට දෙනු ලැබිය යුතු ය. ඒ වියදම නිසි පරිදි දරන ලද්දක් බව, පරීක්ෂණයකින් පසු විනිශ්චය සභාව විසින් තීරණය කරනු ලැබුවහොත්, ඒ තැනැත්තා විසින්, ඒ මුදල, විනිශ්චය සභාවේ ආඥාවේ දින සිට දින දහහතරක් තුළ දී ගොවි සංවිධානයට ගෙවිය යුතු යයි විනිශ්චය සභාව විසින් ආඥා කළ යුතු අතර, ඒ ආඥාවේ පිටපත් කොමසාරිස් ජනරාල්වරයා වෙත සහ පාර්ශ්වකරුවන් වෙත යැවිය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින් නියම කරන ලද යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම යම් තැනැත්තකු විසින් පැහැර හරින ලද අවස්ථාවක දී, ඒ තැනැත්තා පදිංචි ස්ථානය විෂයයෙහි අධිකරණය බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ගොවි සංවිධානය විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ අධිකරණය විසින් පනවනු ලැබූ දඩයක් පරිද්දෙන් ඒ මුදල අය කර ගනු ලැබිය යුතු අතර, එසේ අය කර ගනු ලබන මුදල් ප්‍රමාණය ඒ අධිකරණය විසින්, ඒ ඉල්ලීම කළ ගොවි සංවිධානයට ගෙවනු ලැබිය යුතු ය.

(7) (6) වන උපවගන්තියේ කාර්යය සඳහා, ඒ තැනැත්තාගෙන් ඒ මුදල ඒ ගොවි සංවිධානයට අයවිය යුතු බවට ගොවිජන විනිශ්චය සභාව විසින් කරන ලද ආඥාව, ඒ මුදල එසේ අය විය යුතු මුදලක් බවට ආවේශ්‍ය සාක්ෂි වන්නේ ය.

ගොවිජන සංවර්ධන සභාව විසින් අත්තිකාරම් ගෙවනු ලැබිය හැකි බව.

**88.** 87 වන වගන්තියේ කාර්ය සඳහා ගොවි සංවිධානයක් විසින් යම් වියදමක් දැරිය යුතුව ඇති බවට ගොවිජන සංවර්ධන සභාව සෑහීමට පත් වූ අවස්ථාවක දී, ඒ වියදම දැරීම සඳහා අත්තිකාරම් මුදලක් ගොවිජන සංවර්ධන සභාව විසින් ඒ ගොවි සංවිධානයට ගෙවනු ලැබිය හැකි ය.

ගොවිතැන් සඳහා ලිං කැනීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය.

**89.** (1) කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත අවසරය මත සහ ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව මිස, ගොවිතැන් කටයුතු සඳහා යම් ලිඳක් කැනීම හෝ ඉදි කිරීම හෝ පවත්වා ගෙන යාම කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(2) ගොවිතැන් කටයුතු සඳහා ලිං ජලය පාවිච්චි කරන සෑම තැනැත්තකු ම විසින් ජලය අපතේ යෑම වැළැක්වීම සඳහා පියවර ගත යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නියමිත ලිඛිත අවසරය දීමට පෙර පහත දක්වෙන ආයතනවල නිර්දේශ කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබාගත හැකි ය :-

(අ) අදාළ ගොවි සංවිධානය ;
(ආ) අදාළ ගොවිජන සංවර්ධන සභාව ;
(ඇ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ;
(ඈ) ජල සම්පත් මණ්ඩලය ;
(ඉ) මධ්‍යම පරිසර අධිකාරිය.

(4) යම් තැනැත්තකු පළමුවන හෝ දෙවන හෝ උපවගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරනු ලැබුවහොත් ඒ තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

## VIII වන කොටස

### පොදු විධිවිධාන

ඉඩම් හිමි ගොවියන්ගේ හෝ බුක්තිකරුවන්ගේ වගා අයිතිවාසිකම්වලට අනවශ්‍ය ලෙස මැදිහත් වීම.

**90.** (1) තමන්ගේ වගා අයිතිවාසිකම්වලට, ගොයම් පෑගීමේ අයිතිවාසිකම්වලට, කමත් පාවිච්චි කිරීමේ අයිතිවාසිකම්වලට, කෘෂි ඵලදාව ඉවත ගෙන යාමේ අයිතිවාසිකම්වලට හෝ තමන්ගේ කෘෂිකාර්මික පාරක් භාවිත කිරීමේ අයිතිවාසිකමට යම් තැනැත්තකු විසින් අනවශ්‍ය ලෙස මැදිහත් වන බවට හෝ අනවශ්‍ය ලෙස මැදිහත් වීමට තැත් කරන බවට යම් ඉඩම් හිමි ගොවියකු හෝ බුක්තිකරුවකු විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත පැමිණිලි කරනු ලැබූ අවස්ථාවක දී, ඒ අනවශ්‍ය මැදිහත් වීම නිසා හෝ අනවශ්‍ය මැදිහත් වීමට තැත් කිරීම නිසා, කෘෂි ඵලදාවට හෝ ගොවිපළ සතුන්ට අන්තරායක් හෝ හානියක් හෝ සිදුවන බවට කොමසාරිස් ජනරාල්වරයා පරීක්ෂණයකින් පසුව සෑහීමට පත් වුවහොත්, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන නියමයක් මගින්, එකී අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා එම නියමයෙහි සඳහන් විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, යම් තැනැත්තකු එම කෘෂිකාර්මික ඉඩමෙන් නෙරපා හැරීම සඳහා ඒ වගන්තිය යටතේ නියමයක් නොකරනු ලැබිය යුතු ය.

එසේම තව දුරටත්, එවැනි නියමයක් කරනු ලබන්නේ යම් ඉඩමක්, එළදවක් හෝ ගොවිපළ සතුන් සම්බන්ධයෙන් ද ඒ ඉඩමට, එළදවට හෝ ගොවිපළ සතුන්ට, ඒ තැනැත්තාගේ හෝ ගොවියාගේ හෝ බුක්තිකරුගේ හෝ ඇති අයිතියට, හිමිකම හෝ සම්බන්ධතාවට (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයකින් අගතියක් සිදු නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයන්ට අනුකූලව කටයුතු කරනු ලබන බවට වගබලාගැනීම සඳහා, ඒ කෘෂිකාර්මික ඉඩම පිහිටා ඇති ප්‍රදේශය විෂයයෙහි බලය ඇති සාම නිලධරයකුගේ සහාය කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි අතර, එසේ ඉල්ලා සිටින ලද සහාය දීම එම සාම නිලධරයාගේ කාර්යය වන්නේ ය. තව ද, එම කාර්ය සඳහා එකී නියමයට අනුකූලව ක්‍රියා කරනු ලබන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණයට බලය ඒ නිලධරයා විසින් පාවිච්චි කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයක් කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ නියමය, අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් ඉවතලනු ලබන තෙක්, ඒ තැනැත්තා ඒ නියමයෙන් බැඳී සිටිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(5) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල් වරයා විසින් යම් තැනැත්තකු සම්බන්ධයෙන් කරන ලද නියමයක අඩංගු විධාන ඒ නියමයේ සඳහන් තැනැත්තා විසින් අනුගමනය කර නොමැති බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිතව නිකුත් කරන ලද සහතිකයක්, එහි අඩංගු කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පිළිගනු ලැබිය යුතු සාක්ෂි වන්නේ ය.

*අක්කර භාගයකට නොවැඩි කෘෂිකාර්මික ඉඩම්වල අයිතිකරුවන්ගේ අයිතිවාසිකම.*

91. අක්කර භාගයකට වැඩි කෘෂිකාර්මික ඉඩමක හෝ ඉඩම්වල හෝ අයිතිය නොදරන යම් තැනැත්තකු විසින්, රජයේ යම් ඉඩමක් තමාට ප්‍රදානය කරන ලෙස ඉල්ලීමට සහ රාජ්‍ය හෝ වෙනත් ආයතනයක් විසින් පිරිනමනු ලබන ප්‍රතිලාභයක් ඉල්ලා සිටිය හැකි ය.

මේ වගන්තියේ කාර්ය සඳහා, ඒ තැනැත්තාගේ කලත්‍රයාට හෝ බාලවයස්කාර දරුවන්ට හෝ අයිති ඉඩම්, ඒ තැනැත්තාට අයිති ඉඩම් ලෙස සලකනු ලැබිය යුතු ය.

අයාලේ යන සතුන් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය.

**92.** යම් කෘෂිකාර්මික ඉඩමක හෝ වාරිමාර්ග කර්මාන්තයක් තුළ අයාලේ සැරිසරන යම් සතකු, ඒ සතාගේ අයිතිකරු විසින් ඒ සතාට හිමිකම් දක්වනු ලබන තෙක්, යම් ගොවි සංවිධානයක් විසින් හෝ ගොවි සංවිධානයක බලය ලත් යම් නියෝජිතයකු විසින් හෝ ඒ කෘෂිකාර්මික ඉඩමේ අයිතිකරු නැතහොත් බුක්තිකරු විසින් හෝ අල්ලා ගනු ලැබීම හෝ ගැට ගසා තබනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය. ඒ හා සම්බන්ධ නියෝග සාදනු ලැබිය හැකි ය.

සේවා නියුක්තයන්ට පාරිශ්‍රමික.

**93.** මේ පනතේ මේ කොටසේ සඳහන් යම් ගොවි සංවිධානයක, සභාවක හෝ බලමණ්ඩලයක සෑම නිලතල දරන්නකුට ම, නිලධරයකුට ම හෝ සේවකයකුට ම, ඔවුන්ගේ සේවය සඳහා, නියෝග මගින් නියම කර ඇති මුදල් ප්‍රමාණ නොඉක්මවන පාරිශ්‍රමිකයක් ලබා ගැනීමට හිමිකම ඇත්තේ ය.

කෘෂිකාර්මික ඉඩම බලයෙන් අත්කර ගැනීම.

**94.** අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින්, ඒ නිවේදනයේ සඳහන් යම් කෘෂිකාර්මික ඉඩමක් මේ පනතේ යම් කාර්යයක් සඳහා අත්කර ගැනීම අවශ්‍ය බව සහතික කරනු ලබන අවස්ථාවක දී, ඉඩම් අත්කර ගැනීමේ පනත අදාළ කිරීම සඳහා, පොදු කාර්යයක් පිණිස අත්කර ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනත යටතේ එසේ අත්කර ගනු ලැබිය හැකි ය :

එසේ වුව ද, අත්කර ගැනීමේ පනතේ කුමක් සඳහන්ව ඇත් ද ඒ නොතකා, ඒ පනත යටතේ ඒ ඉඩම අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල, නියමිත ආකාරයට ගණනය කරනු ලබන ඒ ඉඩමේ වාර්ෂික කුලී වටිනාකම දහගුණයකින් වැඩි කිරීමෙන් ලැබෙන ඵලයට සමාන විය යුතු ය.

නියෝග.

**95.** (1) නියම කළ යුතු යයි මේ පනතින් ප්‍රකාශ කොට ඇති හෝ නියමිත හෝ සෑදිය යුතු යයි පනතින් නියමිත හෝ සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරන ලද දිනයේ සිට හෝ නියෝගයේ සඳහන් ඉන් පසු දිනයක සිට හෝ ඒ නියෝගය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය

යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම, ඒ යටතේ කලින් කරනු ලැබූ යම් දෙයකට අගතියකින් තොරව එම අනනුමතියේ දින සිට පරිච්ඡින්න කරන ලදයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

**96.** මේ පනත යටතේ වූ යම් වරදක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වූ යම් වරදක් හෝ සම්බන්ධයෙන් වරදකරු වන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, මේ පනතින් අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකින් හෝ මාස හයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමෙන් හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකින්ම හෝ දඬුවම් කරනු ලැබීමට ඒ තැනැත්තා යටත් වන්නේ ය. දණ්ඩනය.

**97.** (1) ගොවිජන සංවර්ධන අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. ගොවිජන සංවර්ධන අරමුදල.

(2) ඒ අරමුදලට, -

(අ) මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් පනවනු ලබන සියලු දඩ ;

(ආ) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ඒ අරමුදලට ගෙවිය යුතු සියලු මුදල් සහ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලු මුදල් ;

(ඇ) පාර්ලිමේන්තුව විසින් කලින් කල අරමුදල සඳහා වෙන් කර දෙනු ලබන සියලු මුදල්;

(ඈ) ඒ අරමුදලට ගෙවිය යුතු යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් කලින් කල නියම කරනු ලබන සියලු මුදල් ; සහ

(ඉ) මේ පනත යටතේ අක්කර බද්ද වශයෙන් එකතු කර ගනු ලබන සියලු මුදල්වලින් නියමිත ප්‍රතිශතය

ගෙවනු ලැබිය යුතු ය.

(3) නව කෘෂිකාර්මික ප්‍රතිපත්ති බලාත්මක කිරීම, සැපයුම් වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම, ගොවිජන කේන්ද්‍රය පරිපාලනය කිරීම සහ සංවර්ධනය කිරීම, ඒ මධ්‍යස්ථානවල ගොඩනැගිලි, වාහන සහ උපකරණ නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම, ගෘහ භාණ්ඩ මිලට ගැනීම, නිලධරයන් පුහුණු කිරීම, පර්යේෂණ කටයුතු, නිලධරයන්ට ප්‍රවාහන පහසුකම් සැපයීම සහ සාමාන්‍යයෙන් ගොවිජන සංවර්ධන සභාවල පරිපාලනය සහ සංවර්ධනය සහ ගොවිජන සංවර්ධන සභාවලට සහ ගොවි සංවිධානවලට මූලාධාර සැපයීම සඳහා ඒ අරමුදලේ මුදල් උපයෝජනය කර ගනු ලැබිය හැකි ය.

(4) අරමුදලේ ගිණුම්, කොමසාරිස් ජනරාල්වරයා විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, කලින් කල නිශ්චය කරනු ලබන ආකාරයට සහ එසේ නියම කරනු ලබන විස්තර සහිතව, පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

(5) එක් එක් මුදල් වර්ෂය සඳහා අරමුදලේ ගිණුම්, විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(6) අරමුදලේ මුදල් වර්ෂය, එක් එක් වර්ෂයේ ජනවාරි මස පළමුවන දිනයෙන් ආරම්භව දෙසැම්බර් මස තිස්එක් වන දිනයෙන් අවසාන වන දොළොස් මසක කාල පරිච්ඡේදයක් විය යුතු ය.

මේ පනත වෙනත් ලිඛිත නීති අභිබවා බල පැවැත්විය යුතු බව.

**98.** වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, මේ පනතේ විධිවිධාන බල පැවැත්විය යුතු අතර ඒ අනුව, මේ පනතේ විධිවිධාන හා ඒ වෙනත් යම් නීතියේ විධිවිධාන අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇති වූ අවස්ථාවක, මේ පනතේ විධිවිධාන ඒ වෙනත් යම් නීතිය අභිබවා බලපැවැත්විය යුතු ය.

1979 අංක 58 දරන පනත ඉවත් කිරීම.

**99.** (1) 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත ඉවත් කරන ලද්දේ වුව ද, –

(අ) 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතේ 60 වන වගන්තිය මගින් ප්‍රතිෂ්ඨාපනය කරන ලද ගොවිජන සේවා අරමුදලට බැර කොට තිබුණු සියලු මුදල්, මේ පනත මගින් ප්‍රතිෂ්ඨාපනය කරනු ලබන ගොවිජන සංවර්ධන අරමුදලට මාරු කරනු ලැබිය යුතු ය.

(ආ) (i) 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත මගින් පිහිටුවා තිබුණු ගොවිජන සේවා කාරක සභාවල වත්කම් හා බැදීම්, මේ පනතින් පිහිටුවනු ලබන ගොවිජන සංවර්ධන සභාවට මාරු කරනු ලැබිය යුතු ය.

(ii) 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත යටතේ පිහිටුවා තිබුණු ගොවි සංවිධානවල පැවති වත්කම් සහ බැරකම් මේ පනත යටතේ පිහිටුවනු ලබන තදනුරූප ගොවි සංවිධානවලට මාරු කරනු ලැබිය යුතු ය.

(iii) 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත යටතේ පිහිටුවා තිබුණු දිස්ත්‍රික් ගොවි බල මණ්ඩලවල වත්කම් සහ බැරකම්, මේ පනත යටතේ පිහිටුවනු ලබන තදනුරූප ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩල වෙත මාරු කරනු ලැබිය යුතු ය.

(ඇ) (i) 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත යටතේ පිහිටවා තිබුණු ගොවිජන සේවා කාරක සභා මේ පනත යටතේ ගොවිජන සංවර්ධන සභා පිහිටුවනු ලබන තෙක් ක්‍රියාත්මක කොට පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

(ii) 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත යටතේ පිහිටුවා තිබුණු ගොවි සංවිධාන මේ පනත යටතේ ගොවි සංවිධාන පිහිටුවනු ලබන තෙක් ක්‍රියාත්මක කොට පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

(iii) 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත යටතේ පිහිටුවනු ලැබූ දිස්ත්‍රික් ගොවි බල මණ්ඩල මේ පනත යටතේ ගොවිජන සංවිධාන දිසා බල මණ්ඩල පිහිටුවනු ලබන තෙක් ක්‍රියාත්මක කර පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

(ඇ) කාලාවරෝධ ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, 1958 අංක 1 දරන කුඹුරු පනතේ 4(7) (අ) වන වගන්තිය යටතේ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනතේ 3(9) වන වගන්තිය යටතේ හෝ 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතේ 5 (8) වන වගන්තිය යටතේ හෝ අද ගොවීන්ට උපචිත වූ අලාභ හානි සම්බන්ධයෙන් කරනු ලබන හිමිකම් පෑම් මේ පනතේ විධිවිධාන

යටතේ ඒ අද ගොවීන්ට උපචිත වන හිමිකම් පැමි ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනතේ තදනුරූප විධිවිධානවලින් සලස්වා ඇති ආකාරයට අය කර ගනු ලැබිය යුතු ය.

(ඉ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතේ විධිවිධාන යටතේ පරීක්ෂණ නිලධරයකු හෝ සමාලෝචන මණ්ඩලයක් හෝ ඉදිරියේ විභාගයට පාත්‍රව පැවති සියලු නඩු කටයුතු, මේ පනත මගින් ප්‍රතිෂ්ඨාපනය කරන ලද තදනුරූප ගොවිජන විනිශ්චය සභාව ඉදිරියේ පවරනු ලැබූ නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ නඩු කටයුතු මේ පනත යටතේ වූ ගොවිජන විනිශ්චය සභාව ඉදිරියේ පවත්වා ගෙන ගොස් අවසන් කරනු ලැබිය හැකි ය.

(ඊ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, 1958 අංක 1 දරන කුඹුරු පනතේ 21 වන වගන්තිය යටතේ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත යටතේ හෝ 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත යටතේ හෝ මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ විභාගයට පාත්‍ර වී තිබුණු සියලු නඩු කටයුතු, එකී පනතක් ඉවත් කරනු ලැබීමේ හේතුව මත නතර කරනු ලැබූ හෝ අත්හිටවනු ලැබූ හෝ කවර වුව ද ආකාරයකින් ඒ නඩු කටයුතුවලට අගතියක් සිදු වූ ලෙස නොසැලකිය යුතු අතර, ඒ අනුව, ඒ සියලු නඩු කටයුතු මේ පනතේ තදනුරූප විධිවිධාන යටතේ පවත්වා ගෙන ගොස් අවසාන කරනු ලැබිය යුතු ය.

(උ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂි පලදාවර්ධන පනතේ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනතේ හෝ 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතේ හෝ විධිවිධාන යටතේ යම් අධිකරණයක් ඉදිරියේ විභාගයට පාත්‍රව පැවති සියලු නඩු කටයුතු, මේ පනතේ තදනුරූප විධිවිධාන යටතේ විභාග කොට අවසාන කරනු ලැබිය යුතු ය.

(ඌ) 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත යටතේ සාදනු ලැබ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී බලාත්මකව පැවති

සෑම නියෝගයක් ම, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුර, මේ පනත යටතේ සාදන ලද නියෝගයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, එවැනි යම් නියෝගයක් මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් සංශෝධනය කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**100.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**101.** මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස–

"කෘෂිකර්මය" යන්නට, –

(i) වී, කෙත් භෝග, කුළු බඩු, කාර්මික භෝග, එළවළු, පළතුරු, මල්, තණබිම් හෝ සත්ත්වාහාර වගා කිරීම ;

(ii) කිරි පට්ටි පාලනය ගොවිපළ සතුන් ඇති කිරීම සහ බෝ කිරීම ;

(iii) පැළ සහ පළතුරු තවාන් ; සහ

(iv) මීමැසි පාලනය සහ මිරිදිය ධීවර කර්මාන්තය

ඇතුළත් වේ ;

"කෘෂිකාර්මික කටයුතු" යන්නෙන්, කෘෂිකර්මයට සම්බන්ධ කටයුතු අදහස් වන අතර, එවැනි කටයුතු සඳහා සහ සුළු වාරි කර්මාන්ත සඳහා ආධාර කරනු ලබන සහ පාවිච්චි කරනු ලබන යන්ත්‍රෝපකරණ සහ උපකරණ ඊට ඇතුළත් වේ.

"කෘෂිකාර්මික ඉඩම" යන්නෙන්, මේ පනතේ අර්ථානුකූලව කෘෂිකර්මය සඳහා භාවිත කරනු ලබන හෝ භාවිත කරනු ලැබිය හැකි හෝ ඉඩම් අදහස් වන අතර, පුද්ගලික ඉඩම් ද ඉඩම් සංවර්ධන ආඥාපනත හෝ රජයේ ඉඩම් ආඥාපනත හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් හෝ යටතේ අන්සතු කරන ලද ඉඩම් ද ඊට ඇතුළත් වේ ;

"කෘෂිකාර්මික පාර" යන්නෙන්, කෘෂිකාර්මික පලදාව ප්‍රවාහනය කිරීමට හෝ අස්වැන්න ප්‍රවාහනය කිරීමට හෝ සතුන් ප්‍රවාහනය කිරීමට හෝ කෘෂිකාර්මික උපකරණ සහ යන්ත්‍රෝපකරණ ප්‍රවාහනය කිරීමට හෝ කෘෂිකාර්මික සේවා සැපයීමට හෝ වෙනත් යම් කෘෂිකාර්මික කටයුත්තක් සඳහා පාවිච්චි කරනු ලබන පාරක් අදහස් වන අතර, කෘෂිකාර්මික ඉඩමකට ප්‍රවේශ වීම සඳහා පාවිච්චි කරනු ලබන පාරක් ද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙර කවර වූව ද කාර්යයක් සඳහා පාවිච්චි කරන ලද පාරක් ද ඊට ඇතුළත් වේ ;

"යම් ජල මාර්ගයක ඉවුර" යන්නෙන්, යම් ගඟක්, ඔයක්, ජල පහරක් හෝ ඇලක්, ස්වාභාවික ජල මාර්ගයක් හෝ නිරන්තරයෙන් සහ නිර්බාධිතව ජලය ගලා යාම සඳහා ඉදි කරන ලද ඇලක් හෝ දොලක් හෝ එවැන්නකින් ජලාශයකට හෝ එහි යම් කොටසකට හෝ ජලය ගලා යන ජල මාර්ගයක් හෝ ජල මාර්ගයක බිහි දොරක් සහ එවැනි "යම් ජල මාර්ගයක" ඉවුර අදහස් වන අතර, එවැනි ජල මාර්ගයක ඉවුරේ අද්දර සිට අඩි 33 ක් ගොඩබිමට විහිදෙන භූමි ප්‍රදේශය ඊට ඇතුළත් වේ ;

"ඉදි කිරීම" යන්න යම් වාරි කර්මාන්තයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, යම් වාරි කර්මාන්තයකට කරන ලද යම් වැඩි දියුණු කිරීමක් හෝ ව්‍යාප්තියක් හෝ අතහැර දමන ලද යම් වාරි කර්මාන්තයක් අලුත්වැඩියා කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම හෝ (මෙහි මින් මතු දක්වනු ලබන "නඩත්තු කිරීම" යන්නෙහි අර්ථ නිරූපණයට යටත්ව) යම් වාරි කර්මාන්තයක් ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන යම් ක්‍රියා මාර්ගයක් හෝ ඒ යටතට පත් වන ජලය සැපයිය හැකි ප්‍රදේශ හෝ එවැනි කර්මාන්තයක නැතහොත් ප්‍රදේශයක යම් කොටසක් ඊට ඇතුළත් වේ ;

"ගොවියා" යන්න යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, ගොවි සංවිධානයක් හෝ ගොවිජන සංවර්ධන සභාවක් හෝ නොවන, තමා විසින් ම හෝ තම පවුලේ යම් සාමාජිකයකු විසින් හෝ වෙනත් යම් තැනැත්තකු සමග හවුලේ හෝ ඒ කුඹුරු ප්‍රමාණයෙහි–

(අ) සී සෑම, වැපිරීම සහ ගොයම් කැපීම යන ක්‍රියාවලිවලින් දෙකක් හෝ ඊට වැඩි ගණනක් කරන ; සහ

(ආ) ඒ කුඹුරු ප්‍රමාණයෙහි ගොයම් වගා කරනු ලබන එක් එක් කන්නයේ දී ඒ ගොයම් වගාවට සාත්තු කරන හෝ එය රැක බලා ගන්නා

යම් තැනැත්තෙක් අදහස් වේ.

"නෙරපීම" යන්න කුඹුරක අඳ ගොවියකු සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඔහුට අඳයට දී ඇති සම්පූර්ණ කුඹුරු ප්‍රමාණය ම හෝ ඉන් යම් කොටසක් හෝ පාවිච්චි කිරීමේ, බුක්ති විඳීමේ සහ වගා කිරීමේ අයිතිය සෘජු හෝ වක්‍ර ක්‍රම මගින් ඔහුට අහිමි කිරීම ඉන් අදහස් වේ.

"වාරි කර්මාන්ත" යන්නට, –

(අ) වාරි කර්මාන්තයක් සංයුක්ත වන හෝ ඊට ආනුෂංගික වන හෝ අනුයාත වන යම් වැවක්, වේල්ලක්, අමුණක්, ඇලක්, කුඹුරු අතු වේල්ලක් හෝ ජල මාර්ගයක් ඇතුළත් වේ ;

(ආ) වාරි කර්මාන්තයක් ඉදිකිරීම හෝ නඩත්තු කිරීම සංයුක්ත වන හෝ ඊට ආනුෂංගික වන හෝ අනුයාත වන යම් ව්‍යුහයක්, පාරක්, පාලමක්, සොරොව්වක්, දොරටුවක් හෝ වෙනත් ඉංජිනේරු කර්මාන්තයක් ඇතුළත් වේ ;

(ඇ) වගා කළ යම් ප්‍රදේශයක පිහිටි ගොවිතැන් කළ යම් ප්‍රදේශයකින් ලවණ ජලය බැස යාමට සැලැස්වීම හෝ ඒ ප්‍රදේශයට ලවණ ජලය ගලා ඒම හෝ ඉන් පිටතට ගලා යාම වැළැක්වීම හෝ විධිමත් කිරීම හෝ එවැනි ප්‍රදේශ ජල ගැලීම්වලින් ආරක්ෂා කිරීම සඳහා ඉදි කරන ලද යම් ව්‍යුහයක් වේල්ලක්, සොරොව්වක් හෝ වෙනත් ඉංජිනේරු කර්මාන්තයක් ඇතුළත් වේ ;

"ඉඩම් හිමියා" යන්නෙන්, කුඹුරු ප්‍රමාණයක් සඳහා යෙදී ඇති විට, ඒ කුඹුරු ප්‍රමාණය යම් තැත්තකුට බද්දට හෝ කුලියට දෙන ලද නම් තත් කාලයේ ඒ කුලිය ලබා ගැනීමට හිමිකම ඇති, ඉඩම් හිමි ගොවියකු නොවන, තැනැත්තකු ඉන් අදහස් වන අතර, යම් අතුරු අඳ ගොවියකුට ඒ කුඹුරු ප්‍රමාණය බදු දෙන අඳ ගොවියකු ද ඊට ඇතුළත් වේ ;

"බදු දීම" යන්නෙන් යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, යම්, සේවයක් ඉටු කිරීම හෝ යම් මුදල් ප්‍රමාණයකින් බදු මුදල් ගෙවීම හෝ ඒ කුඹුරු ප්‍රමාණයේ අස්වැන්නෙන් කොටසක් දීම හෝ ප්‍රතිඥා කොටගෙන, වාචික හෝ ලිඛිත ගිවිසුමක් මත ඒ කුඹුරු ප්‍රමාණය බුක්ති විඳීමට සහ පාවිච්චි කිරීමට යම් තැනැත්තකුට අවසර දීම අදහස් වේ ;

"ණය" යන්නෙන්, යම් ණයක්, අත්තිකාරමක් හෝ අයිරාවක්, ඊට පොළිය ද සමග අදහස් වේ ;

"නඩත්තු කිරීම" යන්න යම් සුළු වාරි කර්මාන්තයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, එවකට පවත්නා යම් වාරි කර්මාන්තයක් හෝ ඒ යටතේ ජලය සපයනු ලැබිය හැකි ප්‍රදේශ හෝ ආරක්ෂා කිරීම ඊට ඇතුළත් වේ ;

"පවුලේ සාමාජිකයා" යන්න යම් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඒ තැනැත්තාගේ කලත්‍රයා හෝ වයස අවුරුදු දහඅටට අඩු පුත්‍රයකු හෝ දියණියක ඉන් අදහස් වේ ;

"සුළු වාරි කර්මාන්තය" යන්නෙන්, අක්කර දෙසීය දක්වා වූ කෘෂිකාර්මික ඉඩමකට ජලය සපයන වාරි කර්මාන්තයක් අදහස් වේ ;

"බුක්තිකරු" යන්නෙන්, බදු ගැනුම්කරුවකු හෝ පොළිමරා බුක්තිකරුවකු හෝ වීම හේතු කොට ගෙන කෘෂිකාර්මික ඉඩමක් පාවිච්චි කිරීමට හෝ එහි බුක්තිය දැරීමට හෝ තත් කාලයේ හිමිකම ඇත්තා වූ තැනැත්තකු අදහස් වන අතර, ඉඩම් සංවර්ධන ආඥාපනත, රජයේ ඉඩම් ආඥාපනත හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් හෝ යටතේ නියාදනය කරන ලද කෘෂිකාර්මික ඉඩම් පාවිච්චි කරන බුක්ති විඳින තැනැත්තන් ද මේ පනතේ අර්ථානුකූලව අඳ ගොවියකු ද ඊට ඇතුළත් වේ ;

"ඉඩම හිමි ගොවියා" යන්න යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඒ ඉඩම් ප්‍රමාණයේ අයිතිකරු හෝ පොලීමරා අයිතිකරු හෝ වන්නා වූ ද ඒ මුළු ඉඩම් ප්‍රමාණයේම ගොවියා වන්නා වූ ද තැනැත්තා අදහස් වන අතර, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ

ප්‍රදානය කරන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් වන විට, ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණයට අයිතිය ලබා ගෙන ඇත්තා වූ ද ඒ සම්පූර්ණ ඉඩම් ප්‍රමාණයේ ම ගොවියා වන්නා වූ ද තැනැත්තා ඒ ඉඩම් ප්‍රමාණයේ ඉඩම් හිමි ගොවියා ලෙස සලකනු ලැබිය යුතු ය ;

"කුඹුරු ඉඩම" යන්නෙන්, වී වගා කොට ඇත්තා වූ හෝ වී වගා කිරීමට පිළියෙළ කොට ඇත්තා වූ හෝ යම් පෙර කාලයක දී වී වගා කොට තිබුණා වූ සහ වී වගා කිරීමට යෝග්‍ය වන්නා වූ හෝ ඉඩමක් අදහස් වන අතර, ඒ ඉඩමට යාබදව නැතහොත් ඒ ඉඩමට අනුබද්ධිතව පිහිටියා වූ ද කමතක් වශයෙන් හෝ පදිංචිය සඳහා නිවාසයක් ඉදි කිරීම සඳහා හෝ ගොවියා විසින් භාවිත කරනු ලබන්නා වූ ද ඉඩමක් ඊට ඇතුළත් වන නමුත් යම් හේන් ඉඩමක් හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ අවසරය ඇතිව, මේ පනතේ විධිවිධානවලට අනුකූලව, ගොවිතැන් කටයුතු නොවන වෙනත් කටයුතු සඳහා භාවිත කරනු ලබන හෝ කුඹුරු ඉඩමක් නොවන බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරන ලද ඉඩමක් ඊට ඇතුළත් නොවේ ;

"සාම නිලධරයා" යන්නට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

"නියමිත" යන්නෙන්, මේ පනතින් හෝ, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියමිත යන්න අදහස් වේ ;

"නියමිත බැංකුව" යන්නෙන් නියම කරන ලද යම් බැංකුවක් අදහස් වේ ;

"ව්‍යවස්ථාපිත බදුකරු" යන්නෙන් ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දෙන ලද ඔප්පුවක් යටතේ හෝ කොමසාරිස් ජනරාල්වරයාගෙන් ලබා ගන්නා ලද ලිඛිත ගිවිසුමක් යටතේ හෝ යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක් වගා කරන තැනැත්තෙක් අදහස් වේ ;

"කමත" යන්නෙන්, කය වෙහෙසා හෝ ගවයන් යොදා හෝ යන්ත්‍රානුසාරයෙන් හෝ ගොයම් පෑගීම සඳහා හෝ වී හුලං කිරීම සඳහා හෝ ගොයම් කොළ ගැසීම සඳහා හෝ පිළියෙල කරන ලද නැතහොත් භාවිත කරනු ලබන බිමක් අදහස් වේ ;

"ජල මාර්ගය" යන්නෙන්, යම් ගඟක්, අතු ගංගාවක් හෝ ඔයක් හෝ ඇලක් හෝ ස්වාභාවික ඇලක් හෝ කලින් කල ජලය ගලා ගෙන යාම සඳහා පිළියෙල කරන ලද ඇලක් හෝ ජලය ගලා ගෙන යන අතු ගංගාවක් හෝ ජල මාර්ගයක් හෝ එවැනි අතු ගංගාවක අත්තක් හෝ අදහස් වන අතර, එකී යම් ජල මාර්ගයක මධ්‍යයේ සිට එහි ඉවුර දක්වා ඇති පළල ප්‍රමාණයට සමාන පළලට ඒ ඉවුරු දෙපසේම සිට ගොඩ දෙසට විහිදෙන ප්‍රදේශය ඊට අයත් වේ ;

උපලේඛනය (33 වන වගන්තිය)

..............................................අධිකරණයේ
(මහෙස්ත්‍රාත් අධිකරණයේ නම)

මහෙස්ත්‍රාත්වරයා වෙත

කොමසාරිස් ජනරාල්වරයා / අතිරේක කොමසාරිස් ජනරාල්වරයා / කොමසාරිස්වරු / නියෝජ්‍ය කොමසාරිස්වරු / සහකාර කොමසාරිස්වරු ........................................ (නම සඳහන් කරන්න) නමැති මම, 2000 අංක :............................................................දරන ගොවිජන සංවර්ධන පනතේ 33 වන වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, මේ ඉල්ලීම මගින්,-

(අ) පහත දැක්වෙන කරුණු ඉදිරිපත් කරමි, එනම්,-

(i) මම කොමසාරිස් ජනරාල්වරයා/අතිරේක කොමසාරිස් ජනරාල්වරයා / කොමසාරිස්වරයා / නියෝජ්‍ය කොමසාරිස්වරයා / සහකාර කොමසාරිස්වරයා වෙමි ;

(ii) මේ ඉල්ලීමේ දක්වා ඇති උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම කුඹුරු ඉඩමක් වේ ;

(iii) 2000 අංක ...................................දරන ගොවිජන සංවර්ධන පනතේ 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන, ............................................ පදිංචි ............................................ විසින් උල්ලංඝණය කරමින් ක්‍රියා කරගෙන යනු ලැබේ.

(ආ) එකී ගොවිජන සංවර්ධන පනතේ 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝණය කරමින් ක්‍රියා කිරීමෙන් එකී ...................................................................ද ඔහුගේ නියෝජිතයන් හෝ සේවකයන් ද වළක්වාලන ආඥාවක් නිකුත් කරන මෙන් අයැද සිටිමි.

ඉහත සඳහන් උපලේඛනය

.......................................................................ප්‍රාදේශීය ලේකම්
කොට්ඨාසයේ.......................................................ග්‍රාම නිලධාරි
කොට්ඨාසයේ.......................................................නාමැති ගමේ
පිහිටා ඇති,

උතුරට............................................... ගෙන්
නැගෙනහිරට........................................ ගෙන්
දකුණට........................................ ගෙන්, සහ
බස්නාහිරට......................................... ගෙන්

මායිම් වූ ද අක්කර......................... රූඩ් ............................
පර්චස්... .......................................විශාලත්වය ඇත්තා වූ ද කුඹුරු ඉඩම

...................................................
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ/
අතිරේක කොමසාරිස් ජනරාල්වරයාගේ/
කොමසාරිස්වරයාගේ/නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ/
සහකාර කොමසාරිස්වරයාගේ අත්සන හා මුද්‍රාව

දිනය..............

344

ඇමුණුම - 03

# ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
## கமநல அபிவிருத்தித் திணைக்களம்
## DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

මගේ අංකය / எனது இல. / My No. 7/11/9/14

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2012.11.24

ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය
20 DEC 2012
දිස්ත්‍රික්කය

**චක්‍රලේඛ අංකය: 14/ 2012**

දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරුන්,

කොළඹ/ගම්පහ/කළුතර/රත්නපුර/[redacted]/කුරුණෑගල/ගාල්ල/මහනුවර/නුවරඑළිය/මාතලේ/බදුල්ල

**<u>තෙත් කලාපයේ පුරන් වී ඇති කුඹුරු ඉඩම් වල පරිසර හානියක් ඇති නොවන පරිදි කෙටි කාලීන භෝග වගා කිරීම තුලින් භූමිය ඵලදායී ලෙස පරිහරණය කිරීම.</u>**

01. වැඩි වන ජනගහනය හා සිදුවෙමින් පවතින පාරිසරික වෙනස්කම් හමුවේ, ඉදිරියේදී ලොව දරුණු ආහාර හිඟයකට මුහුණ පෑමට සිදු විය හැකි බවට ලොව පුරා සිටින කෘෂි විද්‍යාඥයින් විසින් සිදු කරනු ලබන අනතුරු හැඟවීම් හමුවේ "මහින්ද චින්තන ඉදිරි දැක්මට" අනුව ශ්‍රී ලංකාව සහලින් ස්වයංපෝෂිත කර ශක්තිමත් කෘෂි ආර්ථිකයක් ස්ථාපිත කිරීම ඉලක්ක කර ගනිමින්, වගා කළ හැකි සෑම කුඹුරක්ම වී වගාව සඳහා යෙදවිය යුතු බවට 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 30 වගන්තියේ සඳහන් මග පෙන්වීම පෙරදැරි කර ගනිමින් , පුරන් කුඹුරු විශාල ප්‍රමාණයක් නැවත වගා කරවීමට මෙම දෙපාර්තමේන්තුව විසින් දැනටමත් කටයුතු කර ඇත. එසේම, ඉදිරියේදීද පර්යේෂණ හා අත්හදා බැලීම් සිදු කරමින් හා නවීන තාක්ෂණය යොදා ගනිමින් ඉතිරි වී ඇති පුරන් කුඹුරු නැවත වගා කරලීමට අවශ්‍ය ඒකාබද්ධ සැලසුම් මෙම දෙපාර්තමේන්තුව විසින් දැනටමත් පිළියෙල කරමින් හා ක්‍රියාත්මක කරමින් සිටී. එහෙත්, ඵලදායීතත්වයට පත් කිරීම සඳහා දිගු කාලීන ඒකාබද්ධ ප්‍රවේශයන් අවශ්‍ය වීම නිසා, වී වගා කළ නොහැකි වූ පුරන් කුඹුරු විශාල ප්‍රමාණයක් කෘෂිකාර්මික භාවිතයෙන් තොරව තෙත් කලාපය තුල තව දුරටත් පුරන්ව පැවතීම කඩිනමින් විසඳිය යුතු ගැටළුවක් ලෙස අප විසින් හඳුනාගෙන ඇත.

02. මේ සඳහා විසඳුමක් ලෙස 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන( සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ II වන කොටසේ 30(2) හා 30(3) යන පහත සඳහන් වගන්ති උපයෝගී කර ගැනීමට තීරණය කර ඇත.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, ஸேர் மார்கஸ் பெர்னாந்து மாவத்தை, அ.பெ. 537 கொழும்பு 07.
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT, No. 42, Sir Marcus Fernando Mawatha, P. O Box 537, Colombo 07.
දුරකථන / தொலைபேசிகள் / Telephones
පොදු කාර්යාලය / பொது அலுவலகம் / General Office: 2694231, 2694232, 2694233, 2694234
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් / கமநல அபிவிருத்தி ஆணையாளர் நாயகம் / Commissioner General of Agrarian Development: 2691060
ෆැක්ස් / தொலைநகல் / Fax: 2693572, 2691843, 2674481
E-mail: dadsl@mail.ewisl.net
විදුලි පණිවුඩ / தந்தி / Telegram: ගොවිජනසේවා / கமசேவை / Agraservis

## 30(2) වගන්තියේ සාරාංශය

වී වගා කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් හඳුනාගෙන ඇති කුඹුරු ඉඩම් ස්වභාවික හෝ වෙනත් හේතුවක් නිසා ,යම් කන්නයක් තුල වී වගා කිරීමට නොහැකි වන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත අවසරය ලබා ගැනීමෙන් පසු, ඒ කුඹුරු ඉඩමේ බහු වාර්ෂික නොවන ( කෙටි කාලීන හෝ කන්න භෝග) භෝග වගා කරනු ලැබිය හැකිය.

## 30(3) වගන්තියේ සාරාංශය

වී හැර වෙනත් යම් භෝගයක් වගා කිරීමෙන් සතුටුදායක ඵලදාවක් ලබා ගත හැකි කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් වන විට , කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත අවසරයක් ලබා ගෙන ඒ කුඹුරු ඉඩමේ වී හැර වෙනත් අර්ධ වාර්ෂික භෝග වගා කරනු ලැබිය හැකිය.

03. මෙම නෛතික පසුබිම තුල සිට, දිගු කාලීනව පුරන් වී ඇති කුඹුරු ඉඩම් නිශ්චිතවම හඳුනාගෙන, සුදුසු දිගු කාලීන නොවන අර්ධ වාර්ෂික භෝග වගාවන් කෙරෙහි ගොවි ජනතාව යොමු කරවීමට කටයුතු කළ යුතුව ඇති අතර, ඒ මගින් ගොවිජනතාව ඵලදායී කෘෂිකාර්මික ඉඩම් පරිහරණයකට යොමු කරවීමත්, එසේම ඔවුන්ගේ ආර්ථික මට්ටම වඩාත් යහපත් කිරීමත්, පාරිසරික වශයෙන් වඩාත් හිතකර හා සුන්දරවූත් , සෞඛ්‍යාරක්ෂිත වූත් පරිසරයක් නිර්මාණය කිරීමත් යන අරමුණු ඉටු කර ගැනීමට හැකි වනු ඇත.

04. ඉහත යෝජනාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් වැඩපිලිවෙල ඔබ වෙත මෙයින් හඳුන්වා දෙමි.

I. මෙම යෝජනාවලිය ක්‍රියාත්මක කිරීමට අදාල කුඹුරු ඉඩම් හඳුනා ගැනීම සඳහා පනතින් සංශෝධිත (සංශෝධන )දරණ ගොවිජන සංවර්ධන 46 අංක 2011 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත යටතේ 11 වන කොටසේ 29(2) හා 29(3) වගන්ති ප්‍රකාරව දිස්ත්‍රික් මට්ටමේ ඵලදායීතා කමිටු පත් කිරීම. කෘෂිකර්ම, වාරිමාර්ග යන ක්ෂේත්‍ර , පළාත් සභා හා දිස්ත්‍රික් ලේකම්වරුන් නියෝජනය කරන දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්ගෙන් හා ගොවි සංවිධාන නියෝජනය කරමින් අවම වශයෙන් එක් ගොවි සංවිධාන නියෝජිත මහතෙකුගෙන් සමන්විත ඵලදායිතා කමිටු මා විසින් වාර්ෂිකව නම් කරනු ලබන අතර, එම පනතේ 29(4) වගන්තිය යටතේ කමිටු ලේකම්වරයා ලෙස දිස්ත්‍රික්කයේ ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් ක්‍රියාකල යුතුව ඇත.

II. මෙසේ පත් කරනු ලබන ඵලදායිතා කමිටු විසින් වෙනත් කෙටි කාලීන කෘෂිකාර්මික භෝග වගා කල හැකි පුරන් කුඹුරු පිළිබඳව ගොවීන් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍ර හා ඊට අදාල තොරතුරු ගොවි සංවිධාන වලින් හා ගොවිජන සංවර්ධන සභා (හෝ ගොවිජන සේවා කාරක සභා) වෙතින් ලබාගත යුතුය. මෙසේ තොරතුරු ලබා ගැනීමේදී ආකෘති අංක-01 භාවිතා කල යුතු වේ.

III. මෙසේ ඉදිරිපත් වනු ලබන යෝජනා පහත සඳහන් වර්ගීකරණය අනුව වෙන් කර ගත යුතුවේ.

| | | |
|---|---|---|
| මහා වාරිමාර්ග | - | (වගාබිම් ප්‍රමාණය අක්කර 1000ට වැඩි) |
| මධ්‍යම වාරිමාර්ග | - | (වගාබිම් ප්‍රමාණය අක්කර 201-1000) |
| සුලු වාරිමාර්ග | - | (වගාබිම් ප්‍රමාණය අක්කර 200 දක්වා) |

මහ වාරි
- අහස්දිය
- ඇල මාර්ග යටතේ
- හැල් / අර්ධ හැල් තත්ත්ව යටතේ
- ඉනුම්දිය/ උල්පත් මගින්
- විල්,පොකුණු ආදිය මගින්
- කරදිය පාලන
- ගංවතුර පාලන

IV. මෙසේ යෝජනා කරනු ලබන ඉඩමක් හෝ ඉඩම් කිහිපයක් පිහිටා ඇත්තේ යම් වාරිමාර්ගයක් හෝ වගා බිම් යායක් යටතේ නම් මේ සඳහා අනුමැතිය ලබාදීමට පෙර ගොවිජන සංවර්ධන පනතේ 86(1)(ඌ) වගන්තිය යටතේ එම වාරිමාර්ගයේ හෝ යායේ ඉඩම් හිමි ගොවීන්ගේ හා භුක්තිකරුවන්ගේ විශේෂ රැස්වීමක් පවත්වා මේ සඳහා එම රැස්වීමේදී එකඟතාවය ලබා ගත යුතුය.මෙහිදී ගොවිජන සංවර්ධන පනතේ 86(1)(අ) වගන්තියේ සඳහන් ප්‍රකාර, "සෑම ගොවි සංවිධානයක් විසින්ම තම බලප්‍රදේශ තුල, කෘෂිකාර්මික ඉඩම් හෝ කුඹුරු ඉඩම් වල හෝ වී වගා කිරීම නැතහොත් වෙනත් ආකාරයක බෝග වගා කිරීම සඳහා ධෛර්ය දීම සහ එම වගා කටයුතු ව්‍යාප්ත කිරීම" අදාල ගොවි සංවිධානයේ වගකීමක් ලෙස හඳුනාගෙන ඇත. එසේම එම වාරිමාර්ග හෝ කුඹුරු යායේ පාලනය පිළිබඳ වගකීම යම් රාජ්‍ය ආයතනයක් දරයි නම්, මේ සඳහා එම රාජ්‍ය ආයතනයේ ලිඛිත එකඟතාවය ලබා ගත යුතුවේ.

මෙසේ වෙනත් කෙටි කාලීන බෝග වගා කිරීම තුලින්, යායේ වගා කටයුතු සිදු කරන අනිකුත් ගොවීන්ගේ වගා කටයුතු වලට බාධා නොපැමිණෙන බව තහවුරු කර ගැනීම ඉහත උත්සාහයේ පරමාර්ථය වේ.

V. ඉහත කාර්ය සඳහා පත් කරනු ලබන එලදායීතා කමිටු සාමාජිකයින්ට අවශ්‍යයැයි හැඟෙන අවස්ථා වලදී, ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් පෞද්ගලිකව අදාල කුඹුරු ඉඩම් පරීක්ෂා කළ හැකි අතර, අවශය වෙතැයි හැඟෙන නිලධාරීන්ගේ නිරීක්ෂණ හා නිර්දේශ කැඳවිය හැකි වේ.මෙහිදී විශේෂයෙන් කෘෂිකර්ම උපදේශකගේ හා වාරිමාර්ග තාක්ෂණ නිලධාරීගේ නිර්දේශ හා යෝජනා සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතුවේ.

VI. පහත සඳහන් කෙටි කාලීන බෝග වගාවන් සඳහා මෙන්ම පරිසර හිතකාමී කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සඳහා සිය නිර්දේශ ලබා දීමට එලදායීතා කමිටු වෙත බලතල පැවරේ.

(අ) එදිනෙදා පරිභෝජනය කළ හැකි එලවලු වර්ග වගා කිරීම.

(ආ) කංකුං, මුකුණුවැන්න , ගොටු කොළ, සාරණ, අසමෝදගම් නිවිති වැනි ආහාරයට ගනු ලබන පළා වර්ග වගා කිරීම , දූර්වල ජලාපවහනයක් ඇති පහත් බිම් වල කොහිල, නෙලුම් දඬු, කෙකටිය, මැඩ කොකු , කැරුන්කොකු,නීරමුල්ලිය වැනි වගාවන් සිදු කිරීම.

(ඇ) සුදුසු කුඹුරු ඉඩම් වල දැනට දුර්ලභව පවතින ලංකාවටම ආවේණික අල වර්ග වන කදල,දංදිල, කිරි අල, වැල් අල, කුකුල් අල, රට අල, ජා අල යනාදිය වගා කිරීම.

(ඈ) කහ,ඉඟුරු වැනි බෝග වගා කිරීම.

(ඉ) කිරි එළදෙනුන් සඳහා අවශ්‍ය වන තෘණ වර්ග වගා කිරීම.

(ඊ) මනා ජල වහනයක් ඇති ඉඩම් වල බඩ ඉරිඟු, මිරිස්, රට කජු වැනි අතිරේක බෝග වගා කිරීම.

(උ) කුඩා ප්‍රමාණයේ පොකුණු,පතස්, ගොඩ වලවල් ආදී වැසි ජලය රැස් කිරීම සඳහා මෙන්ම රොන්මඩ, යකඩමල සහිත ජලය පෙරා වෙන් කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

(ඌ) පැල තවාන් පවත්වා ගැනීම, තාවකාලික ආරක්ෂක ගෘහ, මල්පැල වගා කිරීම ආදිය සඳහා ජල සැපයුමක් නොමැති වීම නිසා පුරන්වූ කුඹුරු ඉඩම් යොදා ගැනීම.

(එ) එක් බෝගයක් වෙනුවට කෙටි කාලීන මිශ්‍ර බෝග හෝ අතුරු බෝග (Mix Cropping or Inter Cropping) හඳුන්වා දීමටද ඉඩකඩ සලසා දීම.

(ඒ) ස්වභාවික හෝ කෘතිම ජල මාර්ග , ජල උල්පත්, වාරිමාර්ග නිර්මිත, කෘෂි මාවත් ආදිය සඳහා අවශ්‍ය රක්ෂිත වෙන් කිරීම.

VII. මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක වන අනුපිළිවෙල හා වගකීම් ඇමුණුම් -1 හි දක්වා ඇත.

05. තම දිස්ත්‍රික්කයට අදාලව මෙම චක්‍රලේඛයේ 4(vi) හි සඳහන් **කෙටිකාලීන** බෝග වගාවන්ට අමතරව වෙනත් බෝග හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා අනුමැතිය **ලබාදිය** යුතුයැයි අදාල ඵලදායිතා කමිටු අදහස් කරන්නේ නම්, ඒ පිලිබඳව වූ නව යෝජනාවලිය **සාධ්‍යතා** තහවුරු කිරීම් සහිතව මා වෙත ඉදිරිපත් කොට, ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට **ඵලදායිතා** කමිටු වලට ඉඩකඩ ඇත.

එසේම තම දිස්ත්‍රික්කයේ දැනට පවතින පුරන් කුඹුරු නැවත වී වගා කිරීම සඳහා **මෙන්ම** ඉදිරියේදී පුරන් කුඹුරු ඇතිවීම වැලැක්වීම සඳහාත්, කුඹුරු ඉඩම් වල ඵලදායීතාවය ඉහල නැංවීම සඳහාත් වූ යෝජනා (ව්‍යාපෘති වාර්තා) මා වෙත ඉදිරිපත් කිරීමෙන් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය හා අනිකුත් ආධාර ලබා ගැනීමටද ඵලදායී කමිටු වලට හැකියාව ඇත.

මෙම චක්‍රලේඛ උපදෙස් ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් උපදෙස් අනුගමනය කිරීම අත්‍යාවශ්‍ය වේ.

(අ) මොනම හේතුවක් නිසාවත් දැනට වී වගා කරන කුඹුරු ඉඩම්, වෙනත් බෝග වගාවන් හෝ ක්‍රියාකාරකම් සඳහා යොදා ගැනීමට අනුමැතිය ලබා නොදිය යුතුය.

(ආ) පාරිසරික වශයෙන් අතිශයින් සංවේදී වූ පුරන් කුඹුරු ඉඩම් දිගු කාලීන සැලසුම් මඟින් නැවත වී වගා කල හැකි තත්වයට පත් කිරීම ජාතික අවශ්‍යතාවයක්ව පවතින බැවින්, පුරන් කුඹුරු ඉඩම් වල දිගු කාලීන, ස්ථිර හෝ බහු වාර්ෂික බෝග වගා කිරීමට මේ මඟින් අවසර ලබා නොදිය යුතුය.

(ඇ) කෙටි කාලීන බෝග වගාවන් හඳුන්වා දීම තුලින් මොනම හේතුවක් නිසාවත් කුඹුරු ඉඩම් ගොඩ කිරීම සඳහා ඉඩකඩ ලබා නොදිය යුතුය.

(ඉ) කෙටිකාලීන බෝග වගාවන් සිදු කිරීම තුලින් පවතින ජල මාවත් හෝ ජලාපවහන පද්ධති අවහිර නොවන බවට හෝ අහිතකර පරිසර තත්වයක් ඇති නොවන බවට ඵලදායිතා කමිටු සෑහීමකට පත්විය යුතුය. එසේම දැනටමත් සිදු වෙමින් පවතින වී වගාව ඇතුලු අනිකුත් වගාවන් සඳහා මේ මඟින් බාධා නොපැමිණිය විය යුතුය.

(ඊ) දැනටමත් අඳ ගොවි අයිතියක් ස්ථාපිත වී ඇති කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේදී 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන( සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 35 (1),(2),(3)

වගන්තිය අනුගමනය කල යුතු අතර, කුඹුරු ඉඩම් ප්‍රමාණයේ අඳ ගොවියා විසින් වෙනත් කෘෂිකාර්මික භෝගයක් සම්බන්ධයෙන් ඉඩම් හිමියා වෙත ගෙවිය යුතු බද්ධ තීරණය කිරීම දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරුන් වෙත පවරමි. මේ සම්බන්ධයෙන් අදාල ගොවිජන සංවර්ධන සභාවේ මෙන්ම දිස්ත්‍රික් මට්ටමින් පිහිටවනු ලබන දිස්ත්‍රික් ඵලදායිතා කමිටුවේ නිර්දේශය මත ක්‍රියාකිරීම වඩාත් සුදුසු වන අතර, අදාල කෘෂිකාර්මික බෝග හෝ ආර්ථික ඵලදායීතාවය මත මිනුම් කර ගත යුතු වියදම හා වෙළඳ පොල වටිනාකම සැලකිල්ලට ගෙන එම අගය තීරණය කල යුතු වේ.

(උ) මෙසේ ඵලදායිතා කමිටු මඟින් ලබාදෙනු ලබන නිර්දේශ ක්‍රියාත්මක විය යුතු කාල සීමාව එම කමිටු විසින්ම තීරණය කල යුතු අතර, විශේෂ හේතු මත අතරමැදදී මවිසින් අවලංගු නොකලේ නම්, කුඹුරු ඉඩම් වල අර්ධ වාර්ෂික බෝග වගා කිරීමට අවසර ලබාදෙන කාලසීමාව උපරිම වශයෙන් වසර 03ක කාලසීමාවකට යටත් කල යුතුවේ.

06. 30(2)(1) හා 30(3) (අර්ධ වාර්ෂික බෝග සඳහා පමණක්) වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල දිස්ත්‍රික් ඵලදායිතා කමිටු විසින් ලබාදෙනු ලබන නිර්දේශ වලට අනුකූලව දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ බලතල දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් වෙත පැවරේ.

07. මෙම චක්‍රලේඛ උපදෙස් ක්‍රියාත්මක වීම මඟින් කුඹුරු නාම ලේඛන හෝ ගොඩ ඉඩම් නාම ලේඛන වල කිසිදු සංශෝධනයක් සිදු නොවිය යුතු අතර, මෙම චක්‍රලේඛ උපදෙස් යටතේ දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරයා විසින් ලබාදෙනු ලබන අවසර පත් පිලිබඳ වෙනම ලේඛනයක් සෑම ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලයකට මෙන්ම අදාල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පවත්වා ගත යුතුවේ.

එසේම මෙම චක්‍රලේඛ උපදෙස් මත ගනු ලබන තීරණ, සාරාංශ ඇතුලත් මාසික වාර්තාවක් ආකෘති අංක - 02 ට අනුව සෑම මසකම දෙවන සතිය තුල ප්‍රධාන කාර්යාලයේ ඵලදාවර්ධන අංශය වෙත එවීමට කටයුතු කල යුතුවේ. එසේම 3 හා 4 ආකෘති වලට අනුව අර්ධ වාර්ෂික ප්‍රගති වාර්තාව ජූලි හා ජනවාරි මාස වල ප්‍රධාන කාර්යාලය වෙත එවිය යුතුවේ.

08. මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය කාලරාමුව මවිසින් ඔබ වෙත එවීමට කටයුතු කරන අතර, එම කාලරාමුව තුල අදාල පියවරයන් ක්‍රියාවට නැංවීම ඔබගේ ප්‍රධාන රාජකාරී වගකීමක් ලෙස සැලකිය යුතුය.ඉහත 06 යටතේ ගනු ලැබූ තීරණ සංශෝධනය කිරීම , වෙනස් කිරීම හෝ අවලංගු කිරීමේ බලතල මා සතුවන අතර, ඉහත තීරණ වලට එදිරිව ඉදිරිපත් වන අභියාචනා හෝ චෝදනා වෙතොත් එය ඉදිරිපත් වී දින 30ක් ඇතුලත අදාල තොරතුරුද සමගින් මා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් උපදෙස් දෙමි.එසේම මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු අර්ථ දැක්වීම හෝ නිර්වචනය කිරීමේ අයිතිය මා සතු වන බැවින්, ඊට අදාල සියලුම විමසීම් මා වෙත යොමු කල යුතු බව අවධාරණය කරමි.

මෙම චක්‍රලේඛය කෘෂිකර්ම අමාත්‍යාංශයේ එකඟතාවය ඇතිව නිකුත් කරන අතර, මෙහි සඳහන් ඵලදායීතා කමිටු ක්‍රියාත්මක කිරීම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මෙන්ම කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ එකඟත්වය ලැබී ඇති බවද වැඩිදුරටත් දැනුම් දෙමි.

එම්. ජේ. එස්. වීරසිංහ

එම්.ජේ.එස්. වීරසිංහ,
**ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.**

**පිටපත් :**

1. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
2. ලේකම්, ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
3. ලේකම්, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
4. සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරු වෙත - කාරුණික දැන ගැනීම සඳහා
5. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත - කාරුණික දැන ගැනීම සඳහා
6. වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් - කාරුණික දැන ගැනීම සඳහා
7. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් - කාරුණික දැන ගැනීම සඳහා
8. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය - කාරුණික දැන ගැනීම සඳහා
9. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් වෙත - කාරුණික දැන ගැනීම සඳහා